
# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2560 ඉල් මස පුර පසලොස්වක නම් තිථිය ලත් සඳු දින ■ 2016 නොවැම්බර් මස 14 වැනි සඳුදා



■ නොමිලේ පිරිනමන දහම් පඬුරකි ■ විකිණීම සඳහා නොවේ



# ඉල් පුර පසළොස්වක
## පොහොය දිනයේ වැදගත්කම

නොවැම්බර් මාසයේදී ඉල් පුන් පොහොය උදාවෙයි. ඉල් පුන් පොහොය ලෝකයේ බෞද්ධයන්ට වැදගත් වන හේතු කිහිපයක්ම ඇත.

ඉන් ප්‍රධානතම කරුණක් නම් මතු බුදු වීමට පෙරුම් දම් පුරමින් සිටින මෛත්‍රී බෝසතාණෝ, ගෞතම බුදුරජාණන් වහන්සේ වෙතින් නියත විවරණ ලද්දේ ඉල් පුන් පොහොය දිනයක වීමය. එදින මෛත්‍රී බෝසතාණන් විසින් දේවාරෝහණ පූජාවට සහභාගී වූ බුදුරදුන් වෙත සළුවක් ගෙන ගෞතම බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කළ ගන්ධ කුටියෙහි වියනක් සේ බැඳ පූජා කළේය. මෙම අවස්ථාවේදී ගෞතම බුදුරජාණන් වහන්සේ වෙතින් මෛත්‍රී බෝසතුන් මතු බුදුවීමට නියත විවරණ ලැබීය. අනාගතයේදී බරණැස කේතුමතී නුවර සන්ක රජුගේ අග්‍රපුරෝහිතයාණන් වූ සුබ්‍රහ්මී සහ ඔහුගේ බිරිඳ බ්‍රහ්මවතීට අනාගත මෛත්‍රී බුදුන් පුත් තනතුරේ උපදින බව දිව්‍ය ඥානයෙන් බලා වදරණ ලදී. එමෙන්ම නුග ගසක් යට මෛත්‍රී බුදුන් බුද්ධත්වය ලබන බවද වදළහ.

තම මව වූ මිසදිටු රූපසාරි බැමිණියට දහම් දෙසා යහමගට ගැනීම සිදුකළ බුදුරජුන්ගේ අග්‍රශ්‍රාවක සැරියුත් මහ රහතන් වහන්සේ පිරිනිවන් පෑවේද ඉල් පුන් පෝදය.

ඉල් පුන් පොහෝද සිදුවූ තවත් වැදගත් සිදුවීමක් ලෙස සඳහන් කළ යුතු වන්නේ ගෞතම බුද්ධ ශාසනයේ ප්‍රථම ධර්මදූත ප්‍රචාරය සඳහා ගමන් ඇරඹීමයි. (ප්‍රථම රහත් හැට නම)

නේරංජනා නදී තීරයෙහි විසූ උරුවෙල කාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප යන ජටිල තාපසයන් තුන්දෙනා දමනය කොට බුදු සසුනෙහි පැවිදි බවට පත් වූයේද ඉල් පුන් පොහෝ දකය.

බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව තැන්පත් කර ලංකාවේ ප්‍රථම ස්ථූපය වූ ථූපාරාම චෛත්‍ය දේවානම්පියතිස්ස රජතුමා විසින් කරවන ලද්දේ ඉල් පොහොය දිනයකදීය.

තවද පසුවස් පවාරණය කළ යුතු දිනය වීම සහ චීවර මාසයේ අන්තිම පොහොය වීමද කඨිනාස්තරණ විනය කර්මය කළ හැකි අවසාන දිනය ඉල් පුන් පොහෝ දිනය වීමද සුවිශේෂී වෙයි.

''මේ ලෝකයේ කවරදාවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්.''

# සැනසුම සොයා යමු ජීවිතයේ



සතුටෙන් ජීවත් වීමටත්, සැප විඳීමටත් කවුරුත් කැමැතිය. නොහැකි වී ඇත්තේද එයමය. ජීවිතයේ මඳ කලක් සතුටින් සිටින විට, නැතහොත් සැප විඳින විට එය වෙනස් කරන කිසිවක් හිටිහැටියේ සිදුවෙයි. ඉතින් සතුට, සැප පසෙකලා වැඩි දෙනෙක් දුක් විඳිති. හරියට දුකක් එන තෙක් ආසාවෙන් බලා සිටියා වැන්න. ඊළඟට පැමිණි දුක පලා යනු වැළැක්වීමට මෙන් එය බදාගෙන සිටිති.

හිතවත් අයගෙන් වෙන්වීමට සිදුවීම, අකැමැති අය හා එකට විසීමට සිදුවීම, කැමැති දේ නොලැබීම, ලෙඩ රෝගවලට ගොදුරු වීම ආදී වශයෙන් විවිධාකාරයෙන් දුක අප කරා පැමිණෙයි. අප මේ දුකට මුහුණ දිය යුත්තේ කෙසේද?

මුල නොපෙනෙන සසර ගමනේදී කරන ලද පාප ක්‍රියාවල ප්‍රතිඵල වශයෙන් මෙසේ දුක ගෙන දෙන සිදුවීම්වලට මුහුණ පෑමට සිදුවෙයි. දහම නොදන්නා බාලයා මේ දුක විඳිමින් ශෝක කරන නමුත් දහම දන්නා නුවණැත්තා එසේ කළ යුතු නැත.

අප නිවන් දැකිය යුත්තේ ලෝකයෙහි දුක තිබෙන නිසාය. දුක අප පෙළන නිසාය. මේ බව වටහා ගන්නා නුවණැත්තා දුක යනු අප නිවනට යොමු කරන මඟ සලකුණු ලෙස හඳුනා ගනියි. එපමණකින් නොනැවතී දුක ගෙන දෙන සිදුවීම් තුළින් සිය භාවනා කමටහන් සකස් කරගනියි.


ලෙඩ රෝග කය වැළඳ ගත් විට, 'සුවපත් වේවා' යැයි මෛත්‍රී වැඩීමට හැකිය. අනෙක් අතට කයේ ආදීනව මෙනෙහි කිරීමට එය කදිම අවස්ථාවකි. ලෙඩ රෝග වැළඳෙන්නේ කයක් තිබෙන නිසා බැවිනි. මෙසේ ලෙඩ රෝග මුල් කරගෙන, ඇවැසි නම් සමථ භාවනාවක් වැඩිය හැකිය. එසේ නොමැති නම් විදර්ශනා භාවනාවෙහි යෙදිය හැකිය. කයෙහි පෙර නොතිබූ අසනීපයක් දැන් ඇත. එය අනිත්‍යය. එය දුකකි. එය මට වුවමනා වී පැමිණි අසනීපයක්වත්, මට වුවමනා විටෙක ඉවත් කළ හැකි අසනීපයක්වත් නොවන හෙයින් අනාත්මය. මෙසේ කය වැළඳ ගත් අසනීපය මුල් කරගෙන විදර්ශනා වැඩිය හැකිය.

අකැමැති දේ සිදුවන විටත් මෙලොව පවතින ස්වභාවය එය බව තේරුම් ගැනීම වැදගත්ය. ලෝකයෙහි ස්වභාවය කැඩෙන, බිඳෙන බව (ලුජ්ජති, පලුජ්ජති) යි. මේ බව පහදා දුන් බුදුරජාණන් වහන්සේගේ අනන්ත ගුණ සමුදයෙන් එක් ගුණයක් තෝරාගෙන, බුද්ධානුස්සතියෙහි යෙදීමට හැකිය. නැතහොත් ලෝකයෙහි වෙනස් වන ස්වභාවය, එනම් අනිත්‍යය මෙනෙහි කළ හැකිය. සැපදායක හෝ මැදහත් සිතුවිල්ලක සිටියදී එම සිතුවිල්ල නැතිවී, දුක ගෙනදෙන සිතුවිල්ලක් ඇති වීම ලෙස ස්වකීය සිතුවිලිවල සිදුවූ වෙනස් වීම මෙනෙහි කරමින් එහි ඇති අනිත්‍ය ස්වභාවය මෙනෙහි කිරීම වඩාත් අර්ථවත්ය.

මේ ආකාරයට ලෝකය තුළ සිදු වන ඒ ඒ වෙනස් වීම බුදුදහම අනුව දකිමින්, බුදුදහම ඇසුරෙන් ඒවාට මුහුණ දෙන තැනැත්තාට ලෝකයෙහි යථා ස්වභාවය තේරුම් ගනිමින්, සිය ජීවිතයෙන් දුක දුරු කර ගනිමින්, සුව සේ විසීමට හැකි වනු ඇත. ඒ සඳහා සුදුසුම ඔසුව භාවනාවයි.

රෝහිත විජේතිලක

''යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ.''



ගිහි ගෙදරට බුදු බණ

# උස් අසුනක සිට ගුවන් විදුලියෙන් බණ ඇසීම වරදක්ද?

## ථේරවාදී සහ මහායාන භික්ෂූන් වහන්සේලා අතර ඇති වෙනස කුමක්ද?

## මොන තරම් සිල් රැක්කත් ගෙදරදී එය බිඳෙනවා නම් කළ යුත්තේ කුමක්ද?

## වියපත් මවක්, අකීකරු සැමියකු පාලනය කරගන්නේ කොහොමද?

අති පූජ්‍ය ඉඟුරුවත්තේ පියනන්ද හිමියන්ගෙන් අහමු

❐ ගුවන් විදුලියෙන් බණ අසන විට සාමාන්‍ය ආසනයක සිට බණ ඇසීම වරදක්ද?

බුදු බණ යනු උත්තරීතර පාරිශුද්ධිය ලැබීමට මෙන්ම ලෞකික ජීවිතය අර්ථවත් ලෙසත්, නිවැරදි ලෙසත් ගත කිරීමට මග පෙන්වන ශ්‍රේෂ්ඨ දහමකි. එය ගෞරව පෙරදැරිව සිහි නුවණින් යුතුව ශ්‍රවණය කළ යුතුය. නොසැලකිලිමත් බවින් හා අවිචාරවත් ලෙස බුදු බණ ඇසීම සුදුසු නැත. යම් අසනීපයකින් පෙළෙන්නකු නම් පහසු ක්‍රමයකට සිට බණ ඇසීමේ වරදක් නොපෙනේ. නිරෝගී අයකුට නම් සාමාන්‍ය අසුනක සිට බණ ඇසීමේ වරදක් නැත. එහෙත් නොයෙකුත් අමතර කතාබස්වල යෙදෙමින් අනාදරයෙන් යුක්තව බණ ඇසීම නුසුදුසුය.

''බිම ඉඳ සිට කී බණ නාසන්නේ - විමතිව උඩ ඉඳ සිට නාසන්නේ'' යන ලෝවැඩ සඟරා කතුවරයා කියන්නේද බණ අසන පිළිවෙළයි. බණ කීම මෙන්ම බණ ඇසීමද භාවනාමය පින්කමක් වේ. දස පුණ්‍ය ක්‍රියා අතරත ශ්‍රේෂ්ඨ පින්කමකි.

❐ නූතනයෙහි මළවුන් සඳහා සිදුකරන මතක වස්ත්‍ර පූජා බඳු ආගමික කටයුතු බුද්ධ කාලයේත් පැවතුණේද? නොඑසේ නම් ඒවා ආරම්භ වූයේ කොයි කාලයේ සිටද?


නූතනයෙහි කරන්නා වූ මතක වස්ත්‍ර පිදීම බඳු ක්‍රමයක් බුද්ධ කාලීන සමාජයේ පැවැති බවක් පිළිබඳ සාධක නොපෙනේ. එද ගිහි පැවිදි සමාජය නූතන ගිහි පැවිදි සමාජය පමණ සමීප සබඳතාවක් පවතින්නට නැතැයි සිතමි. බුද්ධ පුත්‍ර භික්ෂූන් වහන්සේලා එද සිය සිවුරු සපයාගෙන ඇත්තේ පාංශුකූල වස්ත්‍රවලිනි. අපේ ධර්ම ග්‍රන්ථවල දැක්වෙන පරිදි ගිහි පින්වතුන් අනපේක්ෂිත ලෙස ඉවත දමන ලද වස්ත්‍ර, මළමිනී දවටා අමු සොහොන්වල දැමූ පසු සොහොන්වලින් ලබාගන්නා වස්ත්‍ර භික්ෂූන් වහන්සේගේ සිවුරු සඳහා යොදා ගත් බව පෙනේ. පාංශුකූල වස්ත්‍ර ගනයට වැටෙන වස්ත්‍ර කොටස් 23 ක් පිළිබඳව අපේ බණ පොතේ සඳහන් වේ.

කෙනෙක් මියගිය පසු සිදුකරන සියලුම චාරිත්‍ර විධි බෞද්ධ චාරිත්‍රානුකූලව බුද්ධ ධර්මයට අනුවම සකස් වූ ඒවා යැයි කිව නොහැක. ඒ ඒ ජාතීන් අතර, ඒ ඒ රටවල ජන කොටස් අතර පවතින විවිධ සිරිත් විරිත් තිබේ. ඇතැම් විට ජාතික සිරිත් විරිත් හා ආගමික සිරිත්වලින් සම්මිශ්‍රණය වීමෙන් ඇතිවූ සංස්කෘතීන් බොහෝ රටවල ඒ ඒ ජාතීන් අතර පවතින බව පෙනේ.

මිහිඳු මහ රහතන් වහන්සේ මෙරට වැඩම වීමෙන් පසු ඇති වූ බෞද්ධ ප්‍රබෝධය නිසා ජාතික ප්‍රබෝධයක්ද ඇතිවූ බව කිව හැකියි. මේ අතර සිහලුන් තුළ මහින්දගමනයට පෙර ජන ජීවිතයට සම්බන්ධ වූ සියලුම සිරිත් විරිත් එකවරටම වෙනස් වූයේ යයි

''පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි.''

සිතිය නොහැකිය. ඇතැම් විට අප තුළ පවතින මිථ්‍යා ඇදහිලි, මිථ්‍යා විශ්වාස තවමත් ශේෂව පවතී. මතක වස්ත්‍ර පූජාව පිළිබඳ සැලකීමේදී මෙයට වසර දහසකට පමණ පෙර පැවැති බෞද්ධ චාරිත්‍ර ධර්මයක විකාශය අද මේ තත්ත්වයට පත්වන්නට ඇතැයි සිතිය හැකියි. ඇතැම් විට මෙරට තුළ යම් යම් වකවානුවල පැතිරී ගිය මහායාන බලපෑම්ද ජන ජීවිතයට එක්වූ අවස්ථා තිබේ. ඒවයේ මූලික අවස්ථා පිළිබඳ සෙවීම දුෂ්කරය. ඒවා නොයෙකුත් මුහුණුවරින් අප අතර පවතී. මතක වස්ත්‍ර පූජාවද මෙබඳු චාරිත්‍රයක් යයි සිතිය හැක. නමුත් මෙබඳු ක්‍රියා කිසිසේත් බෞද්ධයාගේ මූලික පරමාර්ථවලට පටහැනි බවක් හෝ බාධාවක් නොවන බව කිව යුතුයි.



❒ **ස්වාමීන් වහන්ස, ථේරවාදී භික්ෂූන් වහන්සේලා හා මහායානික භික්ෂූන් වහන්සේලා අතර පවතින වෙනස කුමක්ද? ඇතැම් බෞද්ධ යයි කියන සංවිධානයකින් මහායාන හීනයාන දෙකම එකක් යයි කියයි. ඒ නිසා මෙය පහද දෙන්න?**

මෙම ප්‍රශ්නය සඳහා කෙටියෙන් කිව යුත්තේ ඔබ සඳහන් කරන සංවිධානයේ පිරිස ශාසන ඉතිහාසය හා බුද්ධ දේශනාව හරිහැටි කියවා නැති පිරිසක් හෝ ඒවා පිළිනොගන්නා පිරිසක් බවයි. පළමුවෙනි, දෙවෙනි, තෙවෙනි සංගායනාවලින් බැහැර වූවා වූත්, පසු කලෙක ථේරීය භික්ෂූන්ගෙන් වෙන් වූවා වූත් භික්ෂූන් පිරිසකගෙන් මහායාන නමින් සඳහන් කරන භික්ෂු පිරිස සංයුක්ත විය. පසු කාලයක නාගර්ජුන, වසුබන්ධු, දින්නාග වැනි තාර්කික ඥනයෙන් පිරිපුන් උගත්, බුද්ධිමත් භික්ෂූන් වහන්සේලා මහායාන දර්ශනය රක්ෂිත, ගෝපිත මෙන්ම සංවර්ධිත කරමින් එය ථේරවාද දර්ශනය අභිබවා යන ආකාරයට පත් කළහ. මෙම මහායානය තුළ මහාසාංඝික, සම්මිතිය යනාදී විවිධ නිකායන් තිබේ. සමස්තයක් වශයෙන් ගත් කල මහායානිකයන්ගේ අපේක්ෂාව කෙළින්ම බුද්ධත්වයට පත්වීමයි. ආමිෂ සනයේ පූජාවන්ට වැඩි නැඹුරුවක් පවතින අතර භාවනා වැඩීමද උන්වහන්සේලා කරති. ඇතැම් මහායානික කොටස් තුළ ගැඹුරු සමථ භාවනා ක්‍රම ප්‍රගුණ කරන බවද පෙනේ. පසුකාලීනව ඇතැම් මහායානික කොටස් ගිහි සමාජයට ආසන්න ඇඳුම්, ඇවතුම්, පැවතුම්වලින් ලෞකික අංශයටම නැඹුරු වී ඇති බවක්ද පෙන්නුම් කරයි. නූතනයේ මහායානය ප්‍රචලිතව ඇති ටිබෙට්, ජපන්, චීන, මොංගෝලියා, රුසියාව වැනි රටවල වෙසෙන මහායානික භික්ෂූන් වහන්සේ සැලකිල්ලට ගැනීම වටී. ටිබෙට් රටේ ලාමාවරු රාෂ්ට්‍ර පාලනය කිරීමද, ආගමික කටයුතුවලදී පමණක් සිවුරක් දවටා ගැනීමද සෙසු අවස්ථාවල කලිසම් ලෝගු හැඳීම කරනුද පෙනේ. උන්වහන්සේලාගේ ත්‍රිපිටකයද ථේරවාදී ත්‍රිපිටකයට වෙනස් වන අවස්ථා තිබේ. දුල්වා විනය, සද්ධර්ම පුණ්ඩරීක, ලංකාවතාර වැනි ධර්ම කොට්ඨාසවලින් ඒ බව මැනවින් පැහැදිලි වේ. ඇත්ත වශයෙන්ම ඉහාත්මයෙහි මගඵල නිවන් අවබෝධ කරගෙන බුදු දහමින් දුරස් පහසුවෙන් නිවන් අවබෝධ කරගත හැකි ශ්‍රාවක බෝධි පිළි නොගන්නා විශේෂයෙන් ථේරවාදී රහතන් වහන්සේ පිළිබඳ දක්වන ආකල්ප පැහැදිලිවම ථේරවාදය හා මහායානය එකක් නොව දෙකක් බව සනාථ කරන කරුණුය. මේ පිළිබඳව දැක්විය යුතු තව කරුණු ඇතත් ඒ සඳහා මෙය අවස්ථාව නොවේ. අවසාන වශයෙන් කිව යුත්තේ ශ්‍රී ලංකාව, මියන්මාරය (බුරුම දේශය), තායිලන්තය (සියම් දේශය), කම්පුචියා (කාම්බෝජය), ලාඕසය යන දැනට ලෝකයේ පවතින ථේරවාදය මුල් බැසගත් රටවල් වශයෙන් සැලකේ.

❒ **ගෙදර දෙරේ ඇතිවන ප්‍රශ්නවලින් සීලයට හානියක් වෙනවාද?**

මා සිතනවා මෙයින් අදහස් කරනවා ඇත්තේ ස්වාමි භාර්යාවන් තුළ ඇති වන ගැටලු ප්‍රශ්න විය හැකියි. කරුණාව, මෛත්‍රිය, ඉවසීම, විචක්ෂණ වැනි උදාර මානව ගුණ වෛවාහක ජීවිතය ගත කරන අඹු සැමියන් තුළ පැවැතිය යුතුමය. අන්‍යෝන්‍ය අවබෝධය විවාහ දිවියේ ලබන සතුටට අවශ්‍යම සාධකයකි. වැඩිහිටියන් බවට, මව්පියන් බවට පත්වූ පසු ඔවුන් වෙත සුවිසල් වගකීමක් පැවැරෙයි. මාතෘත්වය, පීතෘත්වය හා එම පදවිවල ඇති වගකීම් සහ යුතුකම් වටහා නොගත් විවාහ වීමේ පරමාර්ථ විනෝදකාමී බවම සේ සලකන මව්පියන් සිටිති. ඔවුන් සිය දූ දරුවන්ට ඒ තුළින් බොහෝ විට නරක ආදර්ශයක් දෙනවා පමණක් නොව දරුවන් නොමග යැවීමටද දායක වෙති. පුහුදුන් මිනිසුන් වශයෙන් ගෙදර දෙරේ කටයුතු කරන මාපියන් තුළ යම් යම් අවස්ථාවන්වල අමනාපකම්, ගැටීම්, නොසන්සුන්කම් ඇතිවීම ස්වභාවිකය. නමුත් ඒවා ගිහියාගේ අවම ශීලය වන පන්සිල් බිඳී දුසිල් පුද්ගලයෙක් වීමට තරම් හේතු නොවේ. නමුත් සුළු ප්‍රශ්න අනවබෝධය නිසා දුර දිග ගොස් ගෘහ ජීවිතය අවුල් වියවුල් තත්ත්වයට පත් විය හැක. ඇතැම් විට මත්පැනට, දුරාචාරයට යොමු විය හැක. එසේ වීමේදී නම් සිල්වත්කම්, ගුණවත්කම් බිඳී යා හැකියි.

වර්තමාන ලෝකයේ බොහෝ අඹුසැමි ප්‍රශ්න අවිචාරමත්කම නිසා නොයෙකුත් භේද බින්නවීම්වලට හේතුවන අවස්ථා දැකිය හැකිය. පවුල් සංස්ථාවේ සදාචාරාත්මක බව ශීඝ්‍රයෙන් දෙදරා යන ප්‍රවණතාවක් මෙරට ගිහි බොදු සමාජය තුළද පැහැදිලිවම දක්නට තිබේ. අපේ ඓතිහාසික ගිහි සමාජ තොරතුරු පිරික්සීමේදී බෞද්ධ සාරධර්ම පදනම් කරගත් ගිහි සමාජයක් පැවැති ආකාරය පැහැදිලිවම දක්නට තිබේ. එම තත්ත්වය විදේශිකයන් මෙරට ආක්‍රමණය කිරීමෙන් පසු ඔවුන් තුළ පැවැති මත්පැන, දුරාචාරය වැනි පහත් සංස්කෘතිකාංග අප රට නාගරික සමාජ තලය තුළට එබ්කම් කරන්නට විය. ක්‍රමයෙන් නාගරික සමාජය තුළ පැවැති බොදු හැදියාව සංකීර්ණව පසු කාලයක් වන විට සලාදයක් බවට පත්විය. මේවා නූතනය වන විට ගම්බද සමාජය තුළ පවා ව්‍යාප්ත වී ඇති බව පැහැදිලිය. නොනිත් ආශාවන්ගෙන් පරලව මත්පැන, දුරාචාරය, සූදුව වැනි ප්‍රපඤ්චයන් පසු පස දිවීම නිසා අද බොදු සමාජ තලය දෙදරා ගොස් තිබේ. මාපිය දූදරු සම්බන්ධය, අඹුසැමි සහ සම්බන්ධය ඉතා වේගයෙන් පලුදු වෙමින් මහත් පරිවර්තනයක් සිදුවෙමින් පවතී. මෙය ඉතාමත් කනගාටුදයක තත්ත්වයකි.

''අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය.''



චාම් බව, තෘප්තිමත් බව, ලද දෙයින් සතුටු වීම, දැහැමි බව, වීර්යය, අධිෂ්ඨානය මෙන්ම අඹු සැමියන් තුළ ප්‍රියශීලී බව, දරක ප්‍රේමය තම ජීවිතවලට එක්කර ගන්නේ නම් මිල මුදල් අඩුපාඩු වුවද කෙතරම් දුප්පත් නිවසක නමුදු සැනසිලිදයක දිව විමනක් ගොඩ නගාගත හැකියි. ආගමෙන්, ධර්මයෙන් දුරස් වූ තරමටද, විනාශකාරී පාප මිත්‍රයන් ළං කරගත් තරමටද, ඒ නිසාම සුරා සූදු සොඬුන් බවට පත්වූ විටද එම පවුල තුළ ස්වාමි භාර්යා, මා පිය දූදරු සහ සම්බන්ධ දුරස් වී යයි. සිල් ගුණ බිඳී යයි. නිවස අපායක් බවට පත් වෙයි. එමනිසා කළයුතු හොඳම දෙය, හොඳ දෙය හොඳ ලෙසිනුත්, නරක දෙය නරක ලෙසිනුත් තේරුම් ගෙන හැකිතාක් ධර්මය ජීවිතයේ ආලෝකය කොටගෙන කටයුතු කිරීමයි.

**❐ සිය ස්වාමියා බිරිඳ ඉක්මවා යන අවස්ථාවක වියපත් දරුවන් ඇති මවක් කළ යුත්තේ කුමක්දැයි ධර්මානුකූලව පහද දෙන්න?**

දීර්ඝ කාලයක් තිස්සේ හෙළ බොදු සංස්කෘතිය අනුව සදචාරාත්මක ලෙසින් ජීවත් වූ බොදුනුවනට, අවුල් වියවුල්වලින් තොර ස්වදර ස්වපුරුෂ සංතුෂ්ටියෙන් කල් යැවූ දූ දරුවන් හැදූ වැඩූ මව්පියන් හට අද සිදුවී ඇත්තේ කුමක්ද? ඒ සියලු උතුම් ආචාර සදචාර ධර්මයන් උඩු යටිකුරුව තිරශ්චීනයන්ටත් වඩා පහතට වැටුණු නරුම සමාජයක්, නරුම පරගැති සංස්කෘතියක් පැතිරී යාමයි. අද අති බහුතරයක් දෙනා විශේෂයෙන් නාගරික පැලැන්තිය බටහිර පන්නයට හැඩගැසී හමාරය. ඔවුන්ගේ දූ දරුවන්ද බටහිරකරණයට අනුව අධ්‍යාපනය දෙමින් පරගැත්තන් බවට පත්කරති. මෙවන් ප්‍රවණතා හමුවේ මෙවන් පසුබිමක් තුළ ඔබගේ ප්‍රශ්නයෙන් ඉදිරිපත් කරන ප්‍රපංචයන් ඇතිවීම ගැන පුදුම විය යුත්තක් නැත.

ඇත්ත වශයෙන්ම මෙබඳු සාරධර්ම පරිහානිය තීව්‍ර කරන්නන් අතර දේශපාලකයන් ඉදිරියෙන්ම සිටින බව පැහැදිලිවම කිව යුතුය. ඔවුනට අවශ්‍ය වනුයේ කෙසේ හෝ තම බලය ආරක්ෂා කර ගැනීමට මිස යහපත් සමාජයක් ගොඩනැගීමට නොවේ. පංච දුශ්චරිතයෙන් රට අගාධයට තල්ලු කර දමා විශේෂයෙන් සුරාව සූදුව බොරුව සාමාන්‍ය දෙයක් බවට පත්කළෝ අවස්ථාවාදී දේශපාලුවන් මිස අන් කවුරුන්ද? තවමත් ඔවුන් අපගේ ශ්‍රේෂ්ඨ හෙළ බොදු සංස්කෘතිය බටහිරකරණයට ආදේශ කරමින්, අධ්‍යාපන ක්‍රම කප්පාදු කරමින්, ඉතිහාසය, ජාතික චින්තනය අපේ දරුවන්ගේ අධ්‍යාපනයෙන් ඉවතට තල්ලු කර දමා තිබේ. ඔබගේ ප්‍රස්තුතයද, එහි එක් ප්‍රතිඵලයකි.

මෙවන් පසුබිමක් තුළ ජීවත් වන පිරිහුණු සංස්කෘතියක් ඇති පති පතිනියන් තුළ ස්වාමියා සිය බිරිඳ ඉක්මවා යාමද, බිරිඳ තම ස්වාමියා ඉක්මවා යාමද සාමාන්‍ය දෙයකි.

අප මෙතෙක් දක්වූ කරුණු එක එල්ලේම ප්‍රස්තුතයට අදළ නොවූවද සඳහන් කරන්නට යෙදුණේ අද පවතින මෙවන් ප්‍රශ්න ඔබට පමණක් සාධාරණ නොවන බව හා මේවා සිදුවනුයේ පුද්ගලයාගේ වරදින් නොව සමස්ත සමාජ තලයම පිරිහී ඇති නිසා බව සිහිපත් කරදීමටය.

ඔබ ඉදිරිපත් කර ඇති කාරණය කලබලයෙන් විසඳීමට නොයා යුතුය. සුදුසු අවස්ථාවක් බලා තම ස්වාමියාට පුද්ගලිකවම කරුණාවෙන් කතා කළ යුතුය. තමා තුළ ස්වාමියා රුචි නොකරන අඩුපාඩු දුබලතා පවතීදැයි තමා පිළිබඳවද විමසිලිමත් විය යුතුය. ඇතැම් අවස්ථාවල භාර්යාව තුළ පවතින නිරන්තර සැකය ස්වාමියා පිළිබඳ අන්‍යයන් සමග පහත් කොට කතා කිරීම, ස්වාමියාට සැඩ පරුෂාකාරයෙන් කතා කිරීම නිසාද නොයෙක් ගැටලු ප්‍රශ්න පැන නගින අවස්ථා සුලබය. ගිහි ජීවිතය තවුස් ජීවිතයක් නොවන බවත් පති පතිනියන් තුළ ආදරය, දයාව, අනුකම්පාව මෙන්ම ස්වාමියාගේ සිතැගි තේරුම් ගෙන අන්‍යොන්‍ය අවබෝධයෙන් කටයුතු කිරීමද වැදගත්ය. වියපත් දූ දරුවන් ඇති සමහර මව්වරුන් තම දරුවන් නිසා ඇතිකරගත් මාන්නයෙන් සිය ස්වාමියා නොතකා හරින අවස්ථාවන්ද තිබේ. එබඳු අවස්ථාවල අසහනයට පත්වන ස්වාමියා ක්‍රමයෙන් සිය බිරිඳගෙන් ඈත්වේ. ඇතැම් පුරුෂයන් අතෘප්තිකර කාමාසාවන්ගෙන් පෙළෙන්නන්ද විය හැකියි. ඇතැම් ස්වාමි දියණියන්ගේ අසීමිත ආගමානුකූල පිළිවෙත් නිසාද, ස්වාමියාගේ පවතින ආගමික නැඹුරුව නිසාද යම් යම් ගැටලු ඇතිවිය හැකිය.

කෙසේ වුවද වියපත් දූදරුවන් ඇති මවක් වශයෙන් ස්වාමියා තුළ පවතින දුබලතා ඉවසා සිය දරුවන් වෙනුවෙන් කටයුතු කිරීම බුද්ධිගෝචර බව කිව යුතුය. අද පවතින සමාජ තලය අනුව භික්ෂූන් වහන්සේලා වශයෙන් කළ හැක්කේ මේ පිළිබඳව පොදුවේ කරුණු දක්වීමක් පමණි.

මෙම කරුණු සැලකිල්ලට ගැනීමෙන් ඔබට යම් අස්වැසිල්ලක් ලබාගත හැකිවේ යැයි සිතමි.

"මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දාම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?"

'ශ්‍රී පාදස්ථානය කියන්නේ සකල ලෝක සත්වයාගේම සිත් පහන් කරන පූජනීය ස්ථානයක්. සෑම ආගමිකයකුම, සෑම ජාතිකයකුම මෙම ස්ථානය බොහොම භක්තියෙන් වන්දනා කරනවා. දිගු කාලයක පටන් මෙම පූජා භූමියේ ආගමික සංහිඳියාවක් පවතිනවා. නමුත් වර්තමානයේ ඇතැම් මිසදිටු අන්තවාදීන්, මූලධර්මවාදීන් ශ්‍රී පාදස්ථානය ඉලක්ක කරගෙන ආගම්වාදය හා අන්තවාදය අවුස්සන්න පහත් උත්සාහයක් ගන්නා බව පෙනෙනවා'' යැයි ශ්‍රී පාදස්ථානාධිපති රත්නපුර මහ දිසාවේ ප්‍රධාන සංඝනායක බෙංගමුවේ ධම්මදින්න නාහිමියෝ පැවැසූහ.

උන්වහන්සේ මේ බව පැවැසුවේ වාර්ෂික ශ්‍රී පාද වන්දනා සමයට (2016-2017) පූර්වගාමීව රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ඉකුත් (21) පැවැති විශේෂ සාකච්ඡාවේදී අදහස් දක්වමිනි.

රත්නපුර දිස්ත්‍රික් ලේකම් බන්දුල හරිශ්චන්ද්‍ර මහතා විසින් කැඳවුණු මෙම සාකච්ඡාවේදී තවදුරටත් අනුශාසනා කරමින් ශ්‍රී පාද නාහිමියෝ මෙසේද පැවැසූහ.

ශ්‍රී පාද වන්දනාව ගත්තාම වාරය අවාරය කියලා දෙකක් තියෙනවා. උඳුවප් පෝයෙන් ආරම්භ වන වන්දනා වාරය ලබන වසරේ වෙසක් පොහොයෙන් නිමාවට පත් වෙනවා. ඉතිරි මාස හය අවාරය හැටියට සැලකෙනවා. අවාරය ශ්‍රී පාද අඩවියට පිවිසීමට හැම අතින්ම ගැළපෙන්නේ නැහැ. නමුත් සමහර අය විවිධ අරමුණු ඉටු කරගන්න අවාරයේ ශ්‍රී පාදයට එනවා. අපි කොහොමටත් ඒ තත්ත්වය අනුමත කරන්නේ නැහැ.


අතීතයේ ඉඳන්ම ශ්‍රී පාදස්ථානයට විවිධ මිසදිටුවන්ගෙන් බලපෑම් එල්ල වුණා. සීතාවක රාජසිංහ රජු 1652 දී ශ්‍රී පාදය ආඬින්ට භාර දුන්නා. අපේ මඩගම්මන හාමුදුරුවෝ ආඬින්ගෙන් ශ්‍රී පාදය බේරාගෙන නැවත බෞද්ධයන්ට ලබා දුන්නා. රාජාධි රාජසිංහ රජතුමාගේ යුගයේදී නුවරගමේ අය ශ්‍රී පාදයේ අයිතිය පවරා ගත්තා. අපේ ගාල්ලේ මේධංකර හාමුදුරුවෝ ඉංග්‍රීසි ආණ්ඩුවට ලියුම් ලියලා නැවත ශ්‍රී පාදස්ථානයේ උරුමය රත්නපුරයට ලබා ගත්තා. මේ වගේ අභියෝග විවිධ වකවානුවලදී ශ්‍රී පාදස්ථානයට එල්ල වුණත් අපේ හාමුදුරුවන් ශ්‍රී පාදස්ථානයේ බෞද්ධ උරුමය දිවි හිමියෙන් රැක ගත්තා.

වර්තමානයේ විවිධ මූලධර්මවාදී අන්තවාදී කොටස් ශ්‍රී පාදස්ථානයේ බෞද්ධ උරුමයට අභියෝග ඉදිරිපත් කරන්න පටන් අරන්. බුදු හාමුදුරුවෝ තුන් ලෝකයටම නායකයෙක්. අපේ බෞද්ධ දර්ශනය පරම අවිහිංසාවාදී දර්ශනයක්. අපි අන්තවාදීව හැසිරෙන්නේ නැහැ. ශ්‍රී පාදස්ථානය කියන්නේ සෑම ආගමිකයකුටම, හැම ජාතිකයකුටම සුවය දෙන තැනක්. එතැන මිසදිටුවන්ට ඕනෑ විදිහට කටයුතු කරන්න දෙන්නේ නැහැ. ශ්‍රී පාද අඩවියේදී හැම දෙනාටම අභය දානය දෙන තැනක් වුණත් එම ස්ථානය රැකගන්න අපි දිවි හිමියෙන් කැපවෙනවා. ශ්‍රී පාදස්ථානයට ගල් කැටයක්, වැලි කැටයක් ගෙනියන්න උදව් නොකරන අය පැත්තක ඉඳන් ආගම්වාදය අවුළුවන්න උත්සාහ ගන්න බව පේනවා.

ආදම්ගේ පාදය (ඇඩම්ස්පීක්) කියන වචනය වෙනස් කළ යුතුයි. මේක ගෞතම ශ්‍රී පාදස්ථානය විය යුතුයි. පැරණි සිතියම් ලේඛන ඉංග්‍රීසි ජාතිකයන් සකස් කර තියෙන්නේ ඉංග්‍රීසි නමින්. ලෝක බෞද්ධ උරුමය රැක ගැනීමට සැවොම කටයුතු කරමු.

වාර්ෂිකව ශ්‍රී පාද වන්දනා සමය (2016-2017) ආරම්භ කිරීමේ මූලික ආගමික වතාවත් ලබන දෙසැම්බර් මස 11 දින පැල්මඩුල්ල ගල්පොත්තාවෙල ශ්‍රී පාද රජමහා විහාරස්ථානයේදී ආරම්භ වේ. සමන්දේව ප්‍රතිමාව සහිත පූජා වස්තූන් වැඩම කරවීමේ පෙරහර දෙසැම්බර් 12 දින පෙරවරුවේ පැල්මඩුල්ලෙන් ගමන් ආරම්භ කෙරේ. මෙවර පෙරහර තුනක් රත්නපුර මාර්ගය, හැටන් මාර්ගය හා බලන්ගොඩ මාර්ගය ඔස්සේ ගමන් ගන්නා අතර ඒ සඳහා සංවිධාන කටයුතු මේ දිනවල සිදුවේ.

මෙම ශ්‍රී පාද වන්දනා සාකච්ඡාව සඳහා රත්නපුර හා නුවරඑළිය දිස්ත්‍රික්ක නියෝජනය කරමින් මහා සංඝරත්නය, දිස්ත්‍රික් ලේකම්වරුන්, ආරක්ෂක අංශ ප්‍රධානීන් ඇතුළු රාජ්‍ය ආයතන ප්‍රධානීහු රැසක් සහභාගි වී සිටියහ.



## ශ්‍රී පාදස්ථානයේ ආගමික සංහිඳියාවට අන්තවාදී කණ්ඩායම්වලින් බලපෑම්

### ශ්‍රී පාදස්ථානාධිපති බෙංගමුවේ ධම්මදින්න නාහිමි

''යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ.''



# ඔබ ධනය උපයන්නේ ධාර්මිකවද?

'උට්ඨාන විරියාධි ගතේහි හෝගේහි
බහාබල පරිච්තේහි
සේදු වක්කිත්තේහි
ධම්මිකා ධම්ම ලද්දේහි'

උට්ඨාන සම්පදවෙන් යුක්තව තමා සතු ධනයක් උපයා ගත යුතුය. දෑත දෙපය වැර වීරිය යොද දහඩිය වගුරවමින් තමා ඉතාම ධාර්මිකව ධනය ඉපයීම කළ යුතු බව බුදු දහමෙහි සඳහන් වේ.

''බඹරස්සේව ඉරියතෝ'', බඹරා නොතලා රොන් ගන්නා සේද, ''වම්මිකෝ උපචියතී'', වේයා ක්‍රමයෙන් තුඹස ගොඩනගන්නා සේ, තමා ඉතාම ධාර්මිකව ධනය ඉපයීම කළ යුතුය.

'න අත්ත හේතු න පරස්ස හේතු
න පුත්ත මිච්ඡේ න ධනං න රට්ඨං
න ඉච්ජෙය්‍ය අධම්මේන සමිද්ධි මත්තනෝ
ස සීලවා ප්‍රඥවා ධම්මිකෝ සියා'

කිසිදු කරුණක් හේතුවෙන් අධාර්මිකව සමෘද්ධිමත් භාවය බුදු සමය අවධාරණය නොකරන බව පෙන්වා දෙයි.

අවි ආයුධ වෙළෙඳාම, මස් මාංශ වෙළෙඳාම, මත්ද්‍රව්‍ය වෙළෙඳාම, වස විෂ වෙළෙඳාම, සත්ව වෙළෙඳාම යන නොකළ යුතු වෙළෙඳාම් පසෙන් ඉවත් වී ධාර්මික ගොවිතැන, ධාර්මික ගව පාලනය, සාධාරණ වෙළෙඳාම, රාජ්‍ය සේවය යන වෘත්තීන්වල ධාර්මිකව නියැළී ධනය ඉපයීම යහපත්ය. උට්ඨාන සම්පදව යමෙකු සතුව තිබෙන්නේ නම් ධාර්මිකව ධනය ඉපයිය හැකිය.

ගෘහස්ථයකුට ආර්ථික සමෘද්ධිය අවශ්‍යයෙන්ම පැවැතිය යුත්තක් බව ''දළිද්දියං භික්ඛවේ දුක්ඛං ගිහිනං කාමභෝගිනං'' යනුවෙන් පැහැදිලි වේ. මෙසේ ධාර්මිකව උපයා ගත් ධනය ඉතාම අරපිරිමැස්මෙන් පරිහරණය කළ යුතු බවද සම්බුද්ධ දේශනාව වේ.

'ඒකේන භෝගේන භුඤ්ජෙය්‍ය
ද්වී කම්මං පයෝජයේ
චතුත්ථන්ච නිදපෙය්‍ය
ආපදසු භවිස්සති'

යථෝක්ත ගාථාවේ සඳහන් වන අන්දමට ධාර්මිකව උපයා ගත් ධනය ප්‍රධාන කොටස් හතරකට බෙදෙයි. 1/4 කොටසක් පරිභෝජනයටත්, 2/4 ආයෝජනයටත්, 1/4 අනාගතය සඳහාද වෙන්කර අරපිරිමැස්මෙන් ධනය පරිහරණය කළ යුතු වෙයි.

'අත්ථානං සුචේතී ජිනේති'

තමාගේ සැප පහසුකම් සඳහා වෙන් කළ යුතුය. පසුව අංගුත්තර නිකායේ පංචබලි සංකල්පය යටතේ කටයුතු කළ යුතු බවය.

අත්ථි බලි - ආගන්තුකයන්ට සංග්‍රහ කිරීම.
ඤාති බලි - නෑදෑයන්ට සංග්‍රහ කිරීම.
රාජ බලි - රජයට අයබදු ගෙවීම.
දේවතා බලි - ආගමික කාර්යයන් සඳහා.

පුබ්බප්‍රේත බලි - මියගිය ඤාතීන්ට පින් අනුමෝදන් කිරීම යනුවෙනි.

යමෙකු තමා උට්ඨාන සම්පදවෙන් උපයා ගත් ධනය ඉතාම ධාර්මිකව, අරපිරිමැස්මෙන් යුතුව පරිහරණය කරන්නේ නම් ඔහුගේ මෙලොව පරලොව ජීවිතයද දියුණුවෙන් දියුණුවට පත්වේ.

ටී. ඒ. ජී. දමයන්ති - කැලණිය විශ්වවිද්‍යාලය

'ලෝකය ගෝලාකාරයි මිනිසුන් විවිධාකාරයි' යන්න සමාජයේ භාවිත වන වැකියකි. මිනිසුන් වෙනස් වන්නේ කෙසේද? කුමන ආකාරයෙන්ද යන්න බුදුන් වහන්සේ ආකාර දහ හතරක් මගින් පෙන්වා දී තිබේ.

අප මහා අමා මෑණි සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ සමවත් සුවෙන් වැඩ සිටි කල්හි සුභ නම් මානවකයෙක් උන්වහන්සේ මුණ ගැසීමට පැමිණියේය. මොහු බුදුරදුන් සමග සතුටු සාමීචියේ කතාබස් කර අවසානයේ සත්වයාගේ උසස් පහත් භේදයට හේතුවන කරුණු මොනවාදැයි බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ අසා සිටියේය.

''පින්වත් ගෞතමයන් වහන්ස, මෙලොව ආයුෂ අඩු ඇත්තෝ වෙත්, ආයුෂ වැඩි ඇත්තෝ වෙත්, බොහෝ ආබාධ ඇත්තෝ වෙත්, ලෙඩ රෝග ඇත්තෝ වෙත්, මහත් පිරිවර නැති අය වෙත්, මහත් පිරිවර ඇති අය වෙත්, දුප්පත් අය වෙත්. වස්තු සම්පත් ඇත්තෝ වෙත්, පහත් කුල ඇත්තෝ වෙත්, අඥානයෝ වෙත්, මෙසේ සත්වයාගේ උසස් පහත් භේදයට හේතුප්‍රත්‍ය කවරේද?

එහිදී අප මහා ගෞතම බුදුන් වහන්සේ කම්මස්සකො මානව සත්තා, කම්ම දායාදා කම්මයොනි, කම්ම බන්ධු, කම්මපටිසරණ, කම්මං සත්තේ විභජති යදිදං හීනප්පනීතතායාති යනුවෙන්

# ගෝලාකාර ලෝකයේ මිනිසුන් විවිධාකාර ඇයි?



''දෙවු වහාම කිරි නොමිදෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බඳී.

සියලු සත්වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහුය. කර්මය උරුම කොට ඇත්තාහුය. කර්මය ඉපැදීමෙහි හේතු කොට ඇත්තාහුය. කර්මය නෑයා කොට ඇත්තාහුය. කර්මය පිහිට කොට ඇත්තාහුය යනුවෙන් දේශනා කළ සේක.

ඉහත සඳහන් කළ ආකාරයට බුදුන් වහන්ස් විසින් සත්වයා බෙදා වෙන් කළ දහ හතර ආකාරය පිළිබඳව මෙසේ විමසා බලමු.

1. අල්පායුෂ ලැබීම, 2. දීර්ඝායුෂ ලැබීම, 3. බොහෝ ලෙඩ රෝග ඇතිවීම, 4. නිරෝගී වීම, 5. දුර්වර්ණ වීම, 6. රූමත් වීම, 7. අල්පේශාක්‍ය වීම, 8. මහේශාක්‍ය වීම, 9. අඥාන වීම, 10. දිළිඳු වී ඉපදීම, 11. මහා භෝග සම්පත් ඇතිවීම, 12. නීච කුලවල ඉපදීම, 13. උසස් කුලවල ඉපදීම, 14. ප්‍රඥාවන්ත වීම.

යමෙකු ප්‍රාණඝාත අකුසල කර්මය කරයි නම් හේ එම අකුසල කර්මයේ බලපෑමෙන් මරණින් මතු උපදින භවවල අල්පායුෂ ඇතිව උපත ලබයි.

එමෙන්ම ප්‍රාණඝාත අකුසල කර්මය නොකොට සියල්ලන් හට කරුණාව, දයාව, මෛත්‍රිය පතුරවමින් කුසල් දහම් ප්‍රගුණ කරයි නම් හෙතෙම මරණින් මතු උපදින භවවල දීර්ඝායුෂ ලබන්නෙක් වෙයි.

අතින් පයින් හෝ අවිආයුධ පොලු මුගුරුවලින් සත්වයන්ට හිංසා කරන තැනැත්තෙක් වේත්ද හෙතෙම මරණින් මතු අපායේ ඉපිද බොහෝ දුක් විඳියි. තවද උපදින උපදින භවවලදී බොහෝ ලෙඩ රෝග ඇතිවේ.

එමෙන්ම සියලු සත්වයන්ට එක සේ සලකන, පහර නොදෙන, හිංසා නොකරන තැනැත්තා උපදින උපදින භවවලදී නිරෝගිමත් ජීවිතයක් ගත කරනු ලබයි.

යම් ස්ත්‍රියක හෝ පුරුෂයකු අනුනට ක්‍රෝධ කරන්නේද, බලවත් සිත් තැවුලෙන් පසුවන්නේද, සුළු වරදක් පෙන්වා දුන් විට තරහ ගනීද, කෝපය, ද්වේෂය, අසතුට පෙන්වන්නෙක් වන්නේද හෙතෙම මරණින් මතු උපදින භවවල දුර්වර්ණ වී උපත ලබයි.


එවන් අකුසල කර්මයන්ගෙන් දුර්වර්ණ වන්නා සේම අනුනට ක්‍රෝධ නොකරන, සිත් සතුටින් පසුව, තම අඩුපාඩු හොඳින් සොයා බලන, කෝපය, ද්වේෂය ප්‍රහීණ කළ තැනැත්තා මරණින් මතු උපදින ආත්ම භවවලදී රූමත් වී උපදී.

මෙලොව ජීවත් වන සමහරුන් අල්පේශාක්‍යව ජීවත් වෙති. එසේ වීමට හේතු නම් තවකෙකුට ඊර්ෂ්‍යා කිරීම හා අනුන්ගේ ලාභ සත්කාර, ගරු කිරීම්වලට, වැඳුම් පිදුම්වලට ඊර්ෂ්‍යා කිරීම් යනාදියයි.

එමෙන්ම අනුන්ගේ ලාභ සත්කාර, ගරු සත්කාර, වැඳුම් පිදුම්වලට ඊර්ෂ්‍යා නොකරන, යහපත් දිවියක් ගත කරන තැනැත්තා මහේශාක්‍යව, පිරිවර සහිතව තම ජීවිතය ගත කරයි.

දසදාන වස්තුවෙන් ශ්‍රමණ බමුණන්ට සංග්‍රහ නොකරන යමෙකු වේතොත් හෙතෙම උපදින ආත්ම භවවලදී ඉතා දිළිඳුව උපත ලබන අතර දසදාන වස්තුවෙන් ශ්‍රමණ බමුණන්ට සංග්‍රහ කරන්නෝ මතු ආත්ම භවවලදී පරිපූර්ණ වශයෙන් ධනය හිමි අය වෙති.

එදා භාරතීය සමාජයේ සිටම පැවත එන්නක් ලෙස කුල භේදය පෙන්වා දිය හැකිය. යමෙකු තදබල සිත් ඇති, අභිමානයෙන් යුතුව ජීවත් වෙන, පිදිය යුත්තන් පිදීමට අකමැති, ඔවුනට ගරු නොකරන, සත්කාර නොකරන අයෙක් ලෙස සිටී නම් හේ මරණින් මතු උපදින ආත්ම භවවල නීච කුලයක උපත ලබනු ඇත.



තවද මෘදු ගතිගුණ දරණ, සැහැල්ලු මනසක් ඇති, සෑම දෙනා සමග සහයෝගයෙන් කටයුතු කරන, පිදිය යුත්තන් පුදන, ඔවුනට ගරු සත්කාර කරන යහපත් අයකු නම් හේ මරණින් මතු උපත ලබන්නේ යම් තැනද එහි උසස් කුලවල උපත ලබනු ඇත.

මෙලොව සමහරෙක් බුද්ධිමත් අය වෙති. තවත් සමහරෙක් බුද්ධිය හීන අය වෙති. එසේ වීමට හේතු කවරේදැයි යන්න අප කවුරුත් හොඳින් දැන ගත යුතුය. යමෙක් ශ්‍රමණ බ්‍රාහ්මණයන් සමීපයට පැමිණ,


''කුසල් මොනවාද? අකුසල් මොනවාද? නිවැරදි මොනවාද? ඇසුරු කළ යුතු, නොකළ යුතු අය කවුරුන්ද? මා හට බොහෝ කලක් හිත සුව පිණිස කළ යුතු දෑ මොනවාද?'' යනුවෙන් ප්‍රශ්න නොඅසන්නේද හේ උපදින උපදින ආත්මයක් පාසා අඥාන වී උපන්නේය.

එසේ නොමැතිව ශ්‍රමණ බ්‍රාහ්මණයන් ළඟට පැමිණ ''කුසල් මොනවාද? අකුසල් මොනවාද?'' යනාදී ලෙස ඉහත දැක්වූ ප්‍රශ්න අසා තමන්ගේ ඉදිරි අනාගතය සාර්ථක කරගැනීමට කටයුතු කරන්නා මරණින් මතු උපදින ආත්ම භවවලදී ප්‍රඥාවන්තයකු ලෙස උපත ලබනු ඇත.


මේ ආකාරයට දැක්වූ පුද්ගල වර්ග දහ හතර ''දළදා වරුණ'' කියවන ඔබ හොඳින් සිතා බලා එමගින් ඔබගේ සහ සමස්ත සමාජයේම අභිවෘද්ධිය උදෙසා වැඩ කටයුතු කරන ලෙසත්, යහපත් ක්‍රියාවට, කුසල දහමට හිත යොදවා තමන්ගේ ඉදිරිය සඳහා කුසල් රැස්කර ගන්නා ලෙසත් දන්වනු කැමැත්තෙමි.

**ප්‍රකාශ් සංදීප් - සිරි දළදා දහම් පාසලේ ආචාර්ය**

''තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය.''




# පඤ්ච නීවරණයන් නිවන් මග අවුරයි



දේශකයාණෝ - මහනුවර හයගිරි
විජයසුන්දරාරාම විහාරද්වයාධිපති,
ඓතිහාසික බදුල්ල මුතියංගණ රාජමහා විහාරාධිපති,
ශ්‍රී දළදා මාළිගාවේ තේවාවිහාර,
අතිගෞරවාර්හ
වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද
ඥාණරතනාභිධාන
මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ අස්ගිරි මහාවිහාර
පාර්ශවයේ මහානායක මාහිමිපාණන් වහන්සේ

"තත්‍ථ කථමානි පඤ්චනීවරණානි කාමච්ඡන්ද ව්‍යාපාද නීවරණං ථීනමිද්ධ නීවරණං උද්ධච්ච කුක්කුච්ච නීවරණං විචිකිච්ඡා නීවරණං ඉමානි පඤ්චනීවරණානි"

පින්වත්නි,

කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච-කුක්කුච්ච හා විචිකිච්ඡා යන අකුසලයන් ආධ්‍යාත්මික දියුණුව වළකන, නිවන් මග අවුරන හෙයින් පඤ්ච නීවරණ ලෙස හැඳින්වේ. මේවා ධ්‍යාන සිත්වලට බාධා කරන අකුසල ධර්මයෝය. සසර ගමන දික් කරන අකුසලයට සිත පොළඹවන මෙම නීවරණ ධර්ම ලෞකික, ලෝකෝත්තර යන දෙකෙහිම දියුණුවේ මග අවුරයි. නීවරණයන්ගෙන් මිදුණු එකඟ වූ සිතක් ඇති කර ගැනීමට

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතු

කුසල ධර්මයන්ගෙන් පිරුණු සිතක් ඇති කර ගත යුතුමය. එමගින් නොකැළඹුණු සිතක් ඇති කර ගැනීමට මෙන්ම මගඵල ලබා ගැනීමට ද හැකි වේ.

පඤ්ච නීවරණ එදිනෙදා කටයුතු නිවැරදිව කිරීමට බාධා පමුණුවයි. සම්‍යක් මාර්ගය නිවැරදිව හඳුනාගැනීමට ද බාධා කෙරෙයි. නිවන් මග එළඹීමට නම් මෙම අකුසල ධර්මතා ජයගත යුතුමය. එසේ නොමැත්තේ නම් ලෞකික දියුණුව ඇති කර ගැනීමට මෙන්ම නිවන් මගෙහි ගමන් කිරීමට ද බාධා ගෙන දෙයි. ඒවා ජයගැනීමෙන් අපට ඇතිවන විපත්, කරදර අඩුකර ගැනීමට මෙන්ම සිත පිරිසිදු කොට විමුක්තිය සාදා ගැනීමට ද අවකාශය සැලසෙයි. නීවරණ ධර්ම මනාව සමනය නොකර ගත හොත් කාය, වාග්, මනෝ කර්මයන් ද අපිරිසිදු වේ. එපමණක් නොව යහපත් මරණයක් ද අත් නොවේ. තිලකුණු මෙනෙහි කොට නීවරණයන්ගෙන් මිදුණු විට සුවදායක මරණයක් ළඟා කර ගත හැකිය. සිත කරුණාව, මුදිතාව, මෛත්‍රිය හා ප්‍රඥාව වැනි සිතුවිලි වලින් ශෝභමාන වූ විට කය, වචනය, සිත යන තිදොරින් සිදුවන්නා වූ කර්ම ද පවිත්‍ර වේ. නිවැරදි කුසල ධර්ම වලට මුල් වන්නේ නීවරණයන්ගෙන් මිදුණු සිතමයි. නීවරණයන්ගෙන් සිත අපිරිසිදු වූ විට නිවැරදි ධර්ම මාර්ගය හඳුනා ගත නොහැකිය. එසේම තමන් උදෙසා හෝ අනුන් උදෙසා යහපත් දේ ඉටු කිරීමට නොහැකි වේ.

පඤ්ච නීවරණයන්හි එන කාමච්ඡන්දය නම් රාගය හෙවත් තණ්හාවයි. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශයන්හි තණ්හාව කාමච්ඡන්දය වඩවයි. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන කරුණු කෙරෙහි අනුවණින් සිතීම, සුභ වශයෙන් ගැනීම කාමච්ඡන්දයයි. අසුභ නිමිත්ත නුවණින් මෙනෙහි කරන්නා හට නූපන්නා වූ කාමච්ඡන්දය නූපදින්නේය. උපන්නා වූ කාමච්ඡන්දය ප්‍රහීණ වේ. ඉන්ද්‍රිය සංවරය, ආහාරයේ පමණ දැනීම, කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, අසුභ භාවය මෙනෙහි කිරීම, කාමච්ඡන්දය ප්‍රහාණයට මුල් වේ. කාමච්ඡන්දය සිතෙහි පහළ වූ විට පිරිසිදු වූ එකඟ සිතක් ඇති කර ගැනීමට නොහැකිය. එය ධ්‍යාන සිතක් ඇති කර ගැනීම ද දුෂ්කර හෙයින් නීවරණයකි. කාමච්ඡන්දය සපුරා බැහැර කර ගැනීමෙන් සිත සමාධියෙහි පිහිටුවා එකඟ බවක් ඇති කර ගැනීමට පහසු වේ. කාමච්ඡන්දය නමැති කාමෝඝය මහා සැඩ පහරකි. එයට හසුවූවෙකුට නිවනට යා ගත නොහැකිය. සසර දුකට ගොදුරු වීමට සිදු වේ. පස්කම් සැපයට ඇලීම නම් වූ කාමච්ඡන්දය ප්‍රඥාව තුළින් බැහැර කර ගත් විට, මාර්ග සිත් ඇති කොට ගෙන කෙලෙස් පහ කර ගනිමින් සමාධියෙහි සිත පිහිටුවා නිවන් මග සාක්ෂාත් කර ගත හැකිය. කාමච්ඡන්දය සිත හාත්පසින්ම වට කර ගනී. එහි නොඇලීමෙන් ඉන් ඇති වන්නා වූ අනර්ථය වළකාලිය හැකිය.

ව්‍යාපාදය යනු ක්‍රෝධයයි. ක්‍රෝධය ඇති කර ගැනීමෙන් සිත අපිරිසිදු වේ. මෙකී ව්‍යාපාදය හෙවත් ක්‍රෝධය දසවැදෑරුම්ය. අසවලා මට අවැඩක් කළේය, දැනුත් කරයි, මතුවටත් කරනු ලබයි, අසවලා මගේ ප්‍රියතමයාට අවැඩක් කළේය, දැනුත් කරයි, මතුවටත් කරයි, අසවලා මගේ සතුරාට හිත පිණිස වැඩ කළේය, දැනුත් කරයි, මතුවටත් කරනු ලබයි, අස්ථානයේ කෝප උපදවයි යනුවෙන් මේ දසවැදෑරුම් කෝපය ව්‍යාපාදයට අයත් වේ. මේ දසවැදෑරුම් ව්‍යාපාදය නිසා සිත අපිරිසිදු වේ. අසවලා මට ගැසුවේය, බැන්නේය, පරාජය කළේය ආදී වශයෙන් නිතර සිහි කිරීමෙන් ව්‍යාපාදය උපදියි. යමක් හේතු කොට ගෙන නූපන්නා වූ ව්‍යාපාදය උපදී නම්, උපන්නා වූ ව්‍යාපාදය නැවත නැවත වන බව පවතින්නේ නම් එය අනිෂ්ඨ නිමිත්තකි. එම අනිෂ්ට නිමිත්ත යම් සේ වේ ද එබඳු අන් එක ධර්මයකුදු නුවණැසින් නොදැක්ක බව සම්බුදු වදනයි. අනිෂ්ට නිමිත්ත නුනුවණින් මෙනෙහි කරන්නා හට නූපන්නා වූ ව්‍යාපාදය ද උපදියි. උපන්නා වූ ව්‍යාපාදය නැවත නැවත උපදී. නූපන්නා වූ ව්‍යාපාදය නූපදී නම් උපන්නා වූ ව්‍යාපාදය ද ප්‍රහීණ වේ. මෛත්‍රී චිත්ත විමුක්තිය නුවණින් මෙනෙහි කරන්නා හට නූපන් ව්‍යාපාදය නූපදී. උපන්නා වූ ව්‍යාපාදය ප්‍රහීණ වේ. ව්‍යාපාදයෙන් සිත කැලඹුණු තැනැත්තාට ඕනෑම කෙනෙකුගේ දිවි තොර කිරීමට පවා හැකිය. ක්‍රෝධය වැඩෙනසුලු ධර්මතාවක් හෙයින් ක්‍රෝධය වැඩුණු විට තමාගේ රූපය ද විරූපී බවට පත් වේ. රළු බවට පත් වේ. තමන් ද වැනසී අනුන් ද වනසයි. කෝපය සංසිඳුවා ගැනීමට ඇති හොඳම මග නම් ඉවසීම හා මෛත්‍රිය පැතිරවීමයි. නිතර නිතර මෛත්‍රිය වැඩීමෙන් සංසුන් සිතක් ඇතිව දිවි ගෙවිය හැකිය.

ථීනමිද්ධය ඇති වූ විට සිතෙහි මැලි ගතිය, චෛතසිකයන්ගේ මැලි ගතිය යන දෙකම ඇති වෙයි. මෙසේ කළ යුතු දෙයෙහි මැලි ගතියත්, නිදිමත ගතියත් නිසා ථීනමිද්ධය හේතු කොට ගෙන කෙලෙස් බරින් නිදහස් වීමට මිනිසා අපොහොසත් වෙයි. සිතේත්, චෛතසිකයන්ගේත් මැලි ගතිය, සීල, භාවනාදියෙහි අලස බව, ඇග මැලි ගතිය, සිතේ හැකිලුණු ගතිය ථීනමිද්ධය වේ. යමක් හේතු කොට ගෙන චිත්ත චෛතසිකයන් අකර්මණ්‍ය වීම නම් වූ ථීනමිද්ධය උපදිනේ නම්, උපන්නා වූ ථීනමිද්ධය විපුලභාවයට පැමිණේ නම්, කුසල ධර්මයේ නොඇල්ම වූ අලස බව, ඇග මැලි කැඩීම, බත් මත, සිතෙහි හැකිලුණු බව යම් සේ වේ ද, හැකිලුණු සිත් ඇත්තහුට නූපන්නා වූ ද ථීනමිද්ධය උපදියි. උපන්නා වූ ථීනමිද්ධය විපුලභාවයට පැමිණෙයි. නූපන්නා වූ ථීනමිද්ධය නූපදී නම් උපන්නා වූ ථීනමිද්ධය ප්‍රහීණ වේ නම් ආරබ්ධ වීර්‍යය ඇත්තා හට කුසීත භාවයෙන් හික්මුණු විට නූපන්නා වූ ථීනමිද්ධය නූපදී. උපන්නා වූ ථීනමිද්ධය ප්‍රහීණ වේ. කුසල් දහම්හි නොඇල්ම, අලසබව, ඇඟමැලිකම, බත් මතය, සිතේ හැකිලීම ධ්‍යානාදිය ඉපදවීමට බාධා කරයි. එහෙයින් ථීනමිද්ධය මෙලොව, පරලොව දෙකෙහිම දියුණුව පිණිස බාධාවෙකි. අලසයා කම්මැලි කමින් දවස ගත කරත් නම් ඔහුගේ ජීවත් වීම සැම අතින්ම දුෂ්කර වේ. ඔහු හිඟමනට වැටේ. කුසීතකමින් සිත මුදවා ගෙන වීර්‍යය වඩවත් නම් තම කාර්‍යයන් නොපිරිහෙලා ඉටු කර ගැනීමට පහසු වේ. පමණ ඉක්මවා ආහාර ගැනීමෙන් වෙන් වීම තුළින් හා ඉරියව් වෙනස් කිරීම, ආලෝක සංඥාව මෙනෙහි කිරීම, කල්‍යාණ මිත්‍ර සේවනය ආදිය ථීනමිද්ධයෙන් මිදීමට උපකාරී වෙයි.



උද්ධච්ච-කුක්කුච්චය නම් එක්ව යෙදුනත් දෙකෙකි. සිතෙහි නොසන්සුන් ගතිය උද්ධච්ච ගතියයි. කුසල් කිරීමට නොහැකි වූවා යැයි ද, අකුසල් කෙළෙමි යැයි ද වශයෙන් තැවෙන ස්වභාවය කුක්කුච්චයයි. කුසල් නොකළ බව, අකුසල් කළ බව සිතීමේ දී ඇතිවන පසුතැවිල්ල උද්ධච්ච-කුක්කුච්චයට හේතු වේ. සිත කලබල කර ගැනීම හා පසුතැවිල්ල ධ්‍යාන වැඩීමට බාධාවක් වන හෙයින් එය නීවරණයක් වන්නේය. මෙසේ සිත නොසන්සුන් භාවයට පත් වීම තුළින් කුසල් මග ඇවිරෙයි. උද්ධච්ච-කුක්කුච්චයෙන් සිතේ නොසන්සුන් බවත්, පසුතැවීමත්, සිත බැලීමට බාධාත් ගෙන දෙයි. සංසුන් සිත් ඇති තැනැත්තාට නූපන්නා වූ උද්ධච්ච-කුක්කුච්චය නූපදී. උපන්නා වූ උද්ධච්ච-කුක්කුච්චය ප්‍රහීණ වේ.

විචිකිච්ඡාව යනු ත්‍රිවිධ රත්නය කෙරෙහි සැක ඉපදවීම, සීලයන්හි සැක ඉපදවීම, අතීතයෙහි හා අනාගතයෙහි සැක ඉපදවීම හා හේතුඵල ධර්මයන් කෙරෙහි සැක ඉපදවීමයි. සැකය වැඩී, වැරදි ලෙස සිතීමටත්, අනුවණින් මෙනෙහි කිරීමටත් සිත යොමු වෙයි. නුවණින් මෙනෙහි කරන්නා හට නූපන්නා වූ විචිකිච්ඡාව නූපදී. උපන්නා වූ විචිකිච්ඡාව ප්‍රහීණ වේ. ධර්ම විනයේ උගත් බව, තෙරුවන් කෙරෙහි අමිල සැදැහැවත් බව, කලණ මිතුරු ඇසුර, තෙරුවන් ගුණ පිළිබඳ නිතර නිතර කථා ඇසීම විචිකිච්ඡාව ප්‍රහීණයට මග සලසයි.

යට කී නීවරණ ධර්ම ප්‍රඥාව ද සිහි නුවණ ද ආවරණය කරයි. ධ්‍යාන වැඩීමට පමණක් නොව, ලෞකික, ලෝකෝත්තර යහපතට ද බාධා කරයි. එබැවින් සසර දුකින් නිදහස් වීමට නම්, කුසල් දහම් වැඩීමට නම් පඤ්ච නීවරණයන්ගෙන් සිත මුදවා ගත යුතුමය. පඤ්ච නීවරණයන්ගෙන් මිදීමට ඇස, කන, නාසාදී ඉන්ද්‍රියන්හි පවත්නා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ධර්මතාවය මෙනෙහි කිරීම බොහෝ සෙයින් උපකාරී වේ. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ හා මානසික අරමුණු, අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ස්වභාවයෙන් යුක්ත බව සම්බුදු වදනයි. මෙම තිලකුණු මෙනෙහි කරන්නා රූප, ශබ්ද, රස, ගන්ධාදියෙහි කලකිරෙයි. කලකිරුණු තැන නොඇලෙයි. මේ ආකාරයෙන් පඤ්ච නීවරණයන්ගෙන් සිදුවන අනර්ථය ගැන සිහිපත් කොට නිවන් මග අවුරන මෙකී අකුසල ධර්මයන් නූපදවාගන්නටත්, ඉපදුණු නීවරණයන් ප්‍රහාණය කර ගන්නටත් අද මෙම උතුම් පොහෝ දිනයේ දී අධිෂ්ඨාන කර ගනිමු. තෙරුවන් සරණයි.

''යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි.''



# බුදු දහමේ සුවිශේෂතා

බුදු දහම නිර්මාණවාදී ආගමක් නොවේ. ලෝකය නිර්මාණය කළ සර්වබලධාරී දෙවියකු ගැන සඳහන් නොවේ. බුදු දහම ලෝකයේ ස්වභාවය විස්තර කරනුයේ හේතුඵල නියාමයට අනුවය. එසේම කාලාම සූත්‍රවල දක්නට ඇති ආකාරයට බුදු දහම මිනිස් නිදහස් චින්තනය අගය කරන දහමකි.

**බුදු දහමේ සුවිශේෂී ලක්ෂණ මෙසේ කැටිකර දැක්විය හැක.**


- බුදු දහම රහස්‍ය ධර්මයක් නොවේ.
- බුදු දහම ආක්‍රමණික ධර්මයක් නොවේ.
- බුදු දහම අන්ධ භක්තියෙන් පිළිගත යුතු ධර්මයක් නොවේ.
- බුදු දහම කටපාඩමින් කියන යාඥාවක් නොවේ.
- බුදු දහම සර්ව සුබවාදී හෝ සර්ව අසුබවාදී ධර්මයක් නොවේ.
- බුදු දහම ප්‍රතිමා වඳින දහමක් නොවේ.
- බුදු දහම පරලොව දියුණුව ගැන පමණක් කියන දහමක් නොවේ.
- බුදු දහම දේවවාදී ආගමක් නොවේ. ජීවන දර්ශනයකි. නැසීගිය විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර් ප්‍රකාශ කර ඇත්තේ ''බෞද්ධ දහම යනු මිනිසාගේ භෞතික හා අධ්‍යාත්මික යන දෙඅංශයේම සංවර්ධනය තුලනාත්මකව විග්‍රහ කරන දර්ශනයකි'' යන්නය.

උපන් මිනිසා පිරිහෙන අයුරු පරාභව සූත්‍රයෙන් පෙන්වා දී ඇති අතර පිරිහීමට අදාළ එම කරුණු අත්හැරීමෙන් මෙලොව දියුණුව ඇති නොවේ. මිනිසෙක් සතු යුතුකම් හා වගකීම් සිඟාලෝවාද සූත්‍රයෙහි මැනවින් දක්වා ඇත. බුදු දහමේ උගන්වන දයාව, කරුණාව, මෛත්‍රිය, අර්ථචරියාව, සමානාත්මතාව වැනි කරුණු යහපත් සාමකාමී සමෘද්ධිමත් සමාජයක් ගොඩනගා ගැනීමට හේතු වේ.

මිනිස් දිවිය සරු කරන, නිවැරදි කරන, අගනා උපදෙස්වලින් ධම්මපදය පොහොසත්ය. ආර්ය අෂ්ඨාංගික මාර්ගය සමාජයට අවශ්‍ය නැණවත්, ගුණවත් මිනිසුන් බිහි කිරීමට ඉවහල් වේ. සමස්තයක් වශයෙන් ගැනීමේදී නිවැරදිව සිතන්නටත්, ක්‍රියා කරන්නටත්, නිවැරදිව කථා කරන්නටත්, නිවැරදිව අවබෝධ කරගන්නටත් බුදු දහමින් උගන්වා ඇත. ඒවා මෙලොව ජීවිතය අර්ථවත් කර ගැනීමට හේතු වේ.

**පූජ්‍ය ගලගෙදර රතනවංශ හිමි**

''සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහ් හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ.''



# දළදා කරඬුව වඩම්මන නැදුන්ගමුවේ රාජාට උපහාර දැක්වීමේ උත්සවයක්

## වයස 63 යි
## වසර 11 ක්ම දළදා පෙරහරේ
## ගිය දුර කි.මී. 50,000 ට වැඩියි

බුදුන් වහන්සේගේ ශ්‍රී දළදාව ලක්දිවට වැඩම වූයේ කීර්ති ශ්‍රී මේඝවර්ණ රජු දවසය. (ක්‍රි.ව. 310) එතැන් සිට එරජු ඇතුළු රටවැසියා දිනපතාම ඊට පුද පූජා කළ බව දඨාවංශ තොරතුරුවලට අනුව හෙළිවේ. කල් යාමේදී රටේ සශ්‍රීකත්වය උදකරන්නක් ලෙසත්, රාජ්‍යත්වයේ සංකේතයක් ලෙසත් සලකමින් දළදාව ගරු බුහුමන් ලැබූ අයුරු ඓතිහාසික තොරතුරු අනුව අනාවරණය වේ.


මේ අනුව කලින් කලට රාජ්‍යත්වයත් සමගින් රාජධානීන් තැනින් තැනට මාරුවී යත්ම දළදාවද ඒ ඒ තන්හි රමණීය ලෙස නිමවන ලද දළදා මාලිගාවන්හි තැන්පත් කොට තිබේ. ඊට අනුකූලව අද වන විට ශ්‍රී දළදාව මහනුවර දළදා මාලිගාවේ වඩා හිඳුවා ඇති අයුරු අපට දැකගත හැකිය.


බෞද්ධයාගේ මුදුන් මල්කඩ බඳු මේ අති පූජනීය වස්තුව වෙනුවෙන් නිතිපතා උත්කෘෂ්ට ලෙස පුද පූජා සිදු කෙරේ. තවද වර්තමානයේදී සංස්කෘතික සහ සෞන්දර්යාත්මක ප්‍රසංගයක් ලෙස එහි පැවැත්වෙන ඇසල පෙරහර මංගල්‍යය කලාත්මක අගයකින් යුක්ත වූවකි. ඒ අනුව වාර්ෂිකව පැවැත්වෙන එකී ඇසල පෙරහර අද කොයි කාගේත් සිත්ගත් මහෝත්සවයක් බවට පත්ව ඇත.

මෙම පෙරහරේ දළදා කරඬුව වැඩමවීම සුවිශේෂී කර්තව්‍යයකි. එපමණක් නොව, එය අද විශාල අභියෝගයක් බවටද පත්ව ඇත. ඒ මන්ද, ඒ උදාර කාර්යයට උචිත ඇතුන්ගේ හිඟතාවයි.

නැදුන්ගමුව 'රාජා' නම් මෙම ක්‍රියාවලියට පරිපූර්ණ වශයෙන්ම සුදුස්සෙකි. සමව පිහිටි සතර පාද, කුළු වැනි විශාල කන්, බිම ගෑවෙන දිගු සොඬ, අඩි 11 ක් පමණ වූ උස, එමෙන්ම දළදා කරඬුව තැබීමට උචිත පරිදි සකස් වූ පිට ආදී වශයෙන් පිරිපුන් ශරීර ලක්ෂණ සියල්ලම පාහේ මෙම හස්තියාට පිහිටා ඇත. එපමණක්ද නොව, පුදුම සිතෙන තරමට ඉවසිලිවන්ත වූ මෙම සත්වයා විනයානුකූල බවින්ද අති ඉහළය. තවද සියලු ගමන් සිදුවන්නේ පයින්මය. ඒ අනුව මේ වන විට ඇවිද ගිය දුර කි.මී. 50,000 කටත් වැඩි තරම් යයි ප්‍රධාන ඇත්ගොව් මහතා පවසයි.

මේ වන විට එක දිගට වසර 11 ක් තුළම නැදුන්ගමුවේ ඇත් රජුන් නොකඩවා දළදා





කරඬුව පෙරහරේ වැඩමවීමට සමත් වී තිබීම මහාර්ඝ ක්‍රියාවලියකි. දැනට වයස අවුරුදු 63 ක් පමණ වුවත්, ඒ පුණ්‍යවන්ත හස්තියා දෑලේ ඇතුන් සමග දළදා පෙරහරේ ඉදිරියට ඇදෙනුයේ ඉතා සාඩම්බර ලීලාවකින් බව කොයි කාගේත් පිළිගැන්මය. එම දසුන නෙත ගැටෙත්ම කාගේත් මුවගින් මහ හඬින් සාධු නාදය මතුවී දෝංකාරය දෙනුයේ ඒ නිසාමය. තවද මෙය අද අබෞද්ධයන්ගේ පවා සම්භාවනාවට පාත්‍ර වන්නක් බවට ලෝ පතල වී ඇති බවද අමතක නොකළ යුතුය.

එසේ නම් මේ උදාර කර්තව්‍යය කරන නැදුන්ගමුව ඇත් රජු පිළිබඳව අපි අද කොයිතරම් නම් සිතිය යුතු වෙම්ද? අපගේ මුතුන් මිත්තන් වංගෙඩියට, මෝල්ගහට, බත් හට්ටියට පවා ගෞරව කළහ. කෘතගුණ සැලකීමට ඔවුහු කිසිසේත් පසුබට නොවූහ. එපමණක් නොව, ඔවුහු එදා ගස්, ගල් පවා අමතක නොකළහ. මෙය අපට පුදුමයට කරුණක්ද නොවේ. බුදුන් වහන්සේ බුදු බව ලැබ සිදුකළ අනිමිස ලෝචන පූජාව අපට මහාර්ඝ උපදේශයකි.

ඒ අනුව වසර ගණනාවකට පසුව වුවද ප්‍රථම වරට පසුගියදා (20.10.2016) කිරිඳිවැල එක්සත් බෞද්ධ බල මණ්ඩලය විසින් නැදුන්ගමුව 'රාජා' ට කෘතගුණ දක්වමින් කළ උපහාරයක් ඔස්සේ එකී සත්වයා ඉහළට ඔසවා තැබීම අතිශයින්ම අගය කටයුත්තකි. මෙහිදී අස්ගිරි, මල්වතු මහ නාහිමිවරුන් ඇතුළු ප්‍රාදේශීය සංඝරත්නයේ ආශිර්වාදය යටතේ දළදා මාලිගයේ දියවඩන නිලමේ තැන්පත් නිලංග දෑල මහතාද, ඇතුගේ හිමිකරු වන වෛද්‍යාචාර්ය හර්ෂ ධර්මවිජය මහතාද, දේශපාලන අධිකාරියේ සහ විවිධ අංශයන්හි විද්වත් පිරිස්ද සහභාගී කර ගනිමින් අතිවිශාල ජනකායක් මධ්‍යයේ නැදුන්ගමුවේ 'රාජා' වෙනුවෙන් 'දළදා ගිජිඳු ගුණ වරුණ' උපහාර උළෙල අත්‍යාලංකාරව පැවැත්විණ.

කිරිඳිවැල මැදි මහ විදුහල් ක්‍රීඩා භූමියේදී පැවැත්වූ මෙම උපහාර උළෙලේදී නැදුන්ගමුව 'රාජා' මෙන්ම හර්ෂ ධර්මවිජය වෛද්‍යතුමන් ඇතුළු ඇත් ගොව් මහතුන්ද වෙනුවෙන් වැඩමවා කොට සිටි සංඝරත්නය ලවා සෙත් පිරිත් සජ්ජායනය කරමින් ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය නොමදව ලැබේවායි ආශිංසනය කරනු ලැබිණ. අනතුරුව රැස්ව සිටි සුවඳැති හදවත් ඇති මිනිසුනගේ සාධු නාද මධ්‍යයේ අති ගෞරවනීය සංඝයා වහන්සේ අතින් ඇත් රජුනට පිරිත් පැන් ඉසිණ. පිරිත් නූල්ද ගැට ගැසිණ. තවද හර්ෂ වෛද්‍යතුමන්ට නැදුන්ගමුවේ රාජාගේම අනුරුවක් ප්‍රදනය කෙරුණ අතර, ඇත්ගොව් මහතුනටද සමරු තිළිණය බැගින් ප්‍රදනය කෙරිණි. මීට අමතරව නැදුන්ගමුව 'රාජා' ඇතුළු සමස්ත ඇත් පරපුරම විෂය කරගනිමින් ලියවුණ සමරු කෘතියක්ද එළි දක්වමින් එය නොමිලයේ බෙදහරිනු ලැබීය.

**ආචාර්ය සෝමරත්න හේවා**
**(කිරිඳිවැල එක්සත් බෞද්ධ බල මණ්ඩලයේ බෞද්ධ කටයුතු පිළිබඳ විශේෂ අනුකමිටු ලේකම්)**

# බුදුන් වහන්සේ සහ සක්විති රජුට පමණක් ඇති

# දෙතිස් මහා පුරුෂ ලක්ෂණ

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ පන්සියයක් පමණ භික්ෂූන් වහන්සේලා සමඟ දඹදිව සදහම් චාරිකාවේ යෙදුන සේක. එකල ත්‍රිවේදයෙහි පරතෙර පැමිණි නොයෙක් විෂයන් පිළිබඳ මනා දැනුමක් ඇති විශේෂයෙන් මහා පුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයෙහි විශේෂඥ බ්‍රහ්මායු නම් විසි එක් හැවිරිදි උගත් බමුණු පඬිවරයෙක් මිථිලා නම් නගරයෙහි වාසය කළේය.

බුදුරජාණන් වහන්සේ සදහම් චාරිකාවේ යෙදෙන බවට බ්‍රහ්මායු බමුණු පඬිවරයාට දැනගන්නට ලැබී නව අරහාදි බුදු ගුණයෙන් යුක්ත වූ බුදුරජාණන් වහන්සේ දැකගන්නට ඇත්නම් මැනවයි සිතූහ. බ්‍රහ්මායු බමුණු පඬිවරයාට, එතුමා සේම දැන උගත් උත්තර නම් ශිෂ්‍යයෙක් විය. ඔහු කැඳවා, බුදුන් වහන්සේ කරා ගොස් උන්වහන්සේ පිළිබඳ පැතිර ඇති ඒ යසස, කීර්තිය සත්‍යම වූවක් ද, දෙතිසක් මහා පුරුෂ ලක්ෂණ ඇත්තේ ද, නැතහොත් නැති දෙයක් ඇතැයි වංචාවෙන් පෙන්වීමෙන් ඇති වූ කීර්ති ඝෝෂාවක්දැයි පරීක්ෂා කොට එන්නැයි දැන්වූහ. අප දන්නා මහා පුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයට අනුව දෙතිස් මහා පුරුෂ ලක්ෂණ සියල්ල යමෙකු සතුවේ ද, ඔහු ගිහිගෙයි වාසය කළ හොත් සක්විති රජවීමට නියමිත බවත්, ගිහිගෙය හැර පැවිදි වුවහොත් කෙලෙස් නසා අර්හත් සම්මා සම්බුදු වන බවත් විස්තර කොට බ්‍රහ්මායු පඬිවරයා, ඒ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ සියල්ල බුදුන් වහන්සේ සතු වේ දැයි පරීක්ෂා කොට පැමිණෙන්ටයි කියා උත්තර මානවකයාට භාර කළේය.

මානවකයා ගුරුතුමාගේ අණට කීකරුව, ගුරුවරයාට වැඳ සමුගෙන බුදුන් වහන්සේ සමීපයට ගියේය. බුදුන් වහන්සේ වෙත ගොස් වැඳ එකත්පසෙක හිඳගෙන බුදුන් වහන්සේගේ ශරීරයෙහි මහා පුරුෂ ලක්ෂණ එකින් එක පරීක්ෂා කරන්නට විය. මේ අනුව පුරුෂ ලක්ෂණ දෙකක් හැර අනෙක් පුරුෂ ලක්ෂණ ඔහු දුටුවේය. බුදුන් වහන්සේගේ පුරුෂ ලක්ෂණ පරීක්ෂා කරන උත්තර මානවකයා ලකුණු දෙකක් හැර අනෙක්වා දුටු බවත්, ඒ දෙක පිළිබඳව සැක කරමින් විමතියට පත්වෙමින් නොපැහැදෙමින් සිටින බවත් බුදුන් වහන්සේ විසින් දැන, ඒ ලකුණු දෙක ද ඔහුට පෙනෙන සේ ඍද්ධියක් කළ සේක.

තම ගුරුවරයා සඳහන් කළ පරිදි බුදුන් වහන්සේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ වලින් යුක්ත බව දැනගත් උත්තර මානවකයා, ගුරුවරයා සඳහන් නොකළත් වෙනත් යමක් පිළිබඳව ගුරුවරයා ප්‍රශ්න කළ හොත් එයට පිළිතුරු දීම අවශ්‍ය වන බැවින් බුදුන් වහන්සේගේ ක්‍රියා කලාපය පිළිබඳව යන එන තැන්වල කරන ලද දේශනා විලාශය පිළිබඳව පරීක්ෂණයක් කළ යුතු යැයි සිතා පුරා සත් මසක් පර්යේෂණයක යෙදුනේය. එම නිසාම උත්තර මානවකයාට බුද්ධ පරීක්ෂක, බුද්ධ වීමංසක යන අන්වර්ථ නාමයක් ද පටබැඳුණු බව අටුවාවල සඳහන් වේ. මේ අනුව උත්තර මානවකයා සත් මසක් පර්යේෂණයෙන් පසු තම ගුරුතුමා වෙත ගොස් බුදුන් වහන්සේ පිළිඳව ඇති වී තිබෙන කීර්ති රාවය ඇත්තාවූම දෙයකින් හටගත්තක් බව පැවසූහ.

දීඝ නිකායේ ලක්ඛණ සූත්‍රයෙහි අන්තර්ගත වන්නේ ලක්ෂණ ශාස්ත්‍රයට අනුකූලව පුරුෂයන්ගේ රූප ලක්ෂණ හඳුන්වන ආකාරයටය. දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් හඳුන්වන විට පුරුෂයන්ගේ දෙපතුලින් ආරම්භ කොට අනුපිළිවෙලින් හිස දක්වා විස්තර කෙරේ. එම නිසා මේ චාරිත්‍ර ධර්මයට අනුකූලව බුදුන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණ විස්තර වන්නේ ශ්‍රී පතුලේ සිට හිස දක්වා වූ අනුපිළිවෙලිනි.

1. සුප්පතිට්ඨිත පාදෝ - මනාව පිහිටි පාද ඇත්තේය.
2. චක්කානි ජාතානි - යටි පතුල්හි මඟුල් ලකුණු ඇත.
3. ආයතපණ්හී - දික් වූ විලුඹ ඇත.

"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකි

4. දීඝංගුලි - පිරිපුන් දික් ඇඟිලි ඇත.
5. මුදුතළුනහත්ථපාදෝ - ඉතා මෘදු අත් පා ඇත.
6. ජාලත්ථ පාදෝ - නම්‍යශීලී අත් පා ඇත.
7. උස්සංඛපාදෝ - පාවල ගොප් ඇත. ඉහළින් පිහිටා ඇත.
8. ඒණි ජංගතා - ඕලු මුවකුගේ බඳු කෙණ්ඩා ඇත.
9. ආජානුලම්බි හත්ථනා - සිටි වනම නොනැමී දෙඅත්ලෙන් දෙදණ ස්පර්ශ කිරීමේ හැකියාව ඇත.
10. කෝසෝහිත වත්ථගුය්හෝ - කෙමියක බහාලූ පුරුෂ නිමිත්ත ඇත.
11. ස්වණ්ණවණ්ණෝ - ශ්‍රී දේහය රන්වන් පැහැ ඇත.
12. සුබ්‍රමච්ඡවි - ඉතා සියුම් සම නිසා ශරීරයේ දාඩිය, තෙල්, කුණු නොඇලේ.
13. ඒකේකලෝමෝ හෝති - එක් ලෝම කූපයක එක් ලෝම කූපයක් පමණක් පිහිටීම.
14. උද්ධගතලෝමෝ - ලෝම දකුණට කරකැවී උඩට හැරී පිහිටා ඇත. දෙබැම අතර ඌර්ණ රෝම ධාතුව පිහිටා ඇත.
15. බ්‍රහ්මුජ්ජුගත්තෝ - බ්‍රහ්මයෙකුගේ මෙන් ඍජු ශරීරයක් ඇත.
16. සත්තුස්ස දතෝ - පිටි අතුල්, පිටි පතුල් දෙක, උරහිස් දෙක, කොන්ද යන සත් තැනම තථාගත හරීරයේ ඇත. නහර මතු නොවී පිහිටා තිබීම.
17. සීහ පුබ්බද්ධ කායෝ - තථාගත ශරීරය සිංහයාගේ ඉදිරි ශරීරය මෙන් හැම තැනම පිරිපුන්ය.
18. චිත්තන්රංසෝ - පිටෙහි වූ පිරිපුන් මාංශ ඇත.
19. නීග්‍රෝධ පරිමණ්ඩලෝ - සමව පිහිටි ශරීරය, උස පමණට ගැලපෙන මහතින් යුතු බව.
20. සමවත්තක්ඛන්ධෝ - මනාව වට වූ ගෙල, කතා කිරීමේ දී නහර හෝ උගුරු ඇටය මතු නොවී මිහිරි හඬ නැගේ.
21. රසග්ග සග්ගී - මුඛයට තබන ලද ඉතාම සුළු ආහාරයක් වුව ද රස සකල ශරීරයෙහි පැතිරීම.
22. සීහ හනු - සිංහයාගේ යටි හක්ක මෙන් උඩ යටි හනු දෙකම පූර්ණව පවතී.
23. චත්තාලිස දන්තෝ - දන්තයන් සතළිහක් පිහිටීම.



24. සමදන්තෝ - සමව පිහිටි දත් ඇති බව.
25. අවිරදදන්තෝ - විවර හිඩැස් නැති සේ දත් එකට බැඳී සිටීම.
26. සුසුක්ක දාඨෝ - සුදෝ සුදු වූ දන්තයන් ඇත.
27. පහූත ජිව්හෝ - පුළුල් වූ ජිව්හා ධාතුව ඇත.
28. බ්‍රහ්මස්සරෝ - බ්‍රහ්මයාගේ බඳු මිහිරි හඬ ඇත.
29. අභිනීල සුනෙත්තෝ - නිල්වන් නෙත් ඇත.
30. ගෝපමුඛෝ - ළදරු වස්සකුගේ බඳු නෙත් ඇත.
31. උන්ණාලක්ඛණතා - දකුණට කැරකුණු ඌර්ණ රෝම ධාතුවක් පිහිටා ඇත.
32. උණ්හිස සීසෝ - සෙස්සන්ට නොමැති දිග, පුළුල්, උස් වූ නළල් තලයක් පිහිටා ඇත.

**ශාස්ත්‍රවේදී පූජ්‍ය තිබ්බටුවාවේ සිද්ධත්ථ හිමි**

"යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

18 දළදා වරුණ

ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

## කාමයේ වහලුන් නොවෙමු

'කාමයෝ අපවිත්‍රය. දුගඳ හමන සුළුය. කෙලෙස් කටු සහිතය. යම්බඳු කාමයක ගිලී මව හා දියණිය වූ අපි දෙදෙනා සමාන භාර්යාවෝ වූවෙමු. ඒ කාමයට නින්ද වේවා.'

\- පරමත්ථදීපනී ථෙරිගාථා අට්ඨකතාව

මේ උප්පලවණ්ණා තෙරණිය තම ජීවිත අත්දැකීම් හරහා ලැබූ යම් යම් ප්‍රපංච අනුසාරයෙන් කී කතාවකි. පරමත්ථදීපනී අටුවාව තුළ ඇය හා ඇයගේ ජීවන තොරතුරු ඇතුළත් සම්පූර්ණ චරිතාපදනය විවරණය වෙයි. සාමාන්‍ය ලෝකයේ ගැහැනියක ලෙස ජීවත් වුවද ඇයගේ ජීවිතය අමුතුම එකකි. සම්මත ලෝකයේ සිදු නොවන සිද්ධි මතකයේ වැලිතලාවෙන් වැසී ගිය බව ඇය සිහි කරයි. නමුත් ඒවා දැනගත් විට කම්පාවෙන් දුක් වෙයි. තැවෙයි. සංවේගයට පත්වෙයි. ඥානයේ නෙත් වසන රාගයට "නින්ද වේවා" යැයි ඇය කියයි. අපවිත්‍ර දුගඳ හමන සුළු රාගය කටුක බව ඇය කියයි.

ඇය එසේ කීවද, එසේ සිතුවද මෙලොව ජීවත් වන සත්වයන්ගෙන් බොහොමයක් අදටත් කාම ගින්නෙන් දැවි දැවී සිටිති. මේ කියන කාම ගින්නට ස්ත්‍රී, පුරුෂ භේදයක් නැත. කොටින්ම අද එයට වයස් සීමාවක්ද නැත. මේ දහම් දිවයින තුළ අද කොයිතරම් නම් ස්ත්‍රී දූෂණ සිදුවෙනවාද? ඇතැම් බාල අපචාර ගැන සමාජයට හෙළිදරව් වන්නේද නැත.

ඇතුළතින් කාම ගින්නෙන් පෙළෙන බොහොමයක් දෙනා සමාජයට නොපෙනෙන්නට සුදු පිරුවට ඇඳ සිටිති. ඔවුන් හඳුනා ගැනීමත් අපහසු කාරණයකි. මේ කියමන මෙලොව ජීවත් වන සියලු මානවයන්ට පොදු වූවක් නොවේ. දියෙන් කිරි වෙන්කර හඳුනා ගැනීමේ හැකියාව ඇත්තේ හංසයාටය. මනසින් කෙතරම් උසස් වුණත් මිනිසාට ඒ හපන්කම ලැබී නැත. අප සැමවිටම සිතන්නේ මේ ලොව ජීවත් වන අයගෙන් "හොඳ" තමා පමණක් බවය. ඇතැම්විට එය මහා රැවටිල්ලකි. ජුගුප්සාජනක තම සිත අන් අයට නොපෙනෙන්නට කරන රැවටීමකි. නිතර ඇතිවන කාම සිතුවිලිවලින් අපට මිදීමට හැක්කේ මේ රූපයේ ඇති නිස්සාරත්වය වටහා ගැනීමෙන් පමණකි. නවදූලි හේනේ පිළිස්සී උන් වැදිරියට සම කළ රූපශ්‍රියාවිය ඔබට මතකද? බුදු බණ පදයක් පදයක් ගානේ කියාදෙන මේ ශරීර කුඩුවේ මායාව ඔබ වටහා ගන්නේ නම් ඔය තරම් ඔබ රාගයට වහල් වන්නේ නැත. ප්‍රජාවගේ පැවැත්මට ලිංගිකත්වය වුවමනාය. ඒ විවාහය නමැති සම්මතය තුළ පමණි. "දළද වරුණ" කියවන ඔබ ඔබගේ හදවතින්ම මෙය විමසා බලන්න.

**ඔබට ඔබ පාලනය කරගත හැකිද?**

එයට ලැබෙන පිළිතුර "ඔව්" නම් සසර ගමන කෙළවර නිවන සොයා යන මාර්ගයට ඔබ ඒකාන්තයෙන්ම පැමිණ ඇත්තේය. ■



# මහනුව... කවුරු...

මහනුවර බෝගම්බර කිරි මුහුද කෙළවර එයට මඳක් ඉහළින් ඉතා කෙටි බිම්කඩක මහනුවර රජවාසල උද්‍යානය හෙවත් වේස් පාර්ක් (Ways Park) පිහිටා ඇත. ක්‍රි.ව. 1815 උඩරට රාජධානිය බිඳ වැටෙන තුරු මේ බිම්කඩ සහිත බෝගම්බර කිරි මුහුදට ඉහළින් ඇති බිම ගලහ දක්වා එද එකම කැලෑවක් විය. මේ කැලෑව හඳුන්වන ලද්දේ "දඩයම්තලාව" රක්ෂිතය නමිනි. එය නගරය වසා ගත් උඩවත්තා කැලෑවේම කොටසක් විය. නගරයට ඉහළින් පිහිටි දඩයම්තලාව රක්ෂිතය උඩරට රජවරු හේතු කීපයක් මත පරිහරණය කළහ. නගරයට ඉහළින් ඇති බැවින් එහි සිට නගර සිරි නැරඹීම එකකි. දඩයම් යාම නිසාම දඩයම්තලාව නම ඊට භාවිත විය. රජු එද මෙහි දඩයම් යද්දී විවේක ගත් පැරණි අරලිය ගසක් ගෝතමී බාලිකා විදුහල අසල තවම දැකිය හැක. ඉංග්‍රීසි යුගයේදී නාගරිකරණය බහුලවීම, ජනාවාස පුළුල් වීම, කැලෑ එළිවීම සමග දඩයම්තලාව රක්ෂිතය අභාවයට ගියේය. මේ රක්ෂිතය පාමුල මල්වතු විහාරය දෙසට බෝගම්බර කිරි මුහුද අද්දර 'මීගොන් අරඹ' විය. එයද කැලෑවක් විය. අද වැව පිහිටි බිම මීගොල්වෙල නමින් වෙල් යායක්ව තිබියදී එහි වැඩට ගත් මීහරක් නිදැල්ලේ හැසිරුණේ දඩ මීගොන්, වල් මීගොන් ගැවසුණේ මේ මීගොන් අරඹ තුළයි. මහනුවර කල ලියැවුණු "මඟ සලකුණ" සන්දේශ කාව්‍යය මීගොන් අරඹ වර්ණනා කරයි.

අද ඉතිරි වී ඇති මහනුවර රජවාසල උද්‍යානය එද තිබී අද විනාශ වී ඇති දඩයම්තලාව රක්ෂිතයේ හා මීගොන්

"අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් ...





# රජවාසල උද්‍යානයේ නොදන්නා යටගියාව

අරඹ රක්ෂිතය පිහිටි බිමේ නැවත වගා කළ කුඩා උද්‍යානයකි. මෙම රජ වාසල උද්‍යානයේ භාරකරු ආර්. ටී. ආර්. විජේසිංහ මහතා සමග එහි අතීතය ගැන සාකච්ඡා කළෙමි. එදා පැරණි උද්‍යානයට යාමට තිබූ මාර්ග අද මේ උද්‍යානයට යාමට පියගැට ලෙස බඳවා ඇත. දඩයම්තලාව හා මීගොන් අරඹ විනාශව ගිය පසු ජනාවාස වීම නිසා අත්හැර දැමූ මුඩු බිම කසළ දැමීම සඳහා භාවිත විය. කසළ ගොඩ ගැසීමට වෙන්කර තිබූ මේ බිම්කඩ මහනුවර සිටි ඉංග්‍රීසි ඒජන්තවරයා වූ එච්. වේස් (H. Ways) විසින් උද්‍යානයක් ලෙස ඔහුගේ කාලයේ නැවත වනය වවා වැඩි දියුණු කර ඇත.

"ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ඉතිහාසය" නමැති ඉංග්‍රීසි ග්‍රන්ථය අනුව වේස් ක්‍රි.ව. 1900-1902 අතරද ඉන්පසු නැවත ක්‍රි.ව. 1904 ජනවාරි, ක්‍රි.ව. 1906 අප්‍රේල් දක්වාද මහනුවර සේවය කර ඇත. වේස් උද්‍යානයට ඒ නම ලැබුණේ ඒ උද්‍යානට මුල පිරූ වේස් ඒජන්තවරයා සිහිවීමක් වශයෙනි. ඉන්පසු මහනුවර නගර සභාව මෙය වැඩි දියුණු කර ඇත. මුළු බිම් ප්‍රමාණය ක්‍රි.ව. 1985 වන විට අක්කර 2 පර්චස් 27 ක් විය. නමුත් දැන් එය අක්කර 2 ක් පමණ අඩුවී ඇත. ඉංග්‍රීසි මුල් යුගයේදී වවන ලද අවුරුදු 150 ක් පමණ පැරණි මාරා ගස් හා වට අඩි 6 ක් පමණ වූ වල් දේවදාර ගස් මෙහි ඇත.

දැනට මෙහි පාලනය නගර සභාව මගින් සිදුවේ. මෙම උද්‍යානය වටා අවසර ඇතිව හා නැතිව සාදා ඇති ගොඩනැගිලි නිසා උද්‍යානයේ සීමා පටුවී ඇත. ක්‍රි.ව. 1939-1945 දෙවැනි ලෝක යුද්ධය කාලයේ මෙම බිම මවුන්ට් බැටන් ආදිපාදවරයාගේ චාරිකාවලට එක් තැනක් විය. මෙම යුද සමයේ භාවිත කළ කාලතුවක්කුවක්, විසිතුරු ගෘහයක් තුළ ඒ වටා ජලජ ශාක වැවූ පොකුණක් අද්දර ප්‍රදර්ශනයට තබා ඇත. දෙවැනි ලෝක යුද්ධය කාලයේ ආඥාපතිව සිටි මවුන්ට් බැටන් සාමි දෙවැනි එලිසබෙත් රැජිනගේ මාමා විය.

පහළ බිමේ සිට යන විට සඳකඩ පහණ, පෙති විහිදුණු නෙළුම් මල පසුකර යද්දී ක්‍රි.ව. 19 සියවස අග තෙලූ ගල් පියගැට තුනක් ඉහළට යා යුතුය. ඉංග්‍රීසි යුගයේදී මෙම කැටයම් රචිය. මෙහි ඉහළට යන විට කැටයම් අතර මොණර ජෝඩුවක්, හංස යුවළක් දැකිය හැක. ඉහළම පියගැටවල ඇතුන් දෙදෙනකුගේ රූප හා හංස යුවළක් තෙලා ඇත. ඒ නිර්මාණ කලාත්මක බවින් අඩුය.

තදබල, කාර්යබහුල නාගරික ජීවිතයෙන් මොහොතක් අස්වැසීම ලැබීමට රජවාසල උද්‍යානයේ උස් බිමේ නිසංසල රමණීය පරිසරය හේතුවෙයි. මෙම උද්‍යානය පාමුල සිංහල රජ දවස පැතිර තිබුණේ පැරණි වැවකි. එය එදා හැඳින්වූයේ පල්ලාවෙල වැව/පල්ලාදෙණිය වැව යන නම්වලිනි. මෙම වැවේ කෙළවර දෙයියන්නේවෙල දක්වා පැතිර තිබුණි. බෝගමීඩර කිරිමුහුදේ වැඩි ජලය ගලා ගියේ පල්ලාදෙණිය වැවට බව "උඩරට කැරැල්ල" තුන්වැනි කාණ්ඩයේදී තෙන්නකෝන් විමලානන්ද හා "ත්‍රිසිංහලේ" ග්‍රන්ථයේදී පෝල් ඊ. පීරිස් කියති.

එස්. කේ. ජයවර්ධන

ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ." - (ධම්ම පදයේ 3 වන ගාථාව)


# හරි අට මග නොදැන යන්නට බැහැ නිවන

**අතිපූජ්‍ය රාජගිරියේ අරියඥාන ස්වාමීන් වහන්සේ සමග කරන ලද ධර්ම සාකච්ඡාවකි**

❒ ස්වාමීන් වහන්ස, ගිහි පින්වතුන් වන අපි බුදුන් වහන්සේ දේශනා කොට වදාළ අතිඋතුම් ධර්ම මාර්ගයට අවතීර්ණ වන්නේ කොහොමද?

ධර්ම මාර්ගය කියලා කියන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයටයි. සාරා සංඛ කල්ප ලක්ෂ ගණනාවක් බෝධිසත්වවරයෙක් දස පාරමී ධර්ම පූර්ණ කරලා, උතුම් සම්මා සම්බුද්ධත්වයට පත්වෙන්නේ. මේ උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගය සීල, සමාධි, ප්‍රඥ කියලා කොටස් තුනකට බෙදෙනවා. සීලයට අදාළව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව කියන කාරණා තුන. සමාධියට අදාළව සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි, කියන කාරණා තුන. ප්‍රඥවට අදාළව සම්මා දිට්ඨි සහ සම්මා සංකප්ප දේශනා කරනවා. මේ කාරණා අටේ එකතුවයි ආර්ය අෂ්ටාංගික මාර්ගය කියන්නේ. ධර්ම මාර්ගයේ ගමන් කරන පින්වතා, පින්වතිය අනිවාර්යයෙන්ම මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයට බැස ගත යුතුයි. බුදුරජාණන් වහන්සේ ආර්ය අෂ්ටාංගික මාර්ගය දේශනා කොට තිබෙන්නේ අනුපිළිවෙළකට. එක මාර්ග අංගයක් වැඩීමේ හේතුවෙන් සකස් වෙන ඵලයක් වශයෙන් තමයි දෙවැනි මාර්ග අංගය වැඩෙන්නේ. උදාහරණයක් කියනවා නම් සම්මා දිට්ඨිය වැඩුවොත් තමයි, සම්මා සංකප්පය වැඩෙන්නේ. සම්මා සංකල්පය වැඩුවොත් තමයි සම්මා වාචාව වැඩෙන්නේ. හේතුඵල ධර්මයන් මත දේශනා කළ ධර්මයක්.

මේ උතුම් ධර්ම මාර්ගයට අවතීර්ණ වන පින්වතා අනිවාර්යයෙන්ම සම්මා දිට්ඨිය කියන දොරටුවෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගයට ඇතුල් විය යුතුයි. සම්මා දිට්ඨිය නමැති ප්‍රධාන දොරටුවෙන් බැහැරව කෙටි මාර්ග, පහසු මාර්ග, සැප මාර්ග ඔස්සේ අතුරු දොරටුවලින් ආර්ය අෂ්ටාංගික මාර්ගයට අවතීර්ණ වුණොත් අනිවාර්යයෙන්ම ඔබ තුළ වැඩෙන්නේ මිච්ඡා ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. පින්වත් ඔබට ඉහත කාරණය පැහැදිලි කොට දෙන්න උදාහරණයක් කියන්නම්. දවසක් මහත්මයෙක් භික්ෂුව මුණ ගැහෙන්න කුටියට පැමිණියා. ඒ මහත්මයා කියන විදියට එම මහත්මයා ජීවිතයෙන් වැඩි කාලයක් යොමු කරන්නේ භාවනාවට. ඒ මහත්මයා භාවනාවේ දියුණුව ගැන භික්ෂුවට කියමින් සිටියදී, භික්ෂුව වැඩ සිටින ප්‍රදේශයේ නිතර සැරිසරන වඳුරු රංචුව ගස්වල අතු සොලවමින් කුටිය සමීපයට පැමිණියා. ඒ වෙලාවේ එම භාවනා කරන මහත්මයා කියනවා වඳුරෝ කියන්නේ අපේ මුතුන් මිත්තෝ කියලා. එතකොට භික්ෂුව එම මහත්මයාගෙන් ඇසුවා වඳුරෝ කොහොමද අපේ මුතුන් මිත්තෝ වෙන්නේ කියලා. එතකොට එම භාවනා කරන මහත්මයා කියනවා අපි පැවතෙන්නේ වානරයාගෙන්ය කියලා. භික්ෂුව ඒ මහත්මයාගෙන් ඇසුවා ලෝකය හට ගැනීමට අදාළව බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ අග්ගඤ්ඤ සූත්‍රය මහත්මයා කියවලා නැතිද කියලා. ඒ වෙලාවේ ඒ මහත්මයා කියනවා අදාළ සූත්‍රය කියවලා තිබෙනවා, නමුත් එම සූත්‍රයේ ඇති කරුණු තමා පිළිගන්නේ නැහැය කියලා. බලන්න බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ධර්මයක් පිළිගන්න සූදානම් නැහැ. නමුත් ජීවිතයේ ප්‍රධානම කාර්යය භාවනාව. සම්මා දිට්ඨියෙන් තොරව සම්මා සතියක්, සම්මා සමාධියක් සොයනවා. සමහර විද්‍යා අංශයෙන් අධ්‍යාපනය ලබන පින්වතුන්ලා සිටිනවා. එම පින්වතුන් ඕපපාතිකව සත්වයන් උපදිනවාය කියලා විශ්වාසයක් නැහැ. මේ දෘෂ්ටිය හරි අනතුරුදායකයි.



"නීතිගරුකව කටයුතු කිරීම හැම අතින්ම හිතකරය - ගග්ග ජාතකය"

සම්මා දිට්ඨිය නමැති දොරටුවෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගයට ඇතුල් නොවීමේ විපාකයයි ඔබ මේ දකින්නේ. වර්තමාන සමාජය තුළ භාවනාවේ නාමයෙන් සම්මා දිට්ඨියේ ප්‍රධාන දොරටුවෙන් බැහැරව සම්මා සතියත්, සම්මා සමාධියත් සෙවීමේ නිරර්ථක ව්‍යායාමයක හැඩරුව පෙනෙන්ට තිබෙනවා.

❒ ඔබවහන්සේ සඳහන් කළා ආර්ය අෂ්ටාංගික මාර්ගයට පිවිසීමේදී අනිවාර්යයෙන්ම සම්මා දිට්ඨිය නමැති දොරටුවෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගයට පිවිසිය යුතුය කියලා. ස්වාමීන් වහන්ස, සම්මා දිට්ඨියට අප පිවිසෙන්නේ කුමන දොරටුවෙන්ද?

සම්මා දිට්ඨියට පිවිසීමට නිවැරදි දොරටුවක් තිබෙනවා. එම දොරටුව තමයි කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය, ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කිරීම. මෙන්න මේ දොරටුවෙනුයි සම්මා දිට්ඨියට අවතීර්ණ වෙන්නේ. මෙතනදී කල්‍යාණ මිත්‍රයා කියන්නේ සංසාර භය, සංසාර ගැඹුර කියලා දෙන පින්වතායි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ධර්ම දේශකයා, ධර්ම කථිකයා කියලා කියන්නේ සංසාර බිය කියලා දෙන පින්වතාය කියලා. යම් පින්වතෙක් ඔබට අනුශාසනා කරනවා නම් මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දැක නිවන් අවබෝධ කොට ගන්න කියලා. එම පින්වතා මිත්‍රයෙක් වෙන්න පුළුවන්. නමුත් කල්‍යාණ මිත්‍රයෙක් වෙන්නේ නැහැ. යම් පින්වතෙක් ඔබට මේ ජීවිතයේදී උතුම් අධිගමයන් සාක්ෂාත් කොට ගන්න බැහැය කියනවා නම් ඔහු මිත්‍රයෙක් වෙන්න පුළුවන්. නමුත් කල්‍යාණ මිත්‍රයෙක් වෙන්නේ නැහැ. කල්‍යාණ මිත්‍ර ආශ්‍රය මේ ලෝකයේ දුර්ලභ දෙයක් කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ඔබට ලැබුණත්, ඒ හේතුවෙන් සද්ධර්මය ශ්‍රවණය කළත්, එම ශ්‍රවණය කළා වූ ධර්මය ඔබ නුවණින් මෙනෙහි කිරීමට අදක්ෂ නම්, එතනදී ඔබ දුර්වලයෙක් බවටයි පත්වෙන්නේ. ලෝකයේ සිටින ලොකුම අවාසනාවන්තයා බවට ඔබ පත්වෙනවා. මොකද දුර්ලභ කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලැබිලා. උතුම් සද්ධර්මය ශ්‍රවණය කරලා. නුවණින් මෙනෙහි කිරීමට ඇති අදක්ෂභාවය නිසාම, ඔබ සම්මා දිට්ඨියට පිවිසීමේ දොරටුවෙන් ඈතට යනවා. මේ නුවණින් මෙනෙහි කිරීමේ අදක්ෂභාවය ඔබ තුළ සකස් වෙන්නේ කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ද, උද්ධච්ච-කුක්කුච්ච, විචිකිච්ඡා කියන පංච නීවරණ ධර්මයන් නිසාමයි.

දූත් පින්වත් ඔබට හොඳින් පැහැදිලි ධර්ම මාර්ගය කියන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයට. ආර්ය අෂ්ටාංගික මාර්ගයට පිවිසීමේ ප්‍රධාන දොරටුව සම්මා දිට්ඨියයි. සම්මා දිට්ඨියට පිවිසෙන නිවැරදි දොරටුව කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය සහ නුවණින් මෙනෙහි කිරීමයි, ධම්මානුධම්ම ප්‍රතිපදාව කියලා.

■ සම්මා දිට්ඨිය සකස් කොටගත් පින්වතා තුළ දකින්න පුළුවන් මූලික ලක්ෂණ මොනවාද?


සම්මා දිට්ඨියට අදාළ ප්‍රධානම කාරණාවක් වෙන්නේ,

1. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව
2. මරණින් පසු හේතුඵල ධර්මයන් අනුව නැවත ඉපදීම පිළිබඳ විශ්වාසය
3. කර්මය-කර්ම ඵල විශ්වාසය
4. දන්දීමේ, සිල් රැකීමේ ආනිශංස පිළිබඳ විශ්වාසය
5. අම්මා, තාත්තාගේ ගුණයන් කෙරෙහි විශ්වාසය
6. ඕපපාතිකව සත්වයන් උපදිනවාය කියන විශ්වාසය
7. අතීතයේ අධිගමලාභී උත්තමයන් වැඩ සිටියාය කියන විශ්වාසය

■ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව


සම්මා දිට්ඨියට පත්වුණ පින්වතා බුදුරජාණන් වහන්සේගේ ගුණයන්, ඥානයන් කෙරෙහි අවබෝධයෙන්ම විශ්වාසය ඇති කොටගත් කෙනෙක්. අනුන් කියන නිසා නොවේ. පතපොතකින් කියවීම නිසා නොව, ඒ උතුම් සම්බුද්ධ චරිතය, සම්බුද්ධ ඥානයන්, සද්ධර්මය ශ්‍රවණය කිරීම තුළින්ම, නුවණින් මෙනෙහි කිරීම තුළින්ම බුදුරජාණන් වහන්සේ කෙරෙහි විශ්වාසය ඇති කොට ගන්නවා. බුදුරජාණන් වහන්සේගෙන් තොර ලෝකයක්, සැපයක් දකින්නේ නැහැ. ලෝකයේ සැබෑම ලෞකික, ලෝකෝත්තර සැපයන් ලබා දෙන මාර්ගය සත්වයාට මතුකොට දුන්, ආශ්චර්යවත් උත්තමයා හැටියටයි බුදුරජාණන් වහන්සේව දකින්නේ. බුදුරජාණන් වහන්සේගේ සරණින් පිට ලෝකය මිථ්‍යාදෘෂ්ටික ලෝකයක්. අකුසලයට පාර පෙන්වන, දුගතියට වැටෙන ලෝකයක්. මේ මොහොතේ පින්වත් ඔබ ලබන සතුට, සැනසිල්ල බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය නිසාමයි අපට ලැබුණේ කියලා දකිනවා. දෑස් පියා ගනිද්දී ඔබට මැවිලා පෙනෙන්නේ බුදුරජාණන් වහන්සේගේ රූප කායයි. ඒ අයෝමය සම්බුදු ගුණයේ ඥානයේ ශක්තිය ඔබේ ජීවිතයට, ධර්ම මාර්ගයට ඔබ ශක්තියක් කොට ගන්නවා. මේ ලෝක ධාතුවේ ශක්තිමත්ම සරණ ඔබ ඔබේ පිහිට කොට ගනිද්දී බිය කියන ධර්මතාව ඔබෙන් දුරස් වෙලා යනවා.

දෙවැනිව ඔබ ධර්ම රත්නය කෙරෙහි විශ්වාසය තහවුරු කොට ගන්නවා. බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් දේශනා කොට වදාළ උතුම් ධර්මය, ධර්ම රත්නය වශයෙන් හඳුන්වනවා. නිවීමේ මාර්ගයට පක්ෂ වෙන්වා වූ, සුගතියට, සැපයට පක්ෂ වෙන්නා වූ සත්තිස්බෝධිපාක්ෂික ධර්මයන් කෙරෙහි අත්දැකීමෙන්ම ලෞකික, ලෝකෝත්තර සැප ලැබෙන මාර්ගය හඳුනා ගන්නවා. සුගතියේ ජීවත් වන හැම සත්වයෙක්ම ධර්මයේ ඵලයක් බවත්, දුගතියේ ජීවත් වන සෑම සත්වයෙක්ම අධර්මයේ ප්‍රතිඵලයක් බවත් දකිනවා. ධර්මය මග හැරීම, ධර්මයට පිටුපෑම, තමා තමාට කරගන්නා ලොකුම සතුරුකම බව දකිමින් ධර්ම රත්නය කෙරෙහි විශ්වාසය ඇති කොට ගන්නවා. කෙනෙක් පොහොසත් වන්නේ ධර්මානුකූලව සිතපු



නිසා බවත්, කෙනෙක් දුප්පත් වන්නේ ධර්මානුකූලව සිතපු නිසා බවත්, කෙනෙක් දුප්පත් වන්නේ ධර්මානුකූලව නොසිතපු නිසා බවත් ඔහු දකිනවා. කෙනෙක් ලස්සන වෙන්නේ ධර්මානුකූලව සිතපු නිසා බවත්, තව කෙනෙක් විරූපී වෙන්නේ ධර්මානුකූලව නොසිතපු නිසා බවත් දකිනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ චතුරාර්ය සත්‍යය, ආර්ය අෂ්ටාංගික මාර්ගය, පංච උපාදානස්කන්ධය, පටිච්ච සමුප්පාද ධර්මය, සතර සතිපට්ඨාන ධර්මයන් තුළින් භව ගමනේ දුකත්, භව නිරෝධයේ නිදහස් වීමත් පිළිබඳව මාර්ගය අපිට වටහා දෙනවා. ධර්මය සෑම සත්වයෙක්ගෙ'ම ජීවිතයේ කොටසක් වුවද, අධර්මය කෙරෙහි ඇති ගිජුභාවය නිසාම, තමා තුළින්ම ක්‍රියාත්මක වන ධර්මතාවන් මගහැරෙනවා. පින්වත් ඔබ ධර්මය හඳුනාගෙන, පිහිට කොටගෙන ජීවිතයට එකතු කොටගත් තැනදී ලෝකයෙන් නිදහස් වීමේ ධර්මය තමා තුළම සැඟව තිබූ බවත් ඔබට අවබෝධ වෙනවා. ලෝකයත්, ධර්මයත්, ජීවිතයත් එකම ක්‍රියාන්විතයක් වෙන තැනදී, මේ ගැඹුරු ලෝක ධර්මයන් සම්මා සම්බුද්ධ ඥානයෙන් මතු කොටගත් බුදුරජාණන් වහන්සේ කෙරෙහිත්, ධර්ම රත්නය කෙරෙහිත් අවබෝධයෙන්ම ශ්‍රද්ධාව ඇතිවෙනවා.

සංඝරත්නය කෙරෙහි ශ්‍රද්ධාව සකස් වීමේදී කොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේගේ පටන් වර්තමානයෙන් අනාගතය දක්වාත් වැඩ සිටින ගෞරවණීය ස්වාමීන් වහන්සේලාගේ ගුණයන්, ඥානයන් කෙරෙහි විශ්වාසය ඇති කොට ගන්නවා. බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් ධර්ම මාර්ගය තුන් ලෝකයටම යහපත පිණිස නොකඩවා ආරක්ෂා කොටගෙන පැමිණෙන්නේ මහා සංඝරත්නයයි. පින්වත් ඔබ මේ මොහොතේ බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව, ධර්මරත්නය කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකොට ගන්නේ මහා සංඝරත්නය අපරිමිත කැපවීම මත මේ උතුම් ධර්මය, උතුම් ප්‍රාතිමෝක්ෂ සීලය ආරක්ෂා කොටගෙන පැමිණි නිසාමය. පින්වත් ඔබ උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරන මොහොතක් පාසාම, සංඝරත්නයේ ගුණයන්, ඥානයන්මයි දකින්න ඕනේ. උතුම් සීලයන්ගෙන් සංඝයා පිරිහී ගිය තැනදී සංඝරත්නය ලෝකයෙන් අතුරුදන් වෙනවා. සංඝරත්නය ලෝකයෙන් අතුරුදන් වෙන මොහොතේදී, බුද්ධ රත්නයේත්, ධර්ම රත්නයේත් අර්ථයන් අතුරුදන් වීම ලෝක ධර්මතාවක් වෙනවා. එම නිසා පින්වත් ඔබ සංඝරත්නයේ ගුණයන් කෙරෙහි ඇතිකොට ගන්නා වූ විශ්වාසය,



සම්බුද්ධ ශාසනයේ සුරක්ෂිත භාවයට, ඔබෙන් ලැබෙන දයකත්වයක් වෙනවා. පින්වත් ඔබ, වර්තමානයේදී ස්වාමීන් වහන්සේලාගේ යම් අඩුපාඩු දැක විවේචනයන් සිදු කිරීම, ස්වාමීන් වහන්සේලා කෙරෙහි අසතුටු සිත් ඇති කොට ගැනීම තුළින් පින්වත් ඔබ සම්මා සම්බුද්ධ ශාසනය දුර්වල කිරීමට උපකාර ධර්මයන් සකස් කිරීමට උපකාර වුණා වෙනවා. පින්වත් ඔබ සංඝරත්නය කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකොට ගැනීමෙන් සම්මා සම්බුද්ධ ශාසනය සුරක්ෂිත කිරීමේ කාර්යයට ඔබ දයක වෙනවා. ස්වාමීන් වහන්සේලාට නිගරු කරමින්, කොත් කරමින් යමෙක් ශාසනය ආරක්ෂා කිරීමට උත්සාහ කරනවා නම් එය මිරිඟුවක් බවටයි පත්වෙන්නේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සංඝ සමාජයේ යම් දුර්වලතාවක් ඇතිවෙනවා නම් ඒවා නිවැරදි කිරීමට ගිහි පින්වතුන්ලාට පැවරීමක් කරලා නැහැ. මෙතනදී වර්තමානයේ ගිහි පින්වතුන්ලා ගොඩාක් පරිස්සම් වෙන්න ඕනේ. පින්වත් ඔබ ස්වාමීන් වහන්සේලා නිවැරදි කිරීමට යාම පසෙක තබා, ඔබ ආදර්ශමත් වීමට උත්සාහ ගන්න. සීලයේ දුර්වල ස්වාමීන් වහන්සේ නමක් දකින කොට උන්වහන්සේ දෙස නොව එම ස්වාමීන් වහන්සේ නිසා ගැටෙන ඔබේ සිත දෙස බලන්න දක්ෂ වෙන්න. එවිට ඔබට දනේවි ප්‍රශ්නය තිබෙන්නේ අදළ ස්වාමීන් වහන්සේ තුළ නොව ඔබ තුළමය කියලා.

හික්ෂුව හොඳින් දන්න මහත්වරු කිහිප දෙනෙක් සිටිනවා. එම පින්වතුන් ස්වාමීන් වහන්සේලාට උපස්ථානය කිරීමේදී ස්වාමීන් වහන්සේලාගේ සීලය, සමාධිය, ප්‍රඥාව ගැන සොයන්න යන්නේ නැහැ. සෑම ස්වාමීන් වහන්සේ නමකටම සාරිපුත්ත මහරහතන් වහන්සේ, මුගලන් මහරහතන් වහන්සේ අරමුණු කොටගෙන ඇප උපස්ථාන ධර්මයන් සිදුකරනවා. එම නිසාම එම පින්වතුන් තුළ ගැටෙන සිත්, වෛරී සිත්, ඇතිවෙන්නේ නැහැ. උපේක්ෂා සහගත සිතිවිලි නිසාම ධර්මයේ අර්ථයන් ජීවිතය තුළින් වැඩෙනවා. ඒ නිසාම තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව එම පින්වතුන්ලා තුළ මෝදු වෙනවා. එසේ නොවී සීලයෙන් දුර්වල ස්වාමීන් වහන්සේ කෙනෙක් නිසා ඔබ ද්වේෂයෙන්, වෛරයෙන් යුතුව සැකයක් ඇතිකර ගතහොත් එම අකුසලය නිසාම, යම් දවසක ඔබ සිල්වත් ස්වාමීන් වහන්සේලා කෙරෙහිත් ද්වේෂය, සැකය ඇති කොට ගන්නවා.

හික්ෂුව දන්න එක්තරා කුටියක් තිබෙනවා. අතීතයේ මේ කුටියේ වැඩ සිටිය ස්වාමීන් වහන්සේ නමක් ප්‍රසිද්ධියේම බරපතළ විනය විරෝධී ක්‍රියාවක් සිදුකරලා තිබෙනවා. මේ හේතුව නිසාම වර්තමානයේ සිල්වත් ස්වාමීන් වහන්සේලා මේ කුටියට වැඩියත්, එම ගමේ පින්වතුන් එම ස්වාමීන් වහන්සේලා කෙරෙහි දක්වන්නේ සැකයක්. මේ හේතුවෙන්ම එම පින්වතුන් අප්‍රමාණ අකුසල් සිදුකර ගන්නවා. එම නිසාම පින්වත් ඔබ මහා සංඝරත්නය කෙරෙහි ඇතිකර ගන්නා ශ්‍රද්ධාවම ඔබ තුළ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇති කොට ගැනීමට හේතු වෙනවා. පින්වත් ඔබ ස්වාමීන් වහන්සේලාට අදළව යම් අකැමැති අවස්ථාවක් තිබෙනවා නම්, කරුණාකර එම ස්ථාන මගහැර යන්න. තවදුරටත් ස්වාමීන් වහන්සේලාට අගෞරව කරන්න යන්න එපා. ඒ වගේමයි ගිහි පින්වතුන්ලා තවදුරටත් ස්වාමීන් වහන්සේලා අතර භේදයන්, කලකිරීම් ඇතිවන ආකාරයට කේලාම් කියන්න, බොරු කියන්න යන්න එපා. මෙවැනි අකුසල් නිරයගාමී අකුසල් බවට පත්වෙනවා. සංඝ භේදයන් ඇති කිරීමට ගිහි පින්වතුන්ලා උපකාර ධර්මයන් සකස් කොට දුන්නා වෙනවා. බුදුරජාණන් වහන්සේ හතළිස් පස් වසරක් දඹදිව වැඩ සිටියද, බුදුරජාණන් වහන්සේව ජීවමානව නොදැක්ක ජනතාව ලක්ෂ කීයක් දඹදිව සිටින්නට ඇත්ද? බුද්ධෝත්පාද කාලයකදීත් එකම රටක ඉපිද බුදුරජාණන් වහන්සේ දැකීමේ අවස්ථාව, පින්වත් ඔබ මෙවැනි අකුසල්වලින් අහිමි කොට ගන්නවා.

■ **මරණින් පසු හේතුඵල ධර්මයන් අනුව නැවත ඉපදීම පිළිබඳ විශ්වාසය**

සම්මා දිට්ඨියේ තවත් ලක්ෂණයක් තමයි, මරණින් පසුව පටිච්චසමුප්පන්නව උපතක් තිබෙනවා කියන විශ්වාසය. සත්වයා පටිච්චසමුප්පන්නව නැවත උපදින ස්වභාවයන් හතරක් තිබෙනවා. එම ස්වභාවයන් හතර තමයි ජලාබුජ, ඕපපාතික, සංසේජක, අණ්ඩජ, මේ ස්වභාවයන් හතරෙන් එකක් මරණින් පසු සත්වයා ලබනවා. පින්වත් ඔබ නැවත උපතක් තිබෙනවාය කියන විශ්වාසය ඇතිකොට ගත්තාට පසුව, ඔබ මොකද කරන්නේ? අනාගත ජීවිතයේ සැපයට අදළව අකුසලයෙන් බැහැර වී කුසලය තුළ ශක්තිමත් වෙනවා. එක අම්මා කෙනෙක් ඉන්නවා. ඒ අම්මා වයෝවෘද්ධ රෝගීව ජීවත් වන අම්මා කෙනෙක්. හික්ෂුව ඒ අම්මාට ප්‍රකාශ කළා ඔය ජරා ජීර්ණය වෙච්ච රූපය ගැන ආශාව අත්හැරලා ජීවිතයේ කරපු පින්කම් ගැන සිහි කරමින් ජීවත් වෙලා, සෑම රාත්‍රියකම දේවතානුස්සතිය වඩන්නය කියලා. මරණින් පසු සශ්‍රීක දිව්‍ය තලයක සශ්‍රීක දිව්‍යාංගනාවක් වෙනවාය කියලා. මොකද ඒ අම්මාට අනිත්‍ය සංඥාවක් වැඩීමට දක්ෂතාවක් නැහැ. ඒ නිසයි දේවතානුස්සතිය වඩන්න කීවේ. ඒ වෙලාවේ ඒ අම්මා කියනවා, මැරිලා මොනවා වෙන්නද, වේදනාවක් නැතිව ජීවත් වෙන්නයි ඕනේ කියලා. ඇයට මැරිලා නැවත උපතක් තිබෙනවාය කියලා ස්ථිර විශ්වාසයක් නැහැ. මැරිලා සශ්‍රීක දිව්‍යාංගනාවක් වෙන්න ඇයට කැමැත්තක් නැහැ. ඒ විශ්වාසය ඇයට තිබෙනවා නම් ඇය කැමැත්තෙන් මරණය භාර ගන්නවා. සමහර පින්වතුන් මැරුණට පසුව නැවත උපතක් ගැන විශ්වාසයක් නැහැ. මරණය තමයි විමුක්තිය වශයෙන් දකින්නේ. ජීවත්ව සිටින තුරු හොඳට කාලා බීලා, විනෝද වෙලා සතුටු වෙමු. මරණින් පසුව සියල්ල ඉවරයි කියලා සමහරු දකින්නේ. සමහර බෞද්ධ පින්වතුන්ලාගෙන් ඇසුවොත් මරණයෙන් පසුව කුමක්ද වෙන්නේ කියලා, ඒ අය කියන්නේ වෙන දෙයක් වෙච්චාවේ කියලා. මේ සියලු දෙනාම ගැනෙන්නේ මිථ්‍යාදෘෂ්ටික ස්වභාවයට. සමාජය දෙස හොඳින්

ඇස් ඇරලා බලන්නකෝ මනුෂ්‍යයන් සිල් පද බිඳගන්න, මනෝ කර්ම සිදුකර ගන්න වේගය දක්කාම කීයෙන් කීදෙනෙක්ද සිතලා තිබෙන්නේ මැරිලා පටිච්චසමුප්පන්න උපතක් තිබෙනවාය කියලා. එවැනි විශ්වාසයක් තිබෙනවා නම් සමාජය මෙච්චර දරුණු වෙයිද, වැරදි කරයිද, පටිච්චසමුප්පන්න උපතක් පිළිබඳව විශ්වාසයක් නොමැති නිසාම, එම අර්ථය දුර්වල නිසාම, ලෝභ, ද්වේශ, මෝහ අකුසලයන් විනෝදාංශයක් කරගෙන ඒවාට ආවඩමින් ජීවිතයේ කොනක් ධර්මයේ ගැටගහලා යන අනතුරුදායක ගමනක් සමාජය ගමන් කරන්නේ. පින්වත් ඔබ පටිච්චසමුප්පන්ව නැවත උපතක් ගැන නියත විශ්වාසයක් ඇති කොටගත් තැනයි අකුසලයෙන් බැහැරව කුසලය තුළ ශක්තිමත් වෙන්නේ. භව ගමනේ අතීතය පිළිබඳවත්, භව ගමනේ අනාගතය පිළිබඳවත් සංසාර බිය ඇති කොට ගන්නේ.

■ කර්මය - කර්මඵල විශ්වාසය


සම්මා දිට්ඨියේ තවත් ලක්ෂණයක් තමයි කර්මය කර්මඵල විශ්වාසය. පින්වත් ඔබ යහපත් දෙයක් කළොත් යහපත් ප්‍රතිඵලයක් ලැබෙනවා. අයහපත් දෙයක් කළොත් අයහපත් ප්‍රතිඵලයක් ලැබෙනවාය කියන විශ්වාසය. යහපත් දේවල් කරලා, යහපත් දෙය විපාක දෙන සුගතිභූමි හතක් තිබෙනවා. ඒවා තමයි තුසිතය, යාමය, නිම්මානරතිය, පරනිම්මිත වසවර්තිය, තාවතිංසය, චතුර්මහාරාජිකය සහ මනුෂ්‍ය ලෝකය. අයහපත් දෙය විපාක දෙන තමයි සතර අපාය. සතර අපායෙන් නිරය ගත්තොත් නිරයන් එකසිය තිස්හයක් තිබෙනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. යහපත් දෙය විපාක දෙන සුගතිභූමි හතක් පමණක් තිබෙන ලෝකය තුළ අයහපත් දෙය විපාක දෙන නිරයක් පමණක් එකසිය තිස්හයක් තිබෙනවා බලන්නකෝ. බලන්නකෝ ලෝකයේ යහපත් ක්‍රියාවන්ද වැඩි? අයහපත් ක්‍රියාවන්ද කියලා. අයහපතෙනුයි ලෝකය පිරිලා තිබෙන්නේ. මේක තමයි සම්මා දිට්ඨියේත්, මිථ්‍යා දෘෂ්ටියේත් පරතරය මනින මිණුම් දණ්ඩ වෙන්නේ. පින්වත් ඔබ සිත දෙස බොහොම විමසිල්ලෙන් බලා සිටින්න. ඔබ තුළ සකස් වෙන හැම සිතුවිල්ලක්ම එක්කෝ යහපත පිණිස සකස් වෙන සිතුවිල්ලක්, එක්කෝ අයහපත පිණිස සකස් වෙන සිතුවිල්ලක්.

ඔබ සෑම නිමේෂයකදීම, අනාගත ලෝකයට යහපත සහ අයහපත නිෂ්පාදනය කරමිනුයි සිටින්නේ. පින්වත් ඔබ සිතන්නේ ඔබට යහපත් කීකරු බිරිඳක්, සැමියෙක් ලැබිලා තිබෙනවා කියලා. එය පින්වත් ඔබ සංසාරයේ කරපු යහපත් දෙයක ප්‍රතිඵලයක් වෙනවා ඔබට ලස්සන රූපයක් ලැබිලා තිබෙනවා නම් එය යහපත් දෙයක ප්‍රතිඵලයක්. ඔබට දුර්වර්ණ රූපයක් ලැබිලා තිබෙනවා නම් එය අයහපත් දෙයක ප්‍රතිඵලයක්. රටේ පාලකයා කියන්නේ යහපත් දෙයක ප්‍රතිඵලයක්. යාචක මහත්මයෙක් කියන්නේ අයහපත් දෙයක ප්‍රතිඵලයක්. ගැටෙන්න දෙයක් මෙතන නැහැ. අවබෝධයෙන් නිවැරදි වෙන්නයි තිබෙන්නේ. එය සම්මා දිට්ඨියේ ලක්ෂණයක්. මේ මොහොතේ භික්ෂුවට ගොඩාක් පින්වතුන් ගරු කරනවා. එය භික්ෂුව සංසාරයේ කරපු යහපත් දෙයක ඵලයක්. හෙට භික්ෂුවට ලෝකයම නිගරු කරන්න පුළුවන්. එයත් භික්ෂුව සංසාරයේ කරනු ලැබූ අයහපත් දෙයක ඵලයක්. ධර්ම මාර්ගයේ ගමන් කරනකොට, පින්කම් සිදුකරන කොට පුංචි වැරදීමකින් ගැටෙන සිත් ඇතිකර ගන්න නරකයි. අනෙක් අයත් ගැටෙන ස්වභාවයට යොමු කරන්න නරකයි. අයහපත් සිතුවිල්ල සැඟවී ඇති දුකත්, යහපත් සිතුවිල්ල සැඟවී ඇති සැපයත් හඳුනා ගැනීමට දක්ෂ පින්වතා තුළයි කර්මය කර්මඵල විශ්වාසය ඇතිවෙන්නේ. එය සම්මා දිට්ඨියේ උතුම් ලක්ෂණයයි.

■ දන්දීම, සිල් රැකීමේ ආනිශංස පිළිබඳ විශ්වාසය

සම්මා දිට්ඨියේ තවත් ලක්ෂණයක් තමයි දන් දීමෙන්, සිල් පද රැකීමෙන් ආනිශංස තිබෙනවාය කියන විශ්වාසය. දන් දීමෙන් පෙරළා අපිට ලැබෙන ආනිශංස මොනවාද? ආයුෂ, වර්ණය, සැපය, බලය, රජ කෙනෙක්, සිටු කෙනෙක්, සශ්‍රීක දෙවි කෙනෙක් කියන්නේ කවුද? දන් දීමේ ඵලයක්. දූන් කැලයේ ජීවත් වන ආයුෂ, වර්ණය, සැපය, බලය වැඩි අලියා, සිංහයා, කොටින් වැනි සතුන් පෙර මනුෂ්‍ය ජීවිතවල ඉපදිලා කර්මය කර්මඵල විශ්වාසයෙන් තොරව දන් දීපු අය. ඒ අය සීලයට ගරු කරන්නේ නැහැ. ප්‍රේත ලෝකවල, අසුර ලෝකවල, සද්ධන්ත ප්‍රේතයන් අසුරයින් ජීවත් වෙනවා. මේ අයට සද්ධන්තභාවය ලැබෙන්නේ පෙර ජීවිතවල දනයේ ඵලය නිසාමයි. මැරෙන වෙලාවේ සකස් වුණ ලෝභී සිතක් නිසා ප්‍රේත, අසුර ලෝකයන්ට වැටුණත් දනයේ ආනිශංස නිසා ආයුෂ, වර්ණය, සැපය, බලය වැඩි අය බවට පත්වෙනවා.

සීලයෙන් ලැබෙන ආනිශංස මොනවාද? සිල් රකින පින්වතාගේ කීර්ති රාවය පැතිරී යනවා. ඕනෑම සභාවක් ඉදිරියට නොබියව යනවා. සිහි මුලා නොවී මැරෙනවා. සුගතියේ උපදිනවා. මනුෂ්‍යයෙක්, දෙවියෙක්, බ්‍රහ්මයෙක් කියන්නේ කවුද? සීලයේ ඵලයක්. ධනයෙන්, සීලයෙන්, බලයෙන් පවුල් ජීවිතයෙන් පරිපූර්ණත්වයට පත්වෙලා ජීවත් වන මනුෂ්‍යයෙක් කියන්නේ කවුද? පෙර ජීවිතයේ දනයේත්, සීලයේත් ඵලයයි කියන විශ්වාසය අපිට තිබෙන්න ඕනේ. මේ විශ්වාසය අපි තුළ නැති තැනදී ඇති හැකි අයට, දක්ෂ අයට, ධනවත් අයට නිරතුරුවම සමාජය වෛර කරන්න, ද්වේෂ කරන්න පෙළඹෙනවා. පන්ති පරතරය නිසා සමාජය තුළ මොනතරම් ගැටුම්, යුද්ධ, මිනිස් ඝාතන සිදුවෙනවාද? ඇයි සමාජය මේ ගැටුම්කාරී තත්ත්වයට යන්නේ. සීලයේ, දනයේ ආනිශංස පිළිබඳව විශ්වාසයෙන් තොරව සමාජය දෙස බැලීම නිසා. සමාජයේ මනුෂ්‍යයෙක ලබන උතුම් කුසල් සංස්කාරයන්ගේ




ඵලයන්ට ඔබ ද්වේෂ කරනවා නම්, ඒ ඔබ ද්වේෂ කරන්නේ ධර්මයට බව හඳුනාගත යුතුව තිබෙනවා.

දනයේ, සීලයේ, ආනිශංස කෙරෙහි විශ්වාසය ඇති පින්වතා තව කෙනෙක් ලබන සැපයට අසාධාරණයක්ය කියලා සටන් කරන්න යන්නේ නැහැ. සමාජ අසාධාරණය කියන මිථ්‍යාව අතහැර සංස්කාරයන්ට අදාළව ලෝකය දකිනවා. බුදුදහම තුළින් පන්ති විරහිත සමාජයක්, කොමියුනිස්ට්වාදය, සමාජවාදය කියන කාරණාවන් ප්‍රතික්ෂේප වෙනවා. කෙනකුගේ ධනවත් භාවය, බලවත් භාවය, රූමත් භාවය, කුලවත් භාවය සංස්කාරයන්ගේ ඵලයක්ම මිස, හුදු දේශපාලන ධර්මතාවක් නොවන බව ධර්මය තුළින් මොනවට පැහැදිලි වෙනවා. දනයේ, සීලයේ ආනිශංස පක්ෂය විශ්වාස පින්වතා අනුන්ගේ සැපයට ගැටෙන්නේ නැතුව තමා දනය තුළ, සීලය තුළ ශක්තිමත් වී අනාගත සැපයට අදාළ ධර්මතාවන් රැස්කොට ගන්නවා. සිදුහත් කුමාරයා සශ්‍රීක රජසැප ලබන්නේ රම්‍ය, සුරම්‍ය, සුබ මාලිගා ලබන්නේ දඹදිව, ජීවත් වූ සැපයෙන් ආඪ්‍ය වූ කුමාරයෙක් ලෙස සැප සම්පත් ලැබුවේ පෙර දනයේත්, සීලයෙත් ඵලයක් නිසාම බව පින්වත් ඔබ තේරුම් ගත් තැනදී, විශාඛා සිටු දියණියට ලක්ෂ ගණනක් වටිනා ඇය පැළඳි මහාමේල පළඳනාව ලැබෙන්නේ පෙර දන්දීමේ ආනිශංසවල ඵලයක් හේතුවෙන් බව තේරුම් ගනිද්දී, අනුන්ගේ සැපයට වෛර නොකොට දනයේ,

සීලයේ ආනිශංසයන්ගේ උත්කෘෂ්ට භාවය දැකීම සම්මා දිට්ඨියේ උතුම් ලක්ෂණයක් වෙනවා.

■ අම්මා, තාත්තාගේ ගුණයන් කෙරෙහි විශ්වාසය

සම්මා දිට්ඨියේ තවත් ලක්ෂණයක් තමයි අම්මා, තාත්තාගේ ගුණයන් කෙරෙහි ඇති කොටගත් විශ්වාසය. මහා බ්‍රහ්මයා ලෝකය දෙස බලන මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා ගුණයන්ගෙන් අම්මා, තාත්තා පරිපූර්ණයි. ඒ උතුම් ගුණයන්ගෙන් උණු වෙන රත්වෙන රුධිර ධාතුව මව්කිරි බවට පත් කිරීමෙනුයි අම්මා ඔබව පෝෂණය කරන්නේ. මව් කුසක ඇතිවන කළල රූපය දස මසකින් දරු සිඟිත්තෙක් බවට පත්කරන්නේ. ඒ අම්මා, තාත්තා තුළ ඇති මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා ගුණයන් නිසාමයි. මහා බ්‍රහ්මයා ඔබ දෙස බලන මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා ගුණයන් තුළින් අම්මා, තාත්තා ඔබ දෙස බලනකොට ඔබ ඒ අම්මා, තාත්තා දෙස බැලිය යුත්තේ මහා බ්‍රහ්මයා දෙස බලන ගෞරවයෙන්මයි. එවැනි ගෞරවනීය සිතුවිල්ලක් තුළ පින්වත් ඔබට මතු භවයක ශක්‍රයා බවට පත්වීමට අවශ්‍ය කුසල් ධර්මයන් සැඟවී තිබෙනවා. ලක්ෂ ගණන් දරුවන් අම්මා, තාත්තාගේ රැකවරණය අහිමිව ළමා නිවාසවල තනිවෙද්දී, තවත් දරුවන් ළමා මෙහෙකාර කටයුතුවල නියැළෙද්දී, පින්වත් ඔබට රටක් වටිනා අම්මා, තාත්තා කෙනෙක් ලැබුණේ පින්වත් ඔබ පෙර ජීවිතයේදී අම්මා, තාත්තාගේ ගුණයන් හඳුනාගෙන අම්මා, තාත්තාට උපස්ථාන කරපු නිසාමයි. අම්මා, තාත්තාගේ සිනහවක, මුත්‍රා බිඳුවක, අසූචි පිඩක, කිළිටි ඇඳුමක



සැඟවී තිබෙන දිව්‍යමය සැපය මතුකොට දෙන්නේ උතුම් සම්මා දිට්ඨිය තුළින්මයි. දෙමාපියන් තුළ තිබෙන මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා ගුණයන්ට ලෝකයට බුදුරජාණන් වහන්සේ නමක්, රහතන් වහන්සේ නමක්, ශක්‍රයෙක් බිහි කිරීමට හැකියාව තිබෙනවා. මෙවන් උතුම් අම්මා, තාත්තාව ඔබ අනවබෝධයෙන් හඬවන්න එපා. කඳුළක්, දුකක් දෙන්න එපා. ඔබේ සතුට ඔබේ දෙමපියන්ගේ සතුට උදෙසා කැප කරන්න, ඒ දෙදෙනා සතුටින් ඉන්නවා දැකලා, පින්වත් ඔබ සතුටු වෙන්න.

කුකුළු ගොවිපොළවල බිත්තර දහස් ගණන් රක්කනවා. එම බිත්තර රක්වන්නේ උණුසුම් යන්ත්‍රවලින්. මේවායින් ලෝකයට බිහිවන බ්‍රොයිලර් කුකුල් පැටවුන්ට අම්මා කෙනෙක්ගේ ආදරයත්, උණුසුමත්, රැකවරණයත් ලැබෙන්නේ නැහැ. මෙය මේ සතුන් ලබන අකුසල් විපාකයක්. සංසාරයේ අම්මාට, තාත්තාට සැලකුවේ නැහැ, දෙමාපියන්ගේ ගුණයන් හඳුනාගෙන ඒවාට කෘතගුණ සැලකුවේ නැහැ, දෙමාපියන් නැති දරුවන් වශයෙන් ලෝකයට බිහිවෙනවා. තලගොයෙක්, කිඹුලෙක් ගන්නකෝ. පූසෙක් ගන්නකෝ. තමාගේම කුසෙන් බිහිවන පැටවා මරාගෙන කනවා. මෙම සත්ව අම්මලා කියන්නේ පෙර මනුෂ්‍ය ජීවිතවල බිඳ වැටුණු මව්පිය, දූ දරු සම්බන්ධතාවේ ප්‍රතිඵලයන්. අම්මා, තාත්තාගේ කඳුළක සැඟවී ඇති දුගතියත්, අම්මා තාත්තාගේ සිනහවක සැඟවී ඇති සුගතියත්, පින්වත් ඔබට මතුකොට දෙන්නේ සම්මා දිට්ඨිය තුළින්මය. එය සම්මා දිට්ඨියේ උතුම්ම ලක්ෂණයන් වෙනවා.

■ ඕපපාතිකව සත්වයන් උපදිනවාය කියන විශ්වාසය

සම්මා දිට්ඨියේ තවත් ලක්ෂණයක් තමයි ඕපපාතිකව සත්වයන් උපදිනවාය කියන විශ්වාසය. ප්‍රේතයා, දෙවියා, බ්‍රහ්මයා, යක්ෂයා, අසුරයා, තිරිසන්, ප්‍රේත තිරිසන් සතුන් උපත ලබන්නේ ඕපපාතිකව, නවීන විද්‍යාව පැත්තට බර දීලා. ධර්මය ගැන සිතන පින්වතුන් ඕපපාතිකව සත්වයන් උපදිනවාය කියලා විශ්වාස කරන්න මැලි බවක් දක්වනවා. පින්වත් ඔබට ඕපපාතිකව සත්වයන් උපදිනවාය කියලා විශ්වාසයක් නැතිනම් ප්‍රේත ලෝකයක්, නිරයක් ගැන විශ්වාසයක් ඔබට නැතුව යනවා. එම නිසාම ඔබ තුළින් අකුසලයට ඇති බිය නැතිවී යනවා. ඒ වගේමයි දෙවියන්, බ්‍රහ්මයන් සිටිනවාය කියන විශ්වාසය හීනවීම නිසාම ඔබ කුසලයට ඇති කැමැත්ත හීන කරගන්නවා. ඕපපාතිකව උපදින සත්වයකුගේ ප්‍රතිසන්ධිය පින්වත් ඔබට දැකීමට නම් අනිවාර්යයෙන්ම ඔබ සමාධිය ප්‍රගුණ කළ යුතු වෙනවා. සමාධිය තුළින් ඔබ සකස් කොට ගන්නා වූ චුතුපපාත ඥානය ඕපපාතිකව සත්වයන් උපදිනවාය කියන විශ්වාසය ඔබ තුළ ඇති කොට දෙනවා. පින්වත් ඔබ තවමත් මේ ඥානයන් නොලැබූ නිසාමයි සංසාර බිය තවමත් නොදකින්නේ. සම්මා දිට්ඨියේ පරිපූර්ණභාවය ඇතිකර නොගන්නේ.

භික්ෂුවක් උතුම් සමාධියෙන් පසුවන කොට එම භික්ෂුවට අරමුණු වෙනවා ඕපපාතිකව යක්ෂයෙක් උපදිනවා, පැරණි ආරණ්‍ය භූමියක කළු ගල් කුටියක වැඩ සිටින අවස්ථාවකයි භික්ෂුවට මෙම සිද්ධිය සමාධිය තුළින් දර්ශනය වෙන්නේ. භික්ෂුවට මීටර් 20 ක් පමණ ඈතින් අඩි හයක් පමණ උසින් එක් ක්ෂණයකින්ම වේගවත් සුළියක් පහළ වෙනවා. භික්ෂුව උතුම් සමාධිය තුළිනුයි මේ වේගවත් සුළිය දකින්නේ. මේ සුළිය ඉතාමත් අධි වේගයෙන් භ්‍රමණය වෙලා, භ්‍රමණය වෙලා යක්ෂයාගේ රූපය නිර්මාණය වෙනවා. ඒ කියන්නේ යක්ෂයා ඕපපාතිකව උපත ලබනවා. පෙර ජීවිතයෙන් සංඛාරා පච්චයා විඤ්ඤාණං කියන ධර්මතාව යටතේ සකස් වුණ චුතිසිත, අනිත්‍ය භාවයට පත්වීම හේතුවෙන් සකස් වුණ ප්‍රතිසන්ධි චිත්තයයි. ''විඤ්ඤාණය'' මේ වේගවත් සුළිය හැටියට භික්ෂුවට අරමුණු වෙලා තිබෙන්නේ. එම භික්ෂුව එතැනදී දකින්නේ විඤ්ඤාණයේ වේගවත් භාවය විසින්ම ඕපපාතිකව සත්වයා උපත ලබන බවයි. මෙන්න මේ ඕපපාතික සත්වයන් උපදිනවාය කියන විශ්වාසය සම්මා දිට්ඨියේ උතුම් ලක්ෂණයක් වෙනවා.

■ අතීතයේ අධිගමලාභී උත්තමයින් වැඩ සිටියාය කියන විශ්වාසය


සම්මා දිට්ඨියේ උතුම් ලක්ෂණයක් තමයි, අතීතයේ සෝවාන්, සකෘදගාමී, අනාගාමී, අරහත් උත්තමයන් සිටියාය කියන විශ්වාසය. ධර්මය සංදිට්ඨිකව තිබෙන තාක් කල් මේ උතුම් අධිගමයන් සාක්ෂාත් කරගැනීමට හැකිය කියන විශ්වාස සම්මා දිට්ඨියේ ලක්ෂණයක් වෙනවා. යම් පින්වතෙක් තුළ අතීතයේ අධිගමලාභීන් නොසිටියාය කියලා දැකමක් ඇතිවුණොත් එම දූර්මතය නිසාම ඔහුට මාර්ගඵල ලාභියෙක් වීමට අවශ්‍ය සාධක, වීර්යය නැතිකොට ගන්නවා. නිවන් මාර්ගය කෙරෙහි විශ්වාසයෙන් බැහැර වී නව මාර්ගයටයි ඔහු වැටෙන්නේ. මේ දූර්මතය නිසාම ඔහුට තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකොට ගැනීමේ කාර්යය අඩපණ වෙලා යනවා. සංසරත්නයේ උතුම් ගුණයන්, ඥානයන් කෙරෙහි විශ්වාසය හීනවීම නිසාම කුසල් පක්ෂය වඩවා ගැනීමේ කාරණයේදී බලවත් පසුබෑමකට ඔහු ලක්වෙනවා. ඒ වගේමයි උතුම් සද්ධර්මය සංදිට්ඨිකව තිබෙන මොහොතක අවංකවම උතුම් රහත් ඵලයට පත්වූ ස්වාමීන් වහන්සේ නමක් මුණගැසුණද උන්වහන්සේලා කෙරෙහි සැක ඇති කොටගෙන බරපතළ වූ අකුසලයන් කරා ගමන් කරනවා. එමනිසා අතීතයේ අධිගමලාභීන් සිටියාය කියලා ඇතිකොට ගන්නා වූ විශ්වාසය සම්මාදිට්ඨියේ උතුම් ලක්ෂණයක් වෙනවා.

පින්වත් ඔබ යොමු කරපු ප්‍රශ්නය තමයි සම්මාදිට්ඨියේ ලක්ෂණ මොනවා ද කියලා. ඊට අදාළ කාරණා හතක් ඉහතින් සඳහන් කරලා තිබෙනවා. මෙම කාරණා ශාසනයේ දෙරටුව හැටියට දකිමින් ඔබේ ජීවිතයට එකතු කොට ගන්න දක්ෂ වෙන්න. මේ උතුම් සම්මාදිට්ඨිය ඇතිකොට ගත් තැනැත්තායි ආර්ය අෂ්ටාංගික මාර්ගයට අවතීරණ වෙන්නේ.

**දීපිකා බමුණුආරච්චි**

කුම්භකාර ජාතකයෙන් හෙළි වන

# තිලකුණු මෙනෙහි කොට කුසල් වැඩීමේ අනුහස්



අසමසම වූ අජරාමර වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සමයෙහි ක්ලේශ විෂ්කම්භයක් අරභයා මෙම ජාතක කතාව දේශනා කොට වදාළ සේක.

එක්තරා කෙළෙඹි පුත්‍රයෝ පන්සියයක් දෙනා මහණව ජේතවනාරාමයෙහි වැඩ වාසය කළහ. ඒ පන්සිය දෙනා වහන්සේම එක් දවසෙක රෑ රාග චිත්තය උපදවා, කෙලෙස් වසඟ වූ කල්හි, සර්වඥයන් වහන්සේ අලුයම් කාලයෙහි මාගේ භික්ෂූන් කවර ආකාරයෙන් වාසය කෙරෙත්දෝයි කරුණා සමාපත්තියෙන් නැගී ලොව දෙස බලත්ම, මේ පන්සියයක් භික්ෂූන් වහන්සේ රාග චිත්තය උපදවා, ක්ලේශ වසඟ වූ නියාව දැක ඒ භික්ෂූන් පන්සියයම තනි තනිව කැඳවා විමසුව හොත් බිය වී ධර්මය ගැන නොසිතතැයි සිතා, ආනන්ද ස්ථවිරයන් වහන්සේ කැඳවා ඒ භික්ෂූන් එක් රැස් කරන්නැයි වදාළ සේක.

ආනන්ද තෙරුන් වහන්සේ ජේතවනාරාමයෙහි වාසය කරන්නා වූ භික්ෂූන් වහන්සේම දම්සභා මණ්ඩපයට කැඳවූහ. අනතුරුව සර්වඥයන් වහන්සේත් වැඩමවා, මහණෙනි, යම් සේ ක්ලේශ වසඟයෙන් රාග චිත්තයෙක් උපන්නේ වී නම් එය දළු ලෑමට ඉඩ නොතබා නැසිය යුතුය. පෙර උත්තමයෝ යම් අරමුණක් දැක ක්ලේශයන් නසා ලූහ යනුවෙන් වදාරා සර්වඥයන් වහන්සේ එහි ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්වයෝ නුදුරු ගමෙක දූප්පත් කුඹල් ගෙයක ඉපිද වැඩිවිය පැමිණ බිරිඳ සමඟ දෙදෙන බැලමෙහෙ කොට වාසය කරන්නාහ. එකල කළිඟු රට දන්ත නුවර කරණ්ඩක නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කාලයෙහි ඒ රජු එක් දවසක් මංගල උයනට යද්දී උයන් දොරකඩ පලාගෙන නැගුණු අඹ ගසෙක ඉදුණු

"වැඩිහිටියන්ට අකීකරු වීම විපතට හේතුවේ - ඉන්ද්‍රගුත්ත ජාතකය"

අඹ දැක, ඉන් අඹ ගෙඩියක් කා ගියේය. පස්සේ එන්නා වූ ඇමතියන් හා සේනාව එහි අඹ, කැට මුගුරු ගසා කඩා අඹ ගසට බොහෝ විනාශයක් කළාහ. රජ්ජුරුවෝ යළි රජගෙට යන අතර, විනාශ වූ අඹ ගස දැක, සම්පත් ඇත්තවුන්ට අත් වන්නා වූ අනර්ථය මේ අඹ ගසට මෙනි. නිරපේක්ෂකව වාසය කරන්නා වූ තාපසයින්ට කිසි බයක්වත්, සිතට දුකක්වත් නැත. සියල්ලම අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යැයි තිලකුණු භාවනා කොට එම අඹ ගස මුල සිට සියලු කෙලෙසුන් නසා පසේ බුදු වූ සේක. පසේ බුදු වූ විට නැවත උත්පත්තියක් ලබන්නේ නැත. රජුත් බොහේ දුකෙන් මිදෙනු සඳහා තිලකුණු භාවනා කොට වැඩසිටි සේක. එවිට බොහෝ අමාත්‍යයෝ, ඇයි ස්වාමීනි, රජගෙට වැඩිය මැනව, මෙතන වැඩ සිටින්නේ ඇයිදැයි විමසූහ. එවිට රජු, මම පසේ බුදු වුනෙමි. මට රජ්ජුරුවන් යැයි නොකියන්නැයි කීහ. එවිට ඇමතිවරු පසේ බුදුවරයන් වහන්සේ නමක් නම් තුන් සිවුරු පාත්‍රාධරව, ඉස මුඩු කළ යුතු නොවේදැයි පැවසීය. එවිට ඉස පිරිමැදලූ විට, හිසකෙස් සතරඟුල් පමණ වී, තුන් සිවුරු පාත්‍රධරව අහසට නැගී නන්‍දමූල පබ්බාරයට වැඩි සේක.

එකල ගන්‍ධාර රට තක්සලා නුවර නග්ගා නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි, ඒ රජු එක දවසෙක සඳැල්ලේ අමාත්‍යවරයන් පිරිවරා උන්නාහ. වීදියෙහි කුඩා කෙල්ලෙක් වැලි බත් උයන්නී, තමන් අත තිබූ රුවන් වළලු දෙක අතලූ හෙයින් ශබ්ද නැගෙන්ට විය. රජ්ජුරුවෝත්, නිවීම යහපත. සම්පත් නම් මිනිස්සුන්ට විනා සසර සහයට සිටින්නේ නොවෙයි. එසේ හෙයින් තනිව වාසය කරන්නා වූ තපස්වී වරයන් වහන්සේට කිසි බයක් නැත. එය අරමුණු කොට තිලකුණු භාවනා මෙනෙහි කොට සියලු කෙලෙසුන් නසා පසේ බුදු වූ සේක. අමාත්‍යවරුනුත්, ඇයි දේවයන් වහන්ස, කථා නොකර සිටින්නේ ඇයි දැයි ඇසූහ. එවිට රජු, අමාත්‍යයනි, මට දේවයනියි නොකියව මැන. මම පසේ බුදු වුනෙමියි කීහ. එවිට ඇමතියෝ පසේ බුදුන් නම් අටපිරිකර දරා සිටිය යුතු නොවේදැයි කීහ. එසේය කියා, ඍද්ධියෙන් ආකාශයට නැගී ගන්‍ධමාදන පර්වතයට වැඩි සේක.

තවද මියුළු නුවර වේදේහ රට නිමි නම් රජු කෙනෙකුන් රාජ්‍යය කරන කල, එක් දවසක් මතු මහල් තලයෙහි ඉන්නා විට, අඟානියේ කෙල්ලක් දඩමස් විකුණන්නීය. ඉන් එක් දඩමස් කැටියක් උකුස්සෙක් ඩැහැගත්තේය. තවත් උකුස්සෙක් ඒ උකුස්සාගේ ඔලුවට ඇන මස් කැටිය උදුරා ගන්නා ලදී. ඔහු අතිනුත් තවත් උකුස්සෙක් උදුරා ගත්තේය. මස් කැටිය අරගත් උකුස්සාට ගහටක් නැත. මේ පංචකාම ඇල්මත්, මේ උකුස්සා මෙනි. ඇල්ම නැති තැනැත්තා මස් කැටිය ඇරපු උකුස්සා මෙනි. මෙය අරමුණු කොට ගෙන තිලකුණු මෙනෙහි කර, විදර්ශනා භාවනා කොට පසේ බුදු වූ සේක. අමාත්‍යයෝ, ස්වාමීනි, බැණ නොනැගී සිටින්නේ ඇයිදැයි ඇසූ කල්හි, රජතුමා, මම පසේ බුදු වුනෙමි. පසේ බුදු වූයේ නම් මෙසේ ඉඳින්නේ ඇයි දැයි විමසූ කල්හි, අට පිරිකරධරව සිටින්නට උවමනා යැයි කී කල්හි, හිස පිරිමැදලූ සේක. අටපිරිකරධරව අමාත්‍ය මණ්ඩලයට හා රාජ්‍ය වාසීන්ට අවවාද කියා නන්‍දමූල පබ්බාරයට වැඩි සේක.

තවද පංචාල රට උත්තර පංචාල නුවර දුර්මුඛ නම් රජ කෙනෙකුන් රාජ්‍යය කරන්නාහ. මතු මහල් තලයෙහි ඉන්නා විට වීදියේ එක් වෘෂභයෙක් දෙනකට නැගෙන්ට වන. අනෙක් මොල්ලිය මත් වෘෂභයෙකු දිවගෙන අවුත් ඒ ගොනාට ඇන බඩ පලා ඒ දෙනට නැංගේය. රජ්ජුරුවෝත් පංචකාමයෙහි ලෝභ කිරීමෙන් ඒ ගොනා මරණයට පැමිණියාක් මෙන් මරණයට පැමිණෙන්නේ යැයි සිතා, අනිත්‍ය, දුක්ඛ, අනාත්ම තිලකුණු භාවනා කොට විදර්ශනා වඩා පසේ බුදු වූ සේක. එවිට අමාත්‍යයෝ, ස්වාමිනී, බැණ නොදී හිඳින්නේ ඇයිදැයි විමසූහ. රජු මම පසේ බුදු වුනෙමියි කී සේක. එසේ බුදු වූ කල මෙලෙස හිඳින්නේ දැයි අටපිරිකර දරා හුන මැනවැයි කීහ. එවිට ඉස පිරිමැදි කල අටපිරිකරධරව පාත්‍රයක් අතින් ගෙන රාජ්‍ය වාසීන්ට අවවාද කියා නන්‍දමූල පබ්බාරයට වැඩි සේක.

මෙසේ පසේ බුදුන් සතරදෙනා වහන්සේම නන්‍දමූල පබ්බාරයෙන් නික්ම, පසල් ගමකට බැස, සිවුර ගැටවටුගන්වා බෝධිසත්වයන් හිඳින්නා වූ ගෙට සිඟා වැඩි සේක. බෝධිසත්වයන් වහන්සේ පසේ බුදුවරුන් වැඩ සිටුවා, දන් වළඳවා, ස්වාමීනි, ඔබ වහන්සේලා සතර දෙනාගේ ඉරියව් දැක සමාධි වීමි. ඔබ වහන්සේලා කවර අරමුණක් දැක පසේ බුදු වූයේ දැයි විචාළ සේක. එවිට වැඩිමහල් බුදුන් වහන්සේ, මම ඵල ගෙන සිටි අඹ ගසකට වූ හානියත්, ඵලදා නොවූ ගසකට නොවූ හානියත් දැක, අර්ථය ඇති තැනැත්තවුන්ට හට වන්නා වූ අනර්ථයන් මේ අඹ ගසට වූ හානිය මෙනැයි අරමුණු කොට පසේ බුදු වීමියි වදාළ සේක. දෙවෙනි බුදුන් වහන්සේ, කුඩා කෙල්ලක අත තනිව තිබූ වළල්ල නොහඬන නියාවත්, වළලු දෙක එක්ව තිබූ විට අඬන නියාවත් දැක බොහෝ දෙනා හා වාසය කිරීමෙන් ගැටීමෙන් සිතට වන්නා වූ ගහට මේ වළලු දෙක මෙනැයි අරමුණු කොට පසේ බුදු වීමියි වදාළ සේක. තුන්වන පසේ බුදුන් වහන්සේ, එක් උකුස්සෙක් මස් කැටියක් ඩැහැගෙන ආකාශයට නැංගේය. අනෙක් උකුස්සෙක් ඌ පොළොවේ ඇන ඒ මස් කැටිය අරගෙන ගියේය. පංචකාමයේ ආලය ඇලුවා වූ සත්වයා නම් මස් කැටියේ ආලය අරපු උකුස්සා මෙනි. පංච කාමයේ ඇල්ම කළා වූ සත්වයා නම් මස් කැටිය ඩැහැගෙන යන උකුස්සා මෙනැයි මෙය අරමුණක් කොට පසේ බුදු වීමැයි වදාළ සේක. සතරවෙනි පසේ බුදුරජාණන් වහන්සේ වදාරණ සේක්, එක් ගොනෙක් දෙනකට නැගෙන්ට උත්සාහ කෙරෙත්, ඉවත සිටි අනෙක් ගොනෙක් දිවගෙන අවුත් ඒ ගොනා අගින් ඇන බඩ පළා මරා, තෙමේ ඒ දෙනට නැංගේය. පංචකාමයේ ඇලුම් කළා වූ යම් සත්වයෙක් මේ ගොනා මෙන් විනාශයට පැමිණෙන්නේය යන්න අරමුණු කොට පසේ බුදු වීමියි වදාළ සේක.

බෝධිසත්වයෝත් මේ නියාව අසා උන්වහන්සේලා සතරදෙනා කෙරෙහි උපස්ථාන කෙරෙමින් වාසය කළහ. පසේ බුදුන් වහන්සේත් බෝධිසත්වයන් වහන්සේට බණ වදාරා නන්‍දමූල පබ්බාරයට වැඩි සේක. බෝසතාණන් වහන්සේත් මම වනයට ගොස් මහණ වෙමියි තමන් වහන්සේගේ බිරිඳට කියන සේක්, භද්‍රාවෙනි, කළිඟු රට දන්තපුර නුවර කරණ්ඩික රජ්ජුරුවෝ ද, ගන්‍ධාර රට හා කාෂ්මීර රට නායක තක්සලා නුවර නග්ගාරි රජු ද, වේදේහ



රට මියුලු නුවර නිමි රජු ද, පංචාල රට උත්තර පංචාල නුවර දුර්මුඛ නම් රජ්ජුරුවෝ ද යන මේ සතර දෙනාම තම තමාගේ මහත් රාජ ඓශ්චර්යය ඇර පසේ බුදුවරු වූහ. ඒ තරම් මහා සම්පත් ඇති රජදරුවන් පවා පසේ බුදු වූහ. අපට කන්ට බත් නැතිව, අඳින්ට පිළි නැතිව, දුක්ඛ ජීවිකාවෙන් දවස් අරින්නෙමු. අපට මේ ගිහි ගෙයින් ප්‍රයෝජන කිම්දැයි පවසා, භද්‍රාවෙනි, මම වනයට වදිමියි කීවේය. එවිට ඇය, භග්ගව ගෝත්‍රයෙහි උපන්නා වූ කුම්භකාරයන් වහන්ස, සිතූ දෙය යහපති, ඊට බාධා නැතැයි කියා සිතන්නා වූ මුන්වහන්සේ දරුවන් මා ඇඟට දමා තමන් වහන්සේ මහණව ගිය සේක් නම් දරුවන් පෝෂ්‍ය කරන්නට මට බැරිය. මහණ වීම නම් සිතූ සිත හා සමඟ පසුව බොහෝ සිතුවිලි සිතුයේ නම් කාරණා නොවේ. මුන්වහන්සේ අතින් අවසර ඉල්ලා ගෙන පියෙක් නම් යා නොදෙන සේකැයි කළය ගෙන පැනට යන්නාක් මෙන් ගොස් තාපසවරුන් වසන්නා වූ පන්සලට වැද, පරිබ්‍රාජිකා වූවාය.

බෝධිසත්වයන් වහන්සේත් දරුවන් හැරපියා යා නොහී මුන් වර්ධනය කරමියි සිතා මදක් වැඩුණු පසු මගේ දරුවන් කටයුතු දන්නේ දැයි පරීක්ෂා කිරීමට දවසක් සාල් කරන සේක. එක් දහසක්ව යහපත්ව පිසිණ සේක. තව දවසක් මාලුවේ ලුණු මද කරන සේක. ඇඹුල් මද කරන සේක. දරුවෝ දෙදෙනෙක් ඇයි පියාණන් වහන්ස, අද මාලුවේ ලුණු මද කළ සේක්ද? ඇඹුල් මද කර සේක්ද? කියන්නාහ. බෝධිසත්වයෝත් මගේ දරුවෝ කටයුතු දැනගත්තායැයි කියා, දරුවන් නෑයන්ට භාර දී තපස් ආරාමයට ගොස් පන්සලෙහි මහණ වූ සේක. තාපසයන් වහන්සේත්, පරිබ්‍රාජිකා වහන්සේත් සිඟා වැඩි ගමනේ දී දෙදෙනා ඔවුනොවුන් දැක මගේ දරුවන් මරා පියා මහණ වූ සේක්ද? නැතහොත් දමා පියා විත් මහණ වූ සේක්ද? විචාළ සේක. මැරුවේත් නැත, දැමුවේත් නැත. උන්ගේ නෑයන් අතට පාවා දී මහණ වීමියි කීවේය. එදා පටන් මියෙන තුරු දෙදෙනා ඔවුනොවුන් නොදැක කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියහ. මෙසේ වදාරා මෙම කුම්භකාර ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි බෝධිසත්වයන්ගේ කුඩා දියණියෝ නම් උපුල්වන් මහාස්ථවිරීය, පුතණුවෝ නම් රාහුල මහස්ථවිරයෝය, පරිබ්‍රාජිකාව නම් යශෝධරා ස්ථවිරීය, කුම්භකාරව උපන්නේ නම් බුදු වූ මම ම යැයි දේශනා කොට මෙම ජාතක කථාව අවසන් කොට වදාළ සේක. කුම්භකාර ජාතකයෙන් හෙළි වන පරිදි අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන තිලකුණු මෙනෙහි කොට විදසුන් වඩා නිවන් පුර සාක්ෂාත් කර ගැනීමට අපිදු උත්සාහවත් වෙමු.

**කේ. මීගහකුඹුර**


"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස එන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට ඔහු බේරාගත නොහැක."

# සදහම් ප්‍රහේලිකා අංක - 101

**ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773**

## උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ලිපිනය - සදහම් ප්‍රහේළිකාව (101), 112, දයාවංශ ජයකොඩි පොත් සමාගම, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදාන.
3. පිළිතුරු පත් භාරගන්නා අවසාන දිනය දෙසැම්බර් 5 දය.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේළිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.




### ◀ හරහට

1. අති ශ්‍රද්ධා ඇති තෙරණියන් අතුරින් අග තැන්පත් මාතා තෙරණිය.
3. පංචඉන්ද්‍රියට අයත්ය.
5. සිදුහත් කුමරුට නම් තැබූ බමුණන් අටදෙනාගෙන් කෙනෙකි.
8. මෙය අසාර වස්තුවක් ලෙසට බුදු දහමේ ඉගැන්වේ.
11. මෙය රන්වලට සමාන කෙරේ.
12. උතුරු දුම්රිය මාර්ගයේදී හමුවන දුම්රිය පොළකි.

### ▼ පහළට

2. මෙය අත්හල යුතු දෙයක් ලෙසට බුදු දහමේ සඳහන් වේ.
4. දනය දීමෙන් ලැබෙන ආනිශංසවලින් එකකි.
6. බිසව යන අරුත දක්වන වචනයකි.
7. ප්‍රථම ධර්මදූත පිරිස ධර්ම ප්‍රචාරය සඳහා ගමන ආරම්භ කළ පොහොය.
8. කල්පය යන වචනයට සමාන පදයකි.
9. උච්ඡේදවාදය මුල් කොට ඇතිවන තෘෂ්ණාව.
11. එකල පැරණි වැසියෝ සඳමඬලේ මේවා ඇති බවට විශ්වාස කළහ.

### ප්‍රහේළිකා අංක 99 ජයග්‍රාහී වාසනාවන්තයින්ගේ නම්

- එච්. ඒ. එස්. රාජපක්ෂ, දංගොල්ලවත්ත, දෙරටියාව.
- ටී. ඒ. සුගතවංශ, ගංගොඩ, මාතෙලවල, රඹුක්කන.
- පී. එස්. විජේනායක, 29/261 එෆ්, අම්පිටිය පාර, මහනුවර.

*යථා කාලයේදී ඔබගේ තිළිණ දයාවංශ ජයකොඩි පොත් සමාගමෙන් එවනවා ඇති.*

# ඔබත් දළදා වරුණට ලියන්න

**දළදා** වරුණ සැම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන පුවත් සඟරාවකි. වසර දොළහකට ආසන්න කාලයක් තිස්සේ "දළදා වරුණ" සමඟින් ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර ගිහි පැවිදි ඕනෑම අයෙකු අප වෙත ලබා දෙන කාලීන හරවත් සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ පුවත්පතේ පළවන සියලුම ලිපි, රචනා ඒ.ඒ. කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමි. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සැම ලිපියක්ම බෞද්ධ තේමාවක් ඔස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

- අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

# දළදා මාලිගයෙන් පණිවුඩයක්

- **මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න**

1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට සෝභාවකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම් උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපිරිසම) පලාපු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඳ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට චාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොහොබින බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටිනා මතු පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.

"නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්, ඔහු රහත් ඵලයෙන් ඈත්ය."



# ගිරිමානන්ද සූත්‍රය

## නිතර ඇසීමෙන් නිරෝගී සුව ලබා ගනිමු

'අථඛො ආයස්මතො ගිරිමානන්දස්ස ඉමා සඤ්ඤා සුත්වා සො ආබාධො ඨානසො පටිප්පස්සම්භි වුට්ඨාහිචායස්මා ගිරිමානන්දෝ තම්හා ආබාධා තථා පහීනොච පනායස්මතො ගිරිමානන්දස්ස සො ආබාධො අහෝසීති.'

සිරි සුගත තථාගත අප සම්මාසම්බුදු රජාණන් වහන්සේ අනන්ත අප්‍රමාණ සත්වයන්ට ශාරීරික, මානසික දුක් වේදනා එකසේ නැතිකර ගැනීමට හේතුභූත වන්නා වූ අතිශ්‍රේෂ්ඨ ධර්මයක් දේශනා කළ සේක. එම දේශනා අතර ''ගිරිමානන්ද සූත්‍රය'' මානසික පරිවර්තනයකින් ශාරීරික වේදනා නැතිකර ගැනීමට, වේදනා අරමුණු කරගෙන රාගාදී කෙලෙස් ගිනි නිවා ගැනීමට, එමෙන්ම විමුක්ති සුවයෙන් සදා සැනසීමටද මහෝපකාරී වන්නේය.

සත්වයාගේ රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන පංචස්කන්ධයම එක්ව පවතින අතර මෙම ස්කන්ධ පහ ක්‍රියාකාරී ලක්ෂණ වශයෙන් එකිනෙකට වෙනස් වන්නේය. ගිරිමානන්ද සූත්‍රයෙන් දක්වා ඇත්තේ පංචේන්ද්‍රියන්වලින් රූපාදී අරමුණු තම තමන්ගේ බුද්ධි සීමාව තුළ ගැනීම නොව පංච උපාදානස්කන්ධ අනිත්‍යාදී වශයෙන් හඳුනා ගැනීමේ ප්‍රඥාමය උපාය වශයෙන් නිර්වාණගාමී පිළිවෙතට අවතීර්ණ වීමයි. තාවකාලික අවශ්‍යතා අනුව අන්ධ බාලයන් ඇතා හඳුනා ගන්නා සේ සැප සම්පත් අපේක්ෂාවෙන් ආවේණික හැඟීමෙන් ලෝකය හඳුනා ගන්නා විට නාම රූප ධර්මයන්ගේ විපරිණාමයන් නිසා ඉතා තියුණු ලෙස දුක් වේදනාවන්ට භාජනය වේ.

සත්වයකු උපන් දා පටන් ලෝකය හඳුනා ගන්නේ පාරම්පරික සම්මත අනුව බැවින් ලෙඩ රෝග, අතුරු ආන්තරා, අපල උපද්‍රව, අබල දුබලතා නිතර නිතර ඇති වන්නේය. එය මිරිඟුව ඔස්සේ දුව යන මුවා මෙන් ක්ෂණයක් පාසා සිදුවන උප්පාද, ඨිති, භංග යන ප්‍රවණතාවයේ තෙරපෙන නාම රූපයන්ට සත්ව පුද්ගල ලක්ෂණ, ස්වරූප ආරෝපණය කිරීමෙන් යම් වින්දනයක් ලබන්නේ නම් එය දුක් වේදනාවක්ම වන්නේය.

නාම රූප ධර්මයන්ගේ ඇතිවීම හෙවත් උත්පාද ව්‍යය හෙවත් විනාශය ඨිති හෙවත් පැවැත්ම පිළිබඳව ඇතිවන ඉතා සියුම් කාලපරිච්ඡේදය සාමාන්‍ය බුද්ධියකින් හඳුනා ගැනීමට නොහැක. රූපාදී අරමුණු හඳුනා ගන්නේ මතු අපේක්ෂාවන් ඇති කරගෙන නිසා එයින් ඇතිවන කාමාදී උපාදානවලටද, අනතුරුව පැමිණෙන පීඩනයන්ටද මුහුණ දිය යුතු වන්නේය. එය අහක දාන ජරා ගොඩක්

''යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇළුණේද ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදම සුවසේ නිදා පුබුදිත්.''

නොදක එමෙන්ම නොදනීමෙන් බදා ගත්තාක් මෙනි. පුහුදුන් සත්වයාගේ මානසික රෝගයක් වශයෙන් ආත්ම සංඥාවද අකුසල චේතනා රාශියකට හේතුභූත වන්නේය. තවද පංචේන්ද්‍රිය ආශ්‍රිතව විවිධ රෝගාබාධ ඇතිවන බැවින් අප බුදුරජාණන් වහන්සේ ඇස්, කන්, නාසාදී ආයතන අනාත්ම වශයෙන් හැඳින ගත යුතු බව හඳුන්වා දුන් සේක.

ශරීරය පිළිබඳව යථාර්ථයෙන් නොදනීම නිසා හෝ දන දන අන්තවාදී දෘෂ්ටිය නිසා හෝ බාහිර වශයෙන් විවිධාකාර පිළියම් කිරීම හා පෝෂණය මණ්ඩන කරන බැවින් එහි ඇති විපරිණාම ධර්මයන්ගෙන් පීඩාවට පත් වන්නේය. මේ නිසා අශුභ සඤ්ඤාව මානසික පරිවර්තනයකට හේතුවක් ලෙස භාවනාමය කුසල චේතනාවක් ලෙස එමෙන්ම නිරෝගී සම්පතක් ලෙස ඵලදායක වන්නේය.

නව දොරකින් ජරාව පිටවන පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා භූතයන්ගෙන් පාලනය වන ශරීරය උපන් දා සිට හෙවත් උපන් මොහොතේ සිට මරණාන්තය දක්වා විවිධ රෝග යන්ට භාජනය වන අතර එහෙත් එකම සුඛදායී වින්දනය නම් බුද්ධියෙන් දනගෙන සඤ්ඤාව වෙනස් කිරීමයි.

අප්‍රිය වශයෙන් බැහැර කරන සියලු අපද්‍රව්‍ය ශරීරයේ පුරවාගෙන තණ්හා, දිට්ඨි, මාන වශයෙන් තමා විසින් තමා සුවිශේෂ කරගැනීම නිසා කාමවිතර්ක, ව්‍යාපාද විතර්ක, විහිංසා විතර්කාදී පාපී අකුසල් ක්‍රියාත්මක වන්නේය. එම අකුසල ධර්ම නොඉවසීම, බැහැර කිරීම, යළි නූපදින තත්ත්වයට බැහැර කරගන්නේද එම ප්‍රහාණ සංඥාව මානසික සඤ්ඤා පරිවර්තනයක් වන අතර එයින් රෝග, පීඩා, වේදනා නැතිවන්නේය.

සියලු සංස්කාරයන්ගේ සංසිඳීමද, සියලු උපධීන්ගේ අත්හැරීම මෙන්ම විරාගයද උභයාර්ථ සංසිද්ධියට හේතු වන්නේය. සබ්බලෝක අනභිරත සඤ්ඤාවත්, සබ්බ සංඛාර අනිත්‍ය සඤ්ඤාවත්, චෛතසික පිළිබඳ පරිවර්තන අවස්ථා දෙකකි.

පව් හෝ පින් සිතුවිලි ඇතිවන්නේ ඉඳුරන් අරමුණුවලට ආරෝපණය කිරීමේදී ක්‍රියාත්මක වන චිත්තවීථි අනුවය. චිත්ත වීථියක ජවන අවස්ථාවට පැමිණෙන්නේ සිතුවිල්ලක් ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් වශයෙනි. එබැවින් සිහි බුද්ධියෙන් අරමුණ ජවනය දක්වා පැවැතීමට ඉඩ නොදී අරමුණ සිතින් බැහැර කිරීමට සමර්ථ වීම ප්‍රහාණ සඤ්ඤාව නම් වන්නේය.

සියලු සංස්කාර ධර්මයන් නිරුද්ධ වීම කාමාදී උපධීන් බැහැර කිරීමද ඉතා සියුම් සිහි කල්පනාවෙන් කළයුතු කාර්යයක් වන අතර විරාග සඤ්ඤා හා නිරෝග සඤ්ඤා යන දෙකටම එය දොරටුවක් වන්නේය.'

චිත්ත සන්තානය තුළ ඇතිවන තණ්හා දිට්ඨි උපාදාන ආදී සාවද්‍ය දකීම්, හැඟීම් සියල්ලම ස්කන්ධ ධර්ම අරමුණු කරගෙන ඉපදී තුන් දොරින් ප්‍රසාරණය වී කුසල්, අකුසල් වශයෙන් එය ක්‍රියාත්මක වන්නාට විපාක වශයෙන් පැමිණෙන්නේය. ධර්මානුකූලව භාවනාදියෙන් සිත දියුණු නොකළ තැනැත්තා ශාස්වත උච්ඡේදාදී දෘෂ්ටි හා සත් වැදෑරුම් අනුසය කෙලෙස් ඇතිව තවදුරටත් ඒවා සියුම් ලෙස රැඳී පවතින්නේ නම් මානසිකව සන්තාපයට පත් වන්නේය. ආයති භාවයට හේතුකාරක වන්නේය.

අප බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ ගිරිමානන්ද සූත්‍රයේ අවසාන සංඥාව ආනාපාන සති අරමුණයි. ආශ්වාස ප්‍රශ්වාස 34 ආකාරයකට අරමුණු කිරීමෙන් ඒ පිළිබඳව ඉතා සියුම්ව සිහිබුද්ධියෙන් ආවර්ජනය කිරීම කායික, මානසික, වේදනා සමනය කිරීමට හේතු වෙයි.

සත්වයකු මව්කුසට පිවිසි අවස්ථාවේ පටන් නිතැතින්ම සිදුවන්නේ ආශ්වාස ප්‍රශ්වාස කිරීමයි. සෙසු අවශ්‍යතා ක්‍රියාවක ප්‍රතික්‍රියාවක් වශයෙන් ඇඬීමෙන් හා වෙනත් ක්‍රියාවක ප්‍රතිඵලය වශයෙන් බාහිර වශයෙන් ලබාගන්නා දේවල් නිසා භාවනා වශයෙන් සඤ්ඤාවට ආරෝපණය කිරීමට නොහැකිය.

චිත්ත, චෛතසික හා ශරීරය එක්වන්ව සිහිබුද්ධියෙන් ක්‍රියා කර අරමුණට සිත ආරෝපණය කරගන්නා විට විදර්ශනා ඥානය ලබන්නට වාසනාභාගී වන්නේය.

අනවරාග්‍ර සසර සැරිසරන සත්වයා පංචේන්ද්‍රිය මගින් හඳුනා ගන්නා අරමුණු අනුව කෙලෙස් සම්පූර්ණයෙන් විනාශ කිරීමෙන් අනන්ත දුක් වේදනා ඇති කරන සසරින් මිදී උතුම් නිවනින් සැනසීමට වාසනා වන්නේය.

ගිරිමානන්ද සූත්‍රය නිතර භාවිත කිරීමෙන් දෛනික ජීවිතයට ලැබෙන ප්‍රයෝජන.

1. නිරෝගී භාවය
2. සිහි කල්පනාව තහවුරු වීම
3. තමාට තමා විශ්වාස කරගැනීම
4. මානසික සහනය ලබාගැනීම
5. පාලි භාෂාව පිළිබඳ දැනුම වර්ධනය කරගැනීම.




ගිරිමානන්ද සූත්‍රයේ දක්වෙන දස සඤ්ඤාව එකිනෙක වෙන් කොට ගත් විට ජීවිතය පිළිබඳ යථාර්ථය දක්නා කැඩපත් දසයක් වැන්න. සත්වයකු උපතේ පටන් සොයන සැපත පරිසරය හා ගැටීමෙන් ලබන රසයක් බව සිහි බුද්ධියෙන් සිතන විට අවබෝධ වන්නේය. පරිසරයට අවශ්‍ය පරිදි පුද්ගලයා සකස් වන විට යථාර්ථය පසෙක තබා සමාජ බලයට යටත් වන්නට සිදුවෙනවා පමණක් නොව තණ්හා මාන දිට්ඨි ආදී උපාදානයන් නිසා සතර අපායාදියෙහි ඉපිද අනේකවිධ දුක් වේදනා විඳින්නට සිදු වන්නේය.

අප බුදුරජාණන් වහන්සේගේ සෑම දේශනාවක්ම අවසන් වන්නේ චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධයට මාර්ගය පෙන්වමිනි. ගිරිමානන්ද සූත්‍රයේ දස සඤ්ඤා ක්‍රම ක්‍රමයෙන් ශරීර සටහනේ පටන් ශරීරාභ්‍යන්තරයද යළි චිත්ත සන්තානයද විශ්ලේෂණය කොට එයින් වන වේදනාව අභිසංඛාරයක් ලෙසද එම සඤ්ඤාව විරාග නිරෝධ සඤ්ඤාවට පරිවර්තනය කොට චේතෝ විමුක්තිය ලබාගන්නා අයුරු පැහැදිලි කෙරෙන්නේය.

සිත, කය සංසිඳීමෙන් මනසට ඇතිවන නිදහස, ශාන්තිය, නිරාමිස ප්‍රීතිය අපමණය. මෙම ගිරිමානන්ද සූත්‍රයෙන් ලබන උපරිම ශාන්තිය ලබාගැනීමට ඔබ සැමට හේතු වාසනා වේවා.

**පූජ්‍ය අමුණුපුර පියරතන හිමි**





# කේ. මීගහකුඹුර විසින් රචිත 'ශ්‍රී දළදා මාලිගාව සහ උභය මහා විහාර චාරිත්‍ර විධි' කෘතිය දොරට වඩී

'ශ්‍රී දළදා මාලිගාව ප්‍රධාන අස්ගිරි මල්වතු උභය මහා විහාරයන්හී ශාසනික ඉතිහාසය හා පෞරාණික චාරිත්‍ර සම්ප්‍රදායන් බෞද්ධයන් සම්බන්ධව ශාස්ත්‍රීය තොරතුරු ඇතුළත් කොට දීර්ඝ කාලයක විමර්ශනයකින් පසු ලියන ලද ''ශ්‍රී දළදා මාලිගාව සහ උභය මහා විහාර චාරිත්‍ර විධි' නමැති කෘතිය තුළින් සමස්ත ලෝ වැසියන්ට ශ්‍රී දළදා මාලිගාව සහ මල්වතු අස්ගිරි උභය මහා විහාර සම්බන්ධ වැදගත් වූත්, ශාස්ත්‍රීය වූත් තොරතුරු රැසක් දැනගැනීමට අවස්ථාව උදාවී ඇතැයි අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහානායක අති පූජනීය වරකාගොඩ ඥානරතන ශ්‍රී දළදා සමිඳු තේවාව භාර මහානායක හිමිපාණෝ පැවැසූහ. උන්වහන්සේ මේ බව පැවැසුවේ කේ. මීගහකුඹුර විසින් රචිත ''ශ්‍රී දළදා මාලිගාව සහ උභය මහා විහාර චාරිත්‍ර විධි'' නමැති ග්‍රන්ථය දොරට වැඩීම නිමිත්තෙන් ශ්‍රී දළදා මාලිගාවේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලද උත්කර්ෂවත් උත්සවයේදීය.

ග්‍රන්ථයේ කර්තෘවරයා වන ශ්‍රී දළදා මාලිගාවේ දේශීය බෞද්ධ කටයුතු කාර්ය අංශයේ ලේකම්, කේ. මීගහකුඹුර මහතා විසින් මෙහිදී ග්‍රන්ථයේ පිටපතක් අස්ගිරි මාහා නාහිමිපාණන් වහන්සේ ප්‍රධාන අස්ගිරි, මල්වතු අනුනායක හිමිවරු ප්‍රධාන මහා සංඝ රත්නය සහ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දැල මහතා ප්‍රධාන අමුත්තන්ට පිළිගැන්වීම සිදුකරනු ලැබීය.

අස්ගිරි මහනාහිමියෝ මෙසේද සඳහන් කළහ.

''දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී දළදා මාලිගාව ප්‍රධාන අස්ගිරි මල්වතු උභය මහා විහාරයන්, මහා සංඝරත්නය ඇසුරු කරමින් මහා විහාර සම්බන්ධව අඛණ්ඩව පවත්වාගෙන එනු ලබන සම්ප්‍රදායන් චාරිත්‍ර සම්බන්ධව විමර්ශනය කරමින් ඉතා සාරවත් ග්‍රන්ථයක් මීගහකුඹුර මහතා සංස්කරණය කර තිබෙනවා. මෙතෙක් පැවැති අඩුපාඩුවක් තමයි එතුමා විසින් සමස්ත ලෝ වැසියන් වෙතම තිළිණ කර තිබෙන්නේ.''

**මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක දිඹුල්කුඹුරේ විමලධම්ම නාහිමි:**

''ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ රැසක් සංස්කරණය කළ මීගහකුඹුර මහතා ශාසන ඉතිහාසයේ දීර්ඝ ශාසනික වූත්, ආගමික වූත්, සංස්කෘතික වූත් සම්බන්ධකම් ඇති මහා විහාර පරම්පරාවේ මල්වතු අස්ගිරි උභය මහා විහාර, ශ්‍රී දළදා මාලිගාව කේන්ද්‍රස්ථාන කරගෙන සංස්කරණය කළ ''ශ්‍රී දළදා මාලිගාව සහ උභය මහා විහාර චාරිත්‍ර විධි'' ග්‍රන්ථය සෑම අංශයකින්ම උසස් තත්ත්වයක් ගන්නා බෞද්ධ ශාස්ත්‍රීය ග්‍රන්ථයක් බව බය නැතිව ප්‍රකාශ කළ හැකියි.''

**අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අනුනායක පොළොන්නරුව සොළොස්මස්ථානාධිපති, අස්ගිරිය ගෙඩිගේ රජමහ විහාරාධිවාසී ශාස්ත්‍රපති වේඩරුවේ උපාලි නාහිමි:**

''ශාසනික සේවාවක් ඉටු කරන කොරියාව වැනි රටවල ගිහි පැවිදි වියතුන්ට ගෞරව සම්මාන පිරිනමන යුගයක බෞද්ධ ග්‍රන්ථ රැසක් සංස්කරණය කරමින් කාලීන බොදු ශාස්ත්‍රීය තොරතුරු සමාජයට ඉදිරිපත් කරන මීගහකුඹුර මහතාටත් එවැනි ගෞරව සම්මානයක් උභය මහා විහාර මගින් ප්‍රදානයට සුදුසු බවයි මම ප්‍රකාශ කරන්නේ.''

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාසය අධ්‍යයන අංශයේ මහාචාර්ය හගුරන්කෙත ධීරානන්ද හිමි:**

''ශ්‍රී දළදා මාලිගාව, මල්වතු අස්ගිරි උභය මහා විහාර මහානායක මාහිමිවරුන් පත්කරනු ලබන සම්ප්‍රදායන්, උපසම්පදා විනය කර්මය, දියවඩන නිලමේ ප්‍රධාන ශ්‍රී දළදා මාලිගාවේ සම්ප්‍රදායන්, සිරිත් විරිත්, කාර්ය භාරයන් ඇතුළු ශාස්ත්‍රීය තොරතුරු රැසක් ඇතුළත්ව සංස්කරණය කළ මෙම ග්‍රන්ථය පාඨකයා බලාපොරොත්තු වූ සෑම අංශයකින්ම සාර්ථක වී තිබෙනවා.''

**ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දැල මහතා:**


''ශ්‍රී දළදා මාලිගාව ප්‍රධාන මල්වතු අස්ගිරි මහා විහාර සම්බන්ධව විද්වත් දැනුමක් ඇති මීගහකුඹුර මහතා මෙවැනි ශාස්ත්‍රීය වටිනාකමක් දරන පොත් රැසක් මෙයට ඉහතදීත් ලියා පළ කළා. එම සෑම ග්‍රන්ථයක්ම කාගේත් ඇගයීමට පත් වුණා. මෙම ග්‍රන්ථයද ශ්‍රී දළදා මාලිගාව මල්වතු අස්ගිරි මහා විහාර තොරතුරු විමර්ශනය කරන අයට මහත් දැනුමක් ලබාදෙනු ඇති.''

අස්ගිරි පාර්ශ්වයේ අනුනායක, ශාස්ත්‍රපති ආණමඩුවේ ධම්මදස්සි හිමියෝද, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ ආචාර්ය එච්. එම්. ඩී. ආර්. හේරත් මහතාද මෙහිදී උත්සව සභාව අමතා කතා කළහ.

මෙම අවස්ථාවට මහනුවර ශ්‍රී චන්ද්‍රානන්ද බෞද්ධ විද්‍යාලයාධිපති අස්ගිරිය මහා විහාර කාරක සභික ආචාර්ය ගොඩගම මංගල, මල්වතු මහා විහාර ජ්‍යෙෂ්ඨ කාරක සභික අග්ගමහා පණ්ඩිත මහෝපාධ්‍ය අලුත්ගම ධම්මානන්ද යන නාහිමිවරු ඇතුළු මල්වතු අස්ගිරි මහා විහාරයන්හි සංඝයා වහන්සේලා රැසක්ද, මධ්‍යම පළාත් ආණ්ඩුකාර නිලූකා ඒකනායක, මධ්‍යම පළාත් ප්‍රධාන ඇමැති සරත් ඒකනායක යන මහත්ම මහත්මියන්ද, සතර දේවාල බස්නායක නිලමේවරුන් ඇතුළු සම්භාවනීය ගිහි-පැවිදි පිරිසක් සහභාගි වූහ.

**කේ. බණ්ඩාරනායක**

''ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි.''



# අනුරපුර බැතිමතුන්ට හමු නොවන සමාධි පිළිම වහන්සේ

අනුරපුර පුද බිම පිළිබඳව සඳහන් කිරීමේදී 'සමාධි පිළිමය' කිසිවකුටත් අමතක කළ නොහැකි නමුදු අනුරාධපුර සමාධි බුද්ධ ප්‍රතිමාව පිළිබඳව රටපුරා පැතිර ගත් වැරදි මතයක් තිබේ. එනම් එය අනුරාධපුර මහමෙවුනා උයනේ පිහිටා ඇති බවකි. එහෙත් සත්‍ය ලෙසම අනුරාධපුර සමාධි පිළිමය හා මහමෙවුනා උයන අතර කිසිම සම්බන්ධයක් නැත. එය සැබැවින්ම පිහිටා ඇත්තේ ඉන් ඉදුරාම බැහැර පිහිටි අභයගිරි ආරාම සංකීර්ණයට අයත් භූමි භාගයකය. එමෙන්ම අනුරාධපුර පූජා නගරය තුළ අද දක්නට ඇති සමාධි පිළිම වහන්සේට අමතරව නිර්මාණාත්මක ලක්ෂණ අතින් ඊට කෙසේවත් නොදෙවෙනි තවත් සමාධි පිළිම වහන්සේ නමක් විසිවන සියවසේ මුල් අර්ධය තෙක්ම අනුරාධපුරයේ වැඩ සිට ඇත. එහෙත් ඉන්පසු කුමක් හෝ හේතුවක් මත එම ප්‍රතිමා වහන්සේ එතැනින් ඉවත් කොට තිබේ. අද එම සමාධි ප්‍රතිමාව කොළඹ ජාතික කෞතුකාගාරයේ පිවිසුම් ද්වාරය අබියසය. ඒ හුදෙක් කෞතුක වස්තුවක් ලෙසිනි. එසේ විතැන් කිරීමෙන් එම ප්‍රතිමා වහන්සේට සේම සියවස් ගණනාවක් තිස්සේ එය ස්ථාපිතව තිබූ තොළුවිල පුරාවිද්‍යා රක්ෂිතයටද සුවිසල් අගතියක් සිදුවී ඇතැයි යමෙකු කිවහොත් එයද මුළුමනින්ම බැහැර කළ හැකි මතයක් නොවේ. එමෙන්ම ඇතැම් කලා විචාරකයන් පවසන අන්දමට මෙම සමාධි ප්‍රතිමාව අභයගිරි සමාධි ප්‍රතිමාවටත් වඩා ආධ්‍යාත්මික ලක්ෂණවලින් පිරිපුන්ය. මෙම මතය දරන්නවුන් අතර හිටපු ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ සහ කැලණිය විශ්වවිද්‍යාලයීය පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ හිටපු අධ්‍යක්ෂ සිරිනිමල් ලක්දුසිංහයන් ඇතුළු තවත් විද්වත් පිරිසක්ද වෙති.

අනුරපුර ජය ශ්‍රී මහා බෝධි වන්දනාවෙන් අනතුරුව මිහින්තලා පුද බිම වෙත යන ඔබට එම යන මාර්ගය අතරතුර ප්‍රධාන මාර්ගය ආසන්නයේම දකුණු දෙසින් මෙම අතීතයේ සමාධි ප්‍රතිමාව තිබූ තොළුවිල පුරාවිද්‍යා ස්ථානය දක ගත හැක. ඒ බැලූ බැල්මට කිසිදු වැදගත්කමක් නොමැති බිම්කඩක් ලෙසිනි.

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුරාධපුරය, ත්‍රිකුණාමලය ප්‍රධාන මාර්ගයේ අනුරාධපුර නගරයේ සිට කි.මී. 1/4 ක් පමණ ගමන් කළ පසු ප්‍රධාන මාර්ගයට දකුණු පසින් මෙම ස්ථානය පිහිටා ඇත. මෙම ස්ථානය රාම කැලේ මාලිගය නමින්ද හඳුන්වනු ලැබේ. එහෙත් මෙය ක්‍රිස්තු වර්ෂ 5 වන සියවසට පමණ අයත් බෞද්ධ විහාර සංකීර්ණයක් බව පුරාවිද්‍යාත්මකව හඳුනාගෙන ඇත.

බැලූ බැල්මට වර්තමානයේ හිස් බිම් කඩක් ලෙස දිස් වුවද අතීත ප්‍රෞඪ උරුමය මොනවට කියාපාන මෙය මධ්‍ය අනුරාධපුර යුගයට අයත් දියුණු පබ්බත විහාර සංකීර්ණයකි. ඉතා වේගයෙන් දියුණු වන අනුරාධපුර නගරයේ මෙබඳු පුරාවිදු උරුමයන් හැකිලීමට ලක්ව තිබීම ජාතික ඛේදවාචකයකි. මේ වන විට මෙම රක්ෂිතය අක්කර 35 කට පමණ සීමාවී ඇත. පූර්ණ වශයෙන් කැණීම් කටයුතු හෝ ගවේෂණ කටයුතු සිදුකර නොමැති හෙයින් ස්ථානයේ පුරාවිද්‍යාත්මක තොරතුරු අනාවරණය වී ඇත්තේ සුළු වශයෙනි. මෙම ස්ථානය ගැන සාහිත්‍යමය මූලාශ්‍ර මගින් තොරතුරු

සපයා ගැනීම උගහටය. නමුදු පුරාවිද්‍යාත්මක ගවේෂණ මගින් එම අඩුව මනාව සපුරා ගත හැක.

මෙම පබ්බත විහාර ආරම්භය හා විකාශය පිළිබඳ යම් යම් තොරතුරු සාහිත්‍ය මූලාශ්‍රවලින් අධ්‍යයනය කළ හැකිය.

බුද්ධ කාලයේ භික්ෂු සංස්ථාව ආරම්භ වූ අවධියේ භික්ෂූන් වහන්සේලාට ස්ථිර වාසස්ථාන තිබූ බවට සාධක නැත. චුල්ලවග්ගපාලියට අනුව උන්වහන්සේලා ගස් මුල්වල, පිදුරු ගොඩවල්වල, ගුහා, සොහොන් ආදියේ රාත්‍රිය ගත කොට ඒ හේතුවෙන් විවිධ දුෂ්කරතා රැසකට මුහුණ පා ඇත.


ඉන්පසුව බුදුන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලාට ආකාර සතරක ආරාම සකසා ගැනීමට අනුදැන වදාළහ. ඒ කාමභෝගීත්වය පිටු දකින විරාගිත පරිසරයන් තුළ සරල ලෙස නිම වුණු ඒවා වශයෙනි.

ඒ අනුව භික්ෂූන් වහන්සේලාට පූජා කිරීම සඳහා එබඳු විවිධ ආරාම ඉදිකිරීම ආරම්භ විය. මහින්දගමනයෙන් අනතුරුව ලාංකීය බුදු සසුන ආරම්භ වීමත් සමගම ලංකාව තුළද විහාර කර්මාන්තය ආරම්භ වූයේ මහා විහාරය ඉදිකොට මිහිඳු හිමියන්ට පූජා කිරීමත් සමගමය. එසේ වුවද වැඩි වශයෙන් මෙම යුගයේ භික්ෂූන් වහන්සේලා කටාරම් කෙටූ ගල් ලෙන් ආශ්‍රිතව වැඩ සිටි බවට පුරාවිද්‍යා සාධක එමටය. අනතුරුව භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිවත්ම අභයගිරිය, ජේතවනය වැනි විශාල විහාරාරාම නගරය තුළ පවා ඉදිවන්නට විය. මෙවැනි විශාල ආරාම ඇතුළු නුවර සංවර්ධනය වන විට වනවාසී ආරාම සංකීර්ණයක් නගරයෙන් පිටත සීමාව තුළ ක්‍රමයෙන් වර්ධනය වී ඇත. මෙම තොළුවිල බඳු පබ්බත විහාරවල වර්ධනය හා විකාශනයද අපට මේ අවධියේදී සිදුවූ බව හඳුනාගත හැකිය.

මෙම ලිපියෙන් පැවැසෙන තොළුවිල ආරාම සංකීර්ණයටද මෙම ආරම්භක වාස්තු විද්‍යා ලක්ෂණ පොදුය. නමුදු මෙම පබ්බත විහාරයටම ආවේණික වූ සුවිශේෂී ලක්ෂණ කිහිපයක්ද හඳුනා ගත හැකිවීම මෙම ස්ථානයේ පුරාවිද්‍යාත්මක සුවිශේෂත්වය විදහා පාන්නකි. තොළුවිල ආරාම සංකීර්ණයේ මාලක දෙකකින් යුක්ත විශාල ප්‍රතිමාඝරයක් දකුණු දිශානුගතව පිහිටා ඇත. කොළඹ ජාතික කෞතුකාගාරය ඉදිරිපස තැන්පත් කොට ඇති සුප්‍රකට තොළුවිල සමාධි පිළිමය තැන්පත් කොට තිබුණේ මෙම ප්‍රතිමා භාගයේය.

යටත් විජිත පාලකයන්ගේ තීන්දු තීරණ හමුවේ මුල් පිහිටි ස්ථානය අහිමි වූ මෙම සමාධි පිළිමයට හිමිවිය යුතු නිසි ගෞරවය අද වන විට අහිමි වී ඇතැයි සිතේ. අඩි 5 අඟල් 9 ක් උස් වූ මෙම පිළිමයෙහි බාහු ශීර්ෂ අතර පරතරය අඩි 5 අඟල් 5 කි. වීරාසනයෙන් සහ ධ්‍යාන මුද්‍රාවෙන් යුතු ප්‍රතිමාවෙන් මූර්තිමත් වන ශාන්ත ස්වභාවය මුහුණෙහි සහ අඟපසඟවල දක්නට ලැබේ. මෙම ප්‍රතිමාව සම්බන්ධයෙන් සුවිශේෂී අගැයුමක් කරන මේ රටේ පළමු පුරාවිද්‍යා කොමසාරිස් එච්. සී. පී. බෙල් සූරීන් පවසා ඇත්තේ අප රටින් ලැබුණු විශිෂ්ටතම සහ අලාභහානි කිසිවක් සිදු නොවූ පිළිමයද මෙයම බවය.

මෙම පබ්බත විහාරයේ තිබූ සමාධි ප්‍රතිමාව ඉවත් කිරීමෙන් පසුව පාළු හුදකලා ස්වරූපයක් ගත් මෙම මාහැඟි පුරාවිද්‍යා රක්ෂිතයට පසුගිය එල්ටීටීඊ ත්‍රස්තවාදී සමයේ තවත් ඇබැද්දියකට මුහුණ දීමට සිදුවිය. එනම් අනුරාධපුර,



ත්‍රිකුණාමලය මාර්ගයේ මෙම පරිශ්‍රය සමීපයේම තිබූ එවකට ත්‍රස්තවාදීන්ගේ ප්‍රධාන ඉලක්කයක්ව පැවැති ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන ගබඩා සංකීර්ණය රැකගැනීම සඳහා එම ප්‍රධාන මාර්ගය මෙම පරිශ්‍රය හරහා යෙදීමට රජයට සිදුවීමය. එහෙත් අද වන විට පැරණි මාර්ගය විවෘත කොට ඇතත් එමගින් භෞතික වශයෙන් මෙම පරිශ්‍රයට සිදුවූ හානිය සුළුපටු කොට තැකිය නොහැකිය.

එහෙත් වන්දනාවේ පැමිණෙන බැතිමතුන් හට නිරායාසයෙන්ම දැකගත හැකි මෙම වටිනා පුරාවිද්‍යා ස්ථානය මේ වන විට 'පුරාවිද්‍යාත්මක පාරිසරික හරිත උද්‍යානයක්' වශයෙන් ස්ථාපිත කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කෙරෙමින් පවතී. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් 2014 වසර සඳහා වෙන්කර අවසන්ය. එයට සමගාමීව සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ අනූ හතර වන සංවත්සරය නිමිත්තෙන් එම සම්මේලනය මගින් ආරම්භ කරන ලද පරිසර හිතකාමී ආරක්ෂක ආවරණද සහිත රුක් රෝපණ ව්‍යාපෘතියක්ද මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. එය මෙම පුරාවිද්‍යා රක්ෂිතයේම මතු ආරක්ෂාවට සේම පාරිසරික යහපැවැත්මටද බෙහෙවින් ඉවහල් වනු ඇත.

වර්තමානය වන විට අනවසර මාර්ග භාවිත කිරීම, අනවසරයෙන් රථවාහන ගාල් කිරීම ආදී විවිධ ගැටලුකාරී තත්ත්වයන්වලට ගොදුරුව ඇති මෙම පුරාවිද්‍ය භූමිය දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණය නොමඳව හිමිවන හා ප්‍රදේශයේ ජෛවමය සහ පාරිසරික අගය වර්ධනය කෙරෙන ආකර්ෂණීය ස්ථානයක් බවට පත්කිරීම ඉතා වැදගත් මෙහෙවරකි. අද දින අභයගිරි සමාධි පිළිමය හේතුවෙන් එම ස්ථානයට යම් ශ්‍රේෂ්ඨත්වයක්, යම් බුහුමනක් හිමිව තිබේද ඒ හා සමානවම ශ්‍රේෂ්ඨත්වයක් හා බුහුමනක් හිමිවිය යුතු වූ මෙම පුරාවිද්‍යා ස්ථානය අද බොහෝ දෙනකුගේ අවධානයෙන් බැහැරව තිබේ. ඒ අග්‍රගණ්‍ය සමාධි පිළිමය අස්ථානගත වීමත් සමගමය. අද දින ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශන පුරාවස්තුවක් පමණක් බවට පත්ව ඇති මෙම අග්‍රගණ්‍ය සමාධි පිළිම වහන්සේ මෙම පින්බිමෙහි වැඩ සිටියා නම් මෙයද අනුරාධපුරයේ ප්‍රධාන පූජනීය ස්ථානයක් වනු ඒකාන්තය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුරාධපුර කලාප අංක 4 භාර
පුරාවිද්‍යා නිලධාරිනී **නිරූපා ප්‍රියදර්ශනී**